# අ.පො.ස (උ.පෙළ) විභාගය - 2015

# ඇගයීම් වාර්තාව

# 21 - ආර්ථික විද්‍යාව

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2015

## ඇගයීම් වාර්තාව

# 21 - ආර්ථික විද්‍යාව

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

**ආර්ථික විද්‍යාව**

ඇගයීම් වාර්තාව - අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2015

මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB) මගිනි.

# හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්වවිද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන්ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පො.ස.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන්ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2015 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 210340 ක් පාසල් අයදුම්කරුවෝ ද 44851 ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද ඇඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පො.ස.(උ.පෙළ) ආර්ථික විද්‍යාව විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද ආර්ථික විද්‍යාව විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පො.ස.(උ.පෙළ) 2015 විභාගයේ ආර්ථික විද්‍යාව විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

**ඉදිරියේ** දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා කාර්ය මණ්ඩලයටත් ඒ සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB)ටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2016 ජුනි 29
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය** | : | හසන්තා කුරුප්පු<br>සහකාර විභාග කොමසාරිස් |
| **සංස්කරණය** | : | ආචාර්ය වසන්ත අතුකෝරල<br>ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයන අංශය<br>පේරාදෙණිය විශ්ව විද්‍යාලය<br><br>ගාමිණී වීරසිංහ<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| සැකසුම් කමිටුව | : | ඩබ්ලිව්. ලයනල් වීරසිංහ<br>ගුරු සේවය<br>කො/විශාඛා විද්‍යාලය<br><br>ඩී.ජී. සුගත්<br>ගුරු සේවය<br>මාර/ශාන්ත තෝමස් උසස් බාලිකා විද්‍යාලය<br><br>එම්. ජී. තමරා ටී. කාරියවසම්<br>ගුරු සේවය<br>ගා/සංඝමිත්තා බාලිකා විද්‍යාලය<br><br>ඩබ්.ඒ.ඩී. පියසිරි<br>ගුරු සේවය<br>කො/ආනන්ද විද්‍යාලය<br><br>එස්. එන්. බී. එම්. එස්. රංජනී<br>ගුරු සේවය<br>කළු/මිරිස්වත්ත ජාතික පාසල<br><br>කේ.එන්. නිශාන්ත<br>ගුරු සේවය<br>ර/ඇඹි/ජනාධිපති විද්‍යාලය |
| පරිගණක පිටපත සැකසුම | : | ඕ.එම්. දර්ශනී සෙව්වන්දි<br>දත්ත සටහන් ක්‍රියාකරු |
| පිටකවරය සැකසුම | : | වයි.එස්. අනුරාධි<br>සංවර්ධන නිලධාරි |

# ඇතුළත පිටු

පිටු අංකය


## I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.2.1. විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3. පළමුවන වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 5
1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 6
1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 6
1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 7

## II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 9
2.1.2. I ප්‍රශ්න පත්‍රය 10
2.1.3. I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 17
2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ 18
2.1.5. I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස 19
2.1.6. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 20

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 21
2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 22
2.2.3. II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 64

## III කොටස

3. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා
3.1. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 65
3.2. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 68

## I කොටස

# 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

## 1.1. විෂය අභිමතාර්ථ

- ★ සමාජයක මූලික ආර්ථික ප්‍රශ්න විද්‍යාත්මක ව විශ්ලේෂණය කිරීම හා එම මූලික ආර්ථික ප්‍රශ්න නිරාකරණය කිරීම පිණිස යොදා ගත හැකි විකල්ප ක්‍රම පිළිබඳ ව විචාරාත්මක අවබෝධයක් ලබාදීම
- ★ ආර්ථික සංකල්ප හා න්‍යාය යොදා ගනිමින් ප්‍රායෝගික ආර්ථික ප්‍රශ්න හා උපනති විශ්ලේෂණය සඳහා අවශ්‍ය කුසලතා ලබාදීම
- ★ සාර්ව ආර්ථික විචල්‍යවල හැසිරීම හා එම විචල්‍ය අතර පවතින අන්තර් සම්බන්ධතා තේරුම් ගැනීමට සැලැස්වීම
- ★ වෙළෙඳපොළක ආයතන හා පුද්ගලයන් තාර්කික ව හැසිරෙන ආකාරය විමර්ශනය කිරීමට පෙලඹවීම
- ★ ආර්ථික විද්‍යානුකූල ව සිතීම සඳහා අවශ්‍ය වන තාර්කික චින්තනය ඇති කිරීම
- ★ විවිධ ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ ව පිළිගත් අර්ථකථන අධ්‍යයනයට අවස්ථා ලබාදීම
- ★ වෙළෙඳපොළ ක්‍රමයක් ඔස්සේ සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීම සඳහා රජය මැදිහත් වන ආකාරය පිළිබඳ ව විමසා බැලීමට යොමු කිරීම
- ★ පවතින ආර්ථික ප්‍රතිපත්ති විචාරශීලී ව විග්‍රහ කිරීමේ හැකියාව ලබාදීම
- ★ ආර්ථික සංවර්ධනයේ විවිධත්ව තුලනාත්මක ව විමසීමට අවශ්‍ය කුසලතා ලබාදීම
- ★ ආර්ථික විද්‍යා විෂයය විශ්ලේෂණාත්මක ව පැහැදිලි කිරීම සඳහා අවශ්‍ය මූලික නිපුණතා ලබාදීම
- ★ අන්තර්ජාතික වෙළෙඳාමේ, මූල්‍යයේ වැදගත්කම හා ගෝලීයකරණය අතර ඇති සම්බන්ධතාව පෙන්වා දීම
- ★ ශ්‍රී ලංකා ආර්ථිකයේ කාර්ය සාධනය පිළිබඳ ව විචාරාත්මක ව දැකීමට හැකි කුසලතා වර්ධනය කිරීම
- ★ සමාජයේ යහපැවැත්මට කටයුතු කිරීම සඳහා අවශ්‍ය පදනමක් ලබාදීම
- ★ උසස් අධ්‍යාපනයට යොමු වීම සඳහා යෝග්‍ය පදනමක් ලබාදීම

## 1.2. විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.2.1. විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 53481 | 6573 | 60054 |
| දෙමළ | 9053 | 1428 | 10481 |
| ඉංග්‍රීසි | 1928 | 805 | 2733 |
| එකතුව | 64462 | 8806 | 73268 |

වගුව 1

### 1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 8386 | 13.01 | 658 | 7.47 | 9044 | 12.34 |
| B | 8824 | 13.69 | 776 | 8.81 | 9600 | 13.10 |
| C | 15385 | 23.87 | 1571 | 17.84 | 16956 | 23.14 |
| S | 18232 | 28.28 | 2514 | 28.55 | 20746 | 28.32 |
| F | 13635 | 21.15 | 3287 | 37.33 | 16922 | 23.10 |
| එකතුව | **64462** | **100.00** | **8806** | **100.00** | **73268** | **100.00** |

වගුව 2

## 1.2.3. පළමුවන වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 9585 | 1672 | 17.44 | 1314 | 13.71 | 2265 | 23.63 | 2543 | 26.53 | 7794 | 81.31 | 1791 | 18.69 |
| 2. ගම්පහ | 5537 | 818 | 14.77 | 667 | 12.05 | 1144 | 20.66 | 1593 | 28.77 | 4222 | 76.25 | 1315 | 23.75 |
| 3. කළුතර | 2745 | 372 | 13.55 | 393 | 14.32 | 628 | 22.88 | 738 | 26.89 | 2131 | 77.63 | 614 | 22.37 |
| 4. මහනුවර | 3543 | 380 | 10.73 | 428 | 12.08 | 835 | 23.57 | 1028 | 29.01 | 2671 | 75.39 | 872 | 24.61 |
| 5. මාතලේ | 874 | 68 | 7.78 | 89 | 10.18 | 221 | 25.29 | 264 | 30.21 | 642 | 73.46 | 232 | 26.54 |
| 6. නුවරඑළිය | 1206 | 136 | 11.28 | 184 | 15.26 | 292 | 24.21 | 302 | 25.04 | 914 | 75.79 | 292 | 24.21 |
| 7. ගාල්ල | 2754 | 337 | 12.24 | 315 | 11.44 | 576 | 20.92 | 811 | 29.45 | 2039 | 74.04 | 715 | 25.96 |
| 8. මාතර | 1688 | 182 | 10.78 | 207 | 12.26 | 342 | 20.26 | 497 | 29.44 | 1228 | 72.75 | 460 | 27.25 |
| 9. හම්බන්තොට | 1134 | 107 | 9.44 | 126 | 11.11 | 231 | 20.37 | 328 | 28.92 | 792 | 69.84 | 342 | 30.16 |
| 10. යාපනය | 1120 | 121 | 10.80 | 134 | 11.96 | 300 | 26.79 | 322 | 28.75 | 877 | 78.30 | 243 | 21.70 |
| 11. කිලිනොච්චි | 202 | 14 | 6.93 | 30 | 14.85 | 52 | 25.74 | 46 | 22.77 | 142 | 70.30 | 60 | 29.70 |
| 12. මන්නාරම | 203 | 18 | 8.87 | 28 | 13.79 | 59 | 29.06 | 59 | 29.06 | 164 | 80.79 | 39 | 19.21 |
| 13. වව්නියාව | 310 | 45 | 14.52 | 44 | 14.19 | 88 | 28.39 | 94 | 30.32 | 271 | 87.42 | 39 | 12.58 |
| 14. මුලතිව් | 135 | 11 | 8.15 | 13 | 9.63 | 39 | 28.89 | 42 | 31.11 | 105 | 77.78 | 30 | 22.22 |
| 15. මඩකලපුව | 805 | 54 | 6.71 | 84 | 10.43 | 240 | 29.81 | 277 | 34.41 | 655 | 81.37 | 150 | 18.63 |
| 16. අම්පාර | 1068 | 79 | 7.40 | 131 | 12.27 | 273 | 25.56 | 328 | 30.71 | 811 | 75.94 | 257 | 24.06 |
| 17. ත්‍රිකුණාමලය | 670 | 51 | 7.61 | 75 | 11.19 | 157 | 23.43 | 196 | 29.25 | 479 | 71.49 | 191 | 28.51 |
| 18. කුරුණෑගල | 3194 | 355 | 11.11 | 400 | 12.52 | 684 | 21.42 | 910 | 28.49 | 2349 | 73.54 | 845 | 26.46 |
| 19. පුත්තලම | 1515 | 151 | 9.97 | 207 | 13.66 | 383 | 25.28 | 445 | 29.37 | 1186 | 78.28 | 329 | 21.72 |
| 20. අනුරාධපුරය | 1407 | 188 | 13.36 | 156 | 11.09 | 287 | 20.40 | 441 | 31.34 | 1072 | 76.19 | 335 | 23.81 |
| 21. පොළොන්නරුව | 661 | 44 | 6.66 | 68 | 10.29 | 154 | 23.30 | 208 | 31.47 | 474 | 71.71 | 187 | 28.29 |
| 22. බදුල්ල | 1684 | 126 | 7.48 | 168 | 9.98 | 366 | 21.73 | 524 | 31.12 | 1184 | 70.31 | 500 | 29.69 |
| 23. මොණරාගල | 717 | 70 | 9.76 | 86 | 11.99 | 157 | 21.90 | 217 | 30.26 | 530 | 73.92 | 187 | 26.08 |
| 24. රත්නපුරය | 2097 | 282 | 13.45 | 271 | 12.92 | 472 | 22.51 | 577 | 27.52 | 1602 | 76.39 | 495 | 23.61 |
| 25. කෑගල්ල | 1519 | 132 | 8.69 | 196 | 12.90 | 353 | 23.24 | 466 | 30.68 | 1147 | 75.51 | 372 | 24.49 |
| **සමස්ත දිවයින** | **46373** | **5813** | **12.54** | **5814** | **12.54** | **10598** | **22.85** | **13256** | **28.59** | **35481** | **76.51** | **10892** | **23.49** |

වගුව 3

### 1.2.4. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව


| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 107 | 0.15 | 73268 | 100.00 |
| 81 - 90 | 3087 | 4.21 | 73161 | 99.85 |
| 71 - 80 | 8264 | 11.28 | 70074 | 95.64 |
| 61 - 70 | 10505 | 14.34 | 61810 | 84.36 |
| 51 - 60 | 12134 | 16.56 | 51305 | 70.02 |
| 41 - 50 | 13543 | 18.48 | 39171 | 53.46 |
| 31 - 40 | 13019 | 17.77 | 25628 | 34.98 |
| 21 - 30 | 8953 | 12.22 | 12609 | 17.21 |
| 11 - 20 | 3419 | 4.67 | 3656 | 4.99 |
| 01 - 10 | 234 | 0.32 | 237 | 0.32 |
| 00 - 00 | 3 | 0.00 | 3 | 0.00 |

වගුව 5

ඉහත වගුව අනුව මෙම විෂයය සඳහා 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් අපේක්ෂකයින් සංඛ්‍යාව 13019 ක් වන අතර, එය මුළු අපේක්ෂකයින් සංඛ්‍යාවෙන් 18% කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ගත් අපේක්ෂකයින් සංඛ්‍යාව 25628 කි. එම සංඛ්‍යාව මුළු අපේක්ෂකයින්ගෙන් 35% කි.

## 1.3. විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය


### 1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 1 (RD/16/05/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයට අනුව අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 2 වන ප්‍රශ්නයට ය. එම ප්‍රශ්නයට ඔවුන් දැක්වූ පහසුතාව 94% කි. එමෙන්ම අයදුම්කරුවන් අඩුම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 29 වන ප්‍රශ්නයට වන අතර එම ප්‍රශ්නය සඳහා පහසුතාව 9% කි.


### 1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයට අනුව ‘අ’ කොටසේ 1 වන ප්‍රශ්නය, අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනකු තෝරා ගෙන ඇත. එම ප්‍රතිශතය 97% කි. ‘ආ’ කොටසේ 10 වන ප්‍රශ්නය, අඩුම පිරිසක් තෝරා ගෙන ඇති අතර, එම ප්‍රතිශතය 18% කි.

ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

### 1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය





මෙහි 4 වන ප්‍රශ්නය සඳහා වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 20 කි. මෙම ප්‍රස්තාරයට අනුව එම ලකුණුවලින් 76%-100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 සිට 20 තෙක් ලබාගත් ප්‍රතිශතය 9%කි. එමෙන්ම වෙන්කර ඇති ලකුණු 20න් 0%-25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 0 සිට 5 තෙක් ලබා ගත් ප්‍රතිශතය 44%ක් පමණ වේ.

ප්‍රස්තාරය 3 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

## 1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය

**අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2015**
**21 - ආර්ථික විද්‍යාව - II පත්‍රය ('අ' කොටස)**
**එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වල/අනුකොටස්වල පහසුතා දර්ශක**





ප්‍රස්තාරය 4.1 (RD/16/04/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

මෙම ප්‍රස්තාරය අනුව 01 වන ප්‍රශ්නයෙහි (i) කොටසෙහි පහසුතාව 86% ක් වන අතර, 4 වන ප්‍රශ්නයෙහි iv කොටසෙහි (ඊ) අනුකොටසෙහි පහසුතාව 13% කි.

**අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2015**

**21 - ආර්ථික විද්‍යාව - II පත්‍රය ('ආ' කොටස)**

**එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වල/අනුකොටස්වල පහසුතා දර්ශක**




ප්‍රස්තාරය 4.2 (RD/16/04/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

# II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

- ⋆ කාලය පැය 02කි.
- ⋆ වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.
- ⋆ එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100කි.

## 2.1.2. I ප්‍රශ්න පත්‍රය

**1.** පහත සඳහන් ප්‍රකාශන අතුරෙන් සූක්ෂ්ම ආර්ථික විද්‍යාත්මක ප්‍රකාශනයක් වනුයේ කවරක් ද?
(1) පසුගිය වසරේ දී රබර් මිල 10% කින් පහළ වැටුණි.
(2) පසුගිය වසරේ දී විරැකියාව ශ්‍රම හමුදාවෙන් 5.8% ක් වූයේ ය.
(3) පසුගිය වසරේ දී මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 7% කින් ඉහළ ගියේ ය.
(4) පසුගිය වසරේ දී පොදු මිල මට්ටම 4% කින් වැඩි විය.
(5) පසුගිය වසරේ දී රජයේ බදු අයභාරය 8% කින් අඩු විය. (……)

**2.** ආර්ථික පද්ධතියක් තුළ තීරණ ගනු ලබන ප්‍රධාන කණ්ඩායම් තුන වනුයේ,
(1) කුටුම්බ, ව්‍යාපාරික ආයතන සහ බැංකු වේ.
(2) කුටුම්බ, ව්‍යාපාරික ආයතන සහ රජය වේ.
(3) ව්‍යාපාරික ආයතන, රජය සහ රාජ්‍ය නොවන සංවිධාන වේ.
(4) ව්‍යාපාරික ආයතන, බැංකු සහ විදේශ වෙළෙඳාමේ නිරත වූවන් වේ.
(5) කුටුම්බ, රජය සහ බැංකු වේ. (……)

**3.** කිසියම් කටයුත්තක ආවස්ථික පිරිවැය
(1) එබඳු කටයුතු කරන සියල්ලන්ට ම එක සමාන වේ.
(2) ගණනය කිරීමේ දී මූල්‍ය පිරිවැය සහ කැප කරන ලද ආදායම් යන දෙකොටස ම ඇතුළත් කරගනී.
(3) එම කටයුත්තෙහි මූල්‍ය පිරිවැය පමණක් ඇතුළත් කර ගනී.
(4) එම කටයුත්ත නිසා කැප කරන්නට සිදු වූ ආදායම් පමණක් ඇතුළත් කර ගනී.
(5) එම කටයුත්ත නිසා හටගන්නා සෘජු ප්‍රතිලාභ පමණක් මිනුම් කරයි. (……)

**4.** කිසියම් රටක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත
(1) තාක්ෂණය වෙනස් වෙමින් පවතී.
(2) අනික් භාණ්ඩයේ නිෂ්පාදනය අඩු නොකොට, කිසියම් භාණ්ඩයක් වැඩිපුර නිපදවිය හැකි ය.
(3) නිෂ්පාදන සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය නොවේ.
(4) පවත්නා සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය වේ.
(5) ආර්ථිකයේ නිෂ්පාදන අකාර්යක්ෂමතාවක් පවතී. (……)

**5.** සෑම ආර්ථික කටයුත්තක දී ම නිෂ්පාදන සම්පත් එකිනෙකට පූර්ණ ආදේශක වේ නම්, පහත සඳහන් ඳ අතුරෙන් කවරක් නිවැරදි වේ ද?
(1) සියලු ම භාණ්ඩවල නිමැවුම වැඩි කළ හැකි ය.
(2) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය සරල රේඛාවක් වනු ඇත.
(3) විශේෂ ප්‍රාගුණ්‍යනය සහ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වෙළෙඳාමක් හට ගැනීමට ඉඩක් නොපවතී.
(4) කිසිදු රටක් හෝ කිසිදු පුද්ගලයෙක් හෝ කිසිදු කටයුත්තක් සම්බන්ධයෙන් සාපේක්ෂ වාසි අත්කර ගැනීමට අසමත් වේ.
(5) නිෂ්පාදන සම්පත් හිඟය අහෝසි වී යනු ඇත. (……)

**6.** ධනවාදය පදනම් කරගත් ආර්ථිකයක පහත දැක්වෙන එක් කරුණක් හැර අන් සියල්ල දක්නට ලැබේ. එලෙස දක්නට **නොලැබෙන** කරුණ වනුයේ,
(1) ඉල්ලුම හා සැපයුම මත පදනම් වූ මිල ක්‍රමයයි.
(2) පෞද්ගලික දේපළ ක්‍රමයයි.
(3) ස්වාර්ථය මත කටයුතු කරන කුටුම්බ සහ ව්‍යවසායකයන් ය.
(4) ව්‍යවසායක නිදහසයි.
(5) මධ්‍යගත සැලසුම්කරණයයි. (……)

**7.** ආර්ථිකය තුළ ආණ්ඩුවේ සහභාගිත්වය වඩාත් ප්‍රබල ලෙස දක්නට ලැබෙන්නේ,
(1) වෙළෙඳපොළ ආර්ථිකයක ය. (2) විධානගත ආර්ථිකයක ය.
(3) මිශ්‍ර ආර්ථිකයක ය. (4) සමාජ වෙළෙඳපොළ ආර්ථිකයක (social market economy) ය.
(5) සාම්ප්‍රදායික ආර්ථිකයක ය. (……)

**8.** කිසියම් පුද්ගලයෙක් ආදායම ඉහළ යන විට කිරි පිටි සඳහා කරන ඉල්ලුම වැඩි කරයි නම්, කිරි පිටි
(1) බාල භාණ්ඩයකට උදාහරණයක් වේ. (2) ආර්ථික නොවන භාණ්ඩයකට උදාහරණයක් වේ.
(3) ගිෆන් භාණ්ඩයකට උදාහරණයක් වේ. (4) පොදු භාණ්ඩයකට උදාහරණයක් වේ.
(5) සාමාන්‍ය භාණ්ඩයකට උදාහරණයක් වේ. (……)

**9.** යම් දෙන ලද අවස්ථාවක, තරගකාරී වෙළෙඳපොළක, 'සාමාන්‍ය භාණ්ඩයක්' සඳහා ඉල්ලුම වැඩි වී සැපයුම අඩු වුවහොත්,
(1) සමතුලිත මිල පහළ වැටෙන අතර සමතුලිත ප්‍රමාණය ඉහළ නගී.
(2) සමතුලිත මිලත් ප්‍රමාණයත් දෙක ම ඉහළ නගී.
(3) සමතුලිත ප්‍රමාණය ඉහළ නගී. සමතුලිත මිල ඉහළ යාමට හෝ පහළ යාමට හෝ පිළිවන.
(4) සමතුලිත මිල පහළ බසී. සමතුලිත ප්‍රමාණය ඉහළ යාමට හෝ පහළ යාමට හෝ පිළිවන.
(5) සමතුලිත මිල ඉහළ නගී. සමතුලිත ප්‍රමාණය ඉහළ යාමට හෝ පහළ යාමට හෝ නොවෙනස්ව තිබීමට හෝ පිළිවන. (……)

**10.** බොහෝ පරිභෝජන කටයුතුවල දී සීනි සහ හකුරු එකිනෙකට ආදේශක වශයෙන් සැලැකේ. එබැවින් සීනි මිල ඉහළ ගියහොත්,

(1) හකුරු ඉල්ලුම වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ.
(2) හකුරු ඉල්ලුම අඩු වෙතැයි අපේක්ෂා කෙරේ.
(3) හකුරු ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩු වෙතැයි අපේක්ෂා කෙරේ.
(4) හකුරු මිල අඩු වෙතැයි අපේක්ෂා කෙරේ.
(5) හකුරු ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ. (……)

**11.** පොල් සඳහා මිල ඉල්ලුම් නම්‍යතාවය –1.0 ක් වේ යැයි සලකන්න. එම තත්ත්වය යටතේ පොල් ගෙඩියක මිල රු. 60ක් වන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය පොල් ගෙඩි 500ක් වේ. ඉල්ලුම් කරනු ලබන පොල් ගෙඩි ප්‍රමාණය 600ක් වනුයේ පොල් ගෙඩියක මිල කොපමණ වන විට දී ද?

(1) රුපි. 30 (2) රුපි. 40 (3) රුපි. 50 (4) රුපි. 55 (5) රුපි. 60 (……)

**12.** කිසියම් භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් වක්‍රය වමට විතැන් වීමට බලපානුයේ පහත සඳහන් කවර සාධකයක් ද?

(1) එම භාණ්ඩයේ මිල ඉහළ යාම
(2) එම භාණ්ඩයේ මිල පහළ වැටීම
(3) අනුපූරක භාණ්ඩයක මිල පහළ වැටීම
(4) ආදේශක භාණ්ඩයක මිල ඉහළ යාම
(5) අනාගත මිල පහළ වැටෙතියි යන අපේක්ෂාව (……)

**13.** පහළට බෑවුම් වන වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රයක් සහ ඉහළට බෑවුම් වන වෙළෙඳපොළ සැපයුම් වක්‍රයක් සහිත භාණ්ඩයක යෙදවුම් මිල පහළ වැටීමේ ප්‍රතිඵලයක් වනුයේ,

(1) සමතුලිත මිල හා ප්‍රමාණය ඉහළ යාම ය.
(2) සමතුලිත මිල හා ප්‍රමාණය පහළ යාම ය.
(3) සැපයුම් වක්‍රය වමට විතැන් වීම ය.
(4) සමතුලිත මිල පහළ වැටීම හා සමතුලිත ප්‍රමාණය ඉහළ යාම ය.
(5) සමතුලිත මිල ඉහළ යාම හා සමතුලිත ප්‍රමාණය පහළ යාම ය. (……)

**14.** කිසියම් කුඩා රටක සීනි සඳහා දේශීය වෙළෙඳපොළේ පවත්නා ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පිළිවෙළින් පහත සඳහන් සමීකරණ පෙන්නුම් කරයි.

$Q_d = 320 - 3P$ (ඉල්ලුම) $Q_s = -80 + 2P$ (සැපයුම)


තව ද එම රටේ සීනි වෙළෙඳපොළ ජාත්‍යන්තර වෙළෙඳාමට විවෘත බවත්, සීනි ඒකකයක ලෝක වෙළෙඳපොළ මිල රු. 60ක් වන බවත් සලකන්න. විදේශ වෙළෙඳාමට විවෘතව ඇති තත්ත්වය යටතේ, වෙළෙඳපොළට දේශීය වශයෙන් සපයනු ලබන සීනි ප්‍රමාණය කොපමණ වේ ද?

(1) ඒකක 40 (2) ඒකක 60 (3) ඒකක 80 (4) ඒකක 100 (5) ඒකක 140 (……)

**15.** පෙට්‍රල් සඳහා පවත්නා ඉල්ලුම අතිශයින් අනම්‍ය බවත් එහි සැපයුම අතිශයින් නම්‍ය බවත් සලකන්න. මෙම තත්ත්වය යටතේ පෙට්‍රල් මත නිෂ්පාදන බද්දක් පනවනු ලැබුවහොත් බදු බර

(1) ඉතා විශාල වශයෙන් ගැනුම්කරුවන් විසින් දරනු ලැබේ.
(2) ඉතා විශාල වශයෙන් විකුණුම්කරුවන් විසින් දරනු ලැබේ.
(3) ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් විසින් සමසමව දරනු ලැබේ.
(4) මුළුමනින් ම අය බදු ගෙවන්නෝ දරති.
(5) ගැනුම්කරුවෝ හෝ විකුණුම්කරුවෝ හෝ නොදරති. (……)

**16.** කෘෂිකාර්මික භාණ්ඩයක් සඳහා පවත්නා තරගකාරී වෙළෙඳපොළක, ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර මෙම ප්‍රස්තාර සටහන පෙන්නුම් කරයි.




මෙම භාණ්ඩයේ නිෂ්පාදනය ඉහළ නැංවීමේ අවශ්‍යතාව නිසා, නිමැවුම් ඒකකයකට රු. 2ක් වන සේ සහනාධාරයක් නිෂ්පාදකයන්ට ලබාදීමට රජය තීරණය කරයි. සහනාධාරය ලබාදුන් පසුව පාරිභෝගික අතිරික්තයේ ප්‍රමාණය

(1) රු. 20කි. (2) රු. 80කි. (3) රු. 90කි. (4) රු. 160කි. (5) රු. 180කි. (……)

**17.** සමතුලිත මිලට වඩා පහළ මිලක් නියම කරමින් පනවනු ලබන උපරිම මිල ප්‍රතිපත්තියක ප්‍රතිඵලයක් වනුයේ වෙළෙඳපොළෙහි,

(1) අධි සැපයුමක් හටගැනීම ය. (2) අධි ඉල්ලුමක් හටගැනීම ය.
(3) සමතුලිත මිලක් ඇතිවීම ය. (4) සැපයුම වැඩි වීම ය.
(5) ඉල්ලුම අඩු වීම ය. (……)


**18.** නිෂ්පාදන ක්‍රියාවලියේ දී කෙටි කාලය ලෙස සැලකෙන කාල පරිච්ඡේදයේ දී,

(1) වැඩිපුර කම්කරුවන් සේවයට යොදා ගැනීමට ආයතනයට නොහැකි වේ.
(2) නිෂ්පාදනය කරනු ලබන නිමැවුම් ප්‍රමාණය නොවෙනස්ව පවතී.
(3) බොහෝ යෙදවුම්වල හිඟයක් හටගනී.
(4) සියලු ම යෙදවුම් ස්ථාවරව පැවතියත් නිමැවුම වෙනස් කළ හැකි ය.
(5) සමහර යෙදවුම් ප්‍රමාණ නොවෙනස්ව පවත්නා අතර සමහර යෙදවුම් ප්‍රමාණ වෙනස් කළ හැකි ය. (……)

**19.** මුළු පිරිවැය (TC) සහ මුළු විචල්‍ය පිරිවැය (TVC) වක්‍ර අතර පවතින සිරස් දුර

(1) නිමැවුම අඩුවන විට අඩු වෙමින් පවතී.
(2) නිමැවුම අඩුවන විට වැඩි වෙමින් පවතී.
(3) ආන්තික පිරිවැයට (MC) සමාන වේ.
(4) මුළු ස්ථාවර පිරිවැයට (TFC) සමාන වේ.
(5) සාමාන්‍ය ස්ථාවර පිරිවැයට (AFC) සමාන වේ. (……)

**20.** මෙම රූප සටහනෙහි පෙන්නුම් කරන ආකාරයේ පිරිවැය සහ ඉල්ලුම් තත්ත්වයකට මුහුණ දෙන තරගකාරී නිෂ්පාදන ආයතනයක්, තම නිමැවුම $Q_1$ සිට $Q_2$ දක්වා වැඩි කරන විට,




(1) ප්‍රාමාණික ලාභයක් උපයයි.
(2) ලාභ ඉහළ නංවා ගනියි.
(3) ලාභ අඩු කර ගනියි.
(4) අයභාරය ඉහළ ගියත් පිරිවැය ඉහළ නොනගී.
(5) පිරිවැය ඉහළ ගියත් අයභාරය ඉහළ නොනගී. (……)

**21.** පහත සඳහන් කරුණු අතුරෙන් ඒකාධිකාරී තරග වෙළෙඳපොළක ලක්ෂණයක් **නොවන්නේ** කවරක් ද?

(1) වෙළෙඳපොළට ප්‍රවේශ වීම සාපේක්ෂ වශයෙන් පහසු වීම
(2) ප්‍රභේදනය වූ භාණ්ඩ තිබීම
(3) භාණ්ඩ ප්‍රචාරණය සැලකිය යුතු තරම් මට්ටමක තිබීම
(4) ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටීම
(5) ආයතන මුහුණ දෙන ඉල්ලුම් වක්‍ර පූර්ණ නම්‍ය ස්වරූපයක් ගැනීම (……)

**22.** කිසියම් ආර්ථිකයක ආදායමේ චක්‍රීය ප්‍රවාහය පෙන්නුම් කෙරෙන සටහනක් තුළ, ආණ්ඩුව වෙතින් ඍජුව ගලා යන ප්‍රවාහයක් වනුයේ පහත සඳහන් දෑ අතුරෙන් කවරක් ද?

(1) බදු (T) (2) අපනයන (X) (3) ඉතුරුම් (S)
(4) සංක්‍රාම වියදම් (Tr.) (5) ආයෝජන වියදම් (I) (……)

**23.** ව්‍යාපාර චක්‍රයක සංකෝචනාත්මක අදියරේ දී,

(1) ආයෝජනය ඉහළ නගින අතර නිමැවුම පහළ වැටේ.
(2) විරැකියාව ඉහළ නගින අතර නිමැවුම පහළ වැටේ.
(3) විරැකියාව පහළ වැටෙන අතර මිල මට්ටම ඉහළ නගී.
(4) විරැකියාව පහළ වැටෙන අතර නිමැවුම ඉහළ නගී.
(5) විරැකියාව ඉහළ නගින අතර නිමැවුම ද ඉහළ නගී. (……)

**24.** වර්තමානයේ ශ්‍රී ලංකාවේ දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය තුළ දක්නට ලැබෙන විශාලතම සංරචකය වනුයේ,

(1) යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ වේ. (2) මූල්‍ය වත්කම් වේ.
(3) ඉඩම් දියුණු කිරීම සහ වැවිලි සංවර්ධනයයි. (4) තොග වෙනස් වීම ය.
(5) ඉදිකිරීම් ය. (……)

**25.** වියදම් ප්‍රවේශයෙන් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී, එකතු කළ යුතු වියදම් ශීර්ෂ වනුයේ,

(1) වැටුප්, ලාභ, ආණ්ඩුවේ මිල දී ගැනීම් සහ ශුද්ධ අපනයන වේ.
(2) වැටුප්, බදුකුලී, පොලී සහ ලාභ වේ.
(3) පරිභෝජනය, ආයෝජනය, ආණ්ඩුවේ මිල දී ගැනීම් සහ අපනයන වේ.
(4) පරිභෝජනය, ආයෝජනය, ආණ්ඩුවේ මිල දී ගැනීම් සහ ශුද්ධ අපනයන වේ.
(5) පරිභෝජනය, ආණ්ඩුවේ මිල දී ගැනීම්, බදු සහ පොලිය වේ. (……)

**26.** පවත්නා වෙළඳපොළ මිල අනුව වර්තමානයේ ශ්‍රී ලංකාවේ, දළ දේශීය නිෂ්පාදිතයේ අගය, ආසන්න වශයෙන්

(1) ඇමෙරිකානු ඩොලර් බිලියන 50කි. (2) ඇමෙරිකානු ඩොලර් බිලියන 75කි.
(3) ඇමෙරිකානු ඩොලර් බිලියන 100කි. (4) ඇමෙරිකානු ඩොලර් බිලියන 125කි.
(5) ඇමෙරිකානු ඩොලර් බිලියන 150කි. (……)


**27.** ජාතික ආදායම සමතුලිත මට්ටමක පවතින එක්තරා ආර්ථිකයකට අදාළ සාර්ව ආර්ථික දත්ත පෙළක් පහත දැක්වේ.

| අයිතමය | රුපි. මිලියන | අයිතමය | රුපි. මිලියන |
|---|---|---|---|
| පරිභෝජන වියදම | 5 000 | ආනයන | 1 200 |
| බදු අයභාරය | 1 000 | අපනයන | 980 |
| ආණ්ඩුවේ මිල දී ගැනීම් | 1 500 | වෙළෙඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය | 8 000 |

මෙම ආර්ථිකයේ ආයෝජන මට්ටම වනුයේ,

(1) රුපි. මිලියන 310කි. (2) රුපි. මිලියන 320කි.
(3) රුපි. මිලියන 1 220කි. (4) රුපි. මිලියන 1 720කි.
(5) රුපි. මිලියන 1 940කි. (……)

**28.**




ඉහත ප්‍රස්තාරයෙහි රේඛීය පරිභෝජන ශ්‍රිතයක් දැක්වේ. මෙම පරිභෝජන ශ්‍රිතයෙහි ස්වායත්ත පරිභෝජන වියදම රු. 4 000ක් වේ නම්, *B* ලක්ෂ්‍යයේ දී මුළු පරිභෝජන වියදම කොපමණ ද?

(1) රුපි. 18 000 (2) රුපි. 17 000 (3) රුපි. 16 000
(4) රුපි. 14 000 (5) රුපි. 10 000 (……)

**29.** ආර්ථික විද්‍යාඥයන් උපකල්පනය කරනුයේ, මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යන විට,

(1) අපනයන ඉහළ යන බව ය. (2) ආනයන පහළ වැටෙන බව ය.
(3) ශුද්ධ අපනයන නොවෙනස්ව පවතින බව ය. (4) ශුද්ධ අපනයන ඉහළ යන බව ය.
(5) ශුද්ධ අපනයන පහළ වැටෙන බව ය. (……)

**30.** අනපේක්ෂිතව හටගන්නා දැඩි උද්ධමනීය මිල ඉහළ යාමක් හේතුකොට, සැබැවින් ම වාසි ලබනුයේ පහත සඳහන් කවර කණ්ඩායමක් ද?
(1) විශ්‍රාමික සේවකයන්
(2) ණයහිමියන්
(3) වැටුප් උපයන්නන්
(4) රැකියාව කළ කාලයේ දී මුදල් ඉතිරි කර ගත් දැනට වියපත්ව සිටින පුද්ගලයන්
(5) ණයගනුවන් (……)

**31.** ආර්ථිකය පූර්ණ සේවා නියුක්තියෙහි පවත්නා විට, ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනයක් ජනනය කිරීමෙහි ලා ඉවහල් වනුයේ පහත දැක්වෙන කවර සාධකයක් ද?
(1) අයවැය හිඟයේ අඩු වීමක් (2) ශුද්ධ අපනයන අඩු වීමක්
(3) වෘත්තීය සමිතිවල බලය අඩු වීමක් (4) මූර්ත පොලී අනුපාතිකයේ අඩුවීමක්
(5) මුදල් සැපයුමෙහි අඩු වීමක් (……)

**32.** වර්ෂයක් ඇතුළත කිසියම් රටක උද්ධමන අනුපාතිකය 12% ක් වූ අතර එම කාල පරිච්ඡේදය තුළ නාමික දළ ජාතික නිෂ්පාදිතය 14% කින් වර්ධනය විය. එම වර්ෂය තුළ සිදුව ඇත්තේ කුමක් ද යන්න නිවැරදි ව පෙන්නුම් කරනුයේ පහත දැක්වෙන කවර ප්‍රකාශයකින් ද?
(1) මුදල් සැපයුම 2% කින් පහළ වැටුණි. (2) මුදල් සැපයුම 2% කින් ඉහළ නැගුණි.
(3) මූර්ත දළ ජාතික නිෂ්පාදිතය ඉහළ නැගුණි. (4) මූර්ත දළ ජාතික නිෂ්පාදිතය පහළ වැටුණි.
(5) මුදලේ සංසරණ ප්‍රවේගය වැඩි විය. (……)

**33.** "ආසන්න මුදල්" සංකල්පය යොදා ගැනෙනුයේ,
(1) මුදල් වශයෙන් වර්ග කළ නොහැකි තරමට, ඉතා අස්ථායි ප්‍රාග්ධන වටිනාකම් සහිත මූල්‍ය වත්කම් හැඳින්වීමට ය.
(2) හුවමාරු මාධ්‍යයක කාර්යය ඉටු කරන නමුදු වටිනාකම් සංනිධියක කාර්යය ඉටු කිරීමට අසමත් ද්‍රවශීල වත්කම් හැඳින්වීමට ය.
(3) වටිනාකම් සංනිධියක කාර්යය ඉටු කරන නමුදු හුවමාරු මාධ්‍යයක කාර්යය ඉටු කිරීමට අසමත් ද්‍රවශීල වත්කම් හැඳින්වීමට ය.
(4) ඉල්ලුම් තැන්පතු පදනම් කර ගනිමින් නිකුත් කෙරෙන චෙක්පත් හැඳින්වීමට ය.
(5) ණයපත් හැඳින්වීමට ය. (……)

**34.** වර්තමානයේ ශ්‍රී ලංකාවේ $M_4$ මූල්‍ය සමස්තයට ඇතුළත් විශාලත ම සංරචකය වනුයේ,
(1) මහජනතාව සතු ව්‍යවහාර මුදල් වේ.
(2) මහජනතාව සතු ඉල්ලුම් තැන්පතු වේ.
(3) බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වෙතැති මහජනතාව සතු ආසන්න මුදල් වේ.
(4) වාණිජ බැංකු වෙතැති මහජනතාව සතු ආසන්න මුදල් වේ.
(5) බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙතැති මහජනතාව සතු ආසන්න මුදල් වේ. (……)

**35.** වාණිජ බැංකු පද්ධතියකට අයත් සියලු ම බැංකු, තම තැන්පතුවලින් 20% ක් සංචිත මුදල් වශයෙන් පවත්වා ගනු ලබන බවත්, ඉන් එක් බැංකුවක් වෙත රුපියල් මිලියන 200ක නව මුදල් තැන්පතුවක් ලැබෙන බවත් සලකන්න. ව්‍යවහාර මුදල් සංසරණයේ වෙනසක් සිදු නොවන්නේ නම්, නව තැන්පතුවේ ප්‍රතිඵලයක් ලෙස මුළු බැංකු පද්ධතියට අලුතින් කොතරම් ණය ප්‍රමාණයක් උපරිම වශයෙන් නිකුත් කළ හැකි වේ ද?
(1) රුපි. මිලියන 160කි. (2) රුපි. මිලියන 200කි. (3) රුපි. මිලියන 800කි.
(4) රුපි. මිලියන 1 000කි. (5) රුපි. මිලියන 1 200කි. (……)

**36.** මහ බැංකුව විසින් රජයේ සුරකුම්පත් විවෘත වෙළෙඳපොළෙහි අලෙවි කරනු ලැබුවහොත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් පහත සඳහන් ඇ අතුරෙන් කවරක් සිදු වෙතැයි අපේක්ෂා කෙරේ ද?
(1) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම
(2) ණය සඳහා අයකරන පොලී අනුපාතිකය ඉහළ යාම
(3) බැංකු විසින් සපයනු ලබන ණය ප්‍රමාණය වැඩි වීම
(4) පෞද්ගලික ආයෝජන වියදම් ඉහළ යාම
(5) මුදල් සැපයුම ප්‍රසාරණය වීම (……)

**37.** පහත සඳහන් ඇ අතුරෙන් වෙළෙඳපොළ අසමත් වීමක් ලෙස **නොසැලකෙනුයේ** කවරක් ද?
(1) ඒකාධිකාරී ව්‍යාපාරික ආයතන පැවතීම
(2) වායු හා ජල දූෂණය ඉතා ඉහළ මට්ටමක තිබීම
(3) ජාතික ආරක්ෂාව වැනි අත්‍යවශ්‍ය සේවා ප්‍රමාණවත්ව නොසැපයීම
(4) පොදු භාණ්ඩ ප්‍රමාණවත් ව සැපයීම
(5) අසමාන ආදායම් ව්‍යාප්තියක් පැවතීම (……)

**38.** නිෂ්පාදන ක්‍රියාවලිය නිසා හට ගන්නා බාහිර පිරිවැය, කිසියම් කර්මාන්තයක් විසින් නොසලකා හැරේ නම්, තරගකාරී වෙළෙඳපොළක සමතුලිත නිමැවුමට අදාළ නිවැරදි ප්‍රකාශය වනුයේ කවරක් ද?
(1) මිල, ආන්තික සමාජ පිරිවැයට වඩා වැඩි අගයක් ගනු ඇත.
(2) මිල, ආන්තික සමාජ පිරිවැයට වඩා අඩු අගයක් ගනු ඇත.
(3) මිල, ආන්තික සමාජ පිරිවැයට සමාන වනු ඇත.
(4) ආන්තික පෞද්ගලික පිරිවැය, ආන්තික සමාජ පිරිවැයට සමාන වනු ඇත.
(5) ආන්තික පෞද්ගලික පිරිවැය, ආන්තික සමාජ පිරිවැයට වඩා වැඩි අගයක් ගනු ඇත. (……)

**39.** ශුද්ධ පොදු භාණ්ඩයක් යනු,
(1) වෙළෙඳපොළ විසින් කාර්යක්ෂමව සපයනු ලබන භාණ්ඩයකි.
(2) පරිභෝජනයේ තරගකාරිත්වයක් පවතින සහ පරිභෝජනය වැළැක්විය හැකි භාණ්ඩයකි.
(3) පරිභෝජනයේ තරගකාරිත්වයක් නොමැති සහ පරිභෝජනය වැළැක්විය හැකි භාණ්ඩයකි.
(4) පරිභෝජනයේ තරගකාරිත්වයක් පවතින සහ පරිභෝජනය වැළැක්විය නොහැකි භාණ්ඩයකි.
(5) පරිභෝජනයේ තරගකාරිත්වයක් නොමැති සහ පරිභෝජනය වැළැක්විය නොහැකි භාණ්ඩයකි. (……)

**40.** රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යටතේ, රජය,
(1) වෙළෙඳපොළ පොලී අනුපාතික තීරණය කරයි.
(2) මුදල් සැපයුමේ වර්ධන අනුපාතිකය තීරණය කරයි.
(3) බදු අය කිරීම් හා ආණ්ඩුවේ වියදම් මට්ටම් තීරණය කරයි.
(4) මුදල් සැපයුම තීරණය කරයි.
(5) උද්ධමන අනුපාතිකය තීරණය කරයි. (……)

**41.** වර්තමානයේ ශ්‍රී ලංකා රජයේ විශාලතම බදු අයභාර මූලාශ්‍රය වනුයේ,
(1) එකතු කළ අගය මත අයකරන බද්ද ය. (2) සමාගම් ආදායම් බද්ද ය. (3) නිෂ්පාදන බද්ද ය.
(4) ආනයන බද්ද ය. (5) උපයන විට ගෙවීමේ බද්ද ය. (PAYE) (……)

**42.** පහත සඳහන් කරුණු අතුරෙන් රටවල් අතර සාපේක්ෂ වාසි තීරණය කෙරෙන ප්‍රධාන නිශ්චායකයක් ලෙස ඇතුළත් **නොවනුයේ,**
(1) ඒක පුද්ගල ආදායම ය. (2) දේශගුණය ය.
(3) ශ්‍රම හමුදාවේ නිපුණතාවන් ය. (4) එක් ශ්‍රමිකයෙකුට වැටෙන ප්‍රාග්ධනයේ ප්‍රමාණය ය.
(5) භූගෝලීය පිහිටීම ය. (……)

**43.** A සහ B යන රටවල සංයුක්ත සම්පත් ඒකකයක් යොදා ගනිමින් නිපදවිය හැකි පාපැදි හා ට්‍රැක්ටර් ප්‍රමාණ පහත වගුවෙහි දැක්වේ.

| භාණ්ඩය | A රට | B රට |
|---|---|---|
| ට්‍රැක්ටර් | 20 | 2 |
| පාපැදි | 60 | 10 |

එක් එක් රට තමන්ට සාපේක්ෂ වාසි සහිත භාණ්ඩය විශේෂ ප්‍රාගුණ්‍යතය කරතියි උපකල්පනය කරන්න. මෙහිදී අන්‍යොන්‍ය වශයෙන් වාසිදායක වෙළෙඳාමක් හට ගැනීම සඳහා ට්‍රැක්ටර් සහ පාපැදි හුවමාරු විය යුතු අනුපාතය වනුයේ,
(1) එක් ට්‍රැක්ටරයක් සඳහා පාපැදි 3කට අඩු ප්‍රමාණයකි.
(2) එක් ට්‍රැක්ටරයක් සඳහා පාපැදි 3 සහ 5 අතර ප්‍රමාණයකි.
(3) එක් ට්‍රැක්ටරයක් සඳහා පාපැදි 2 සහ 60 අතර ප්‍රමාණයකි.
(4) එක් ට්‍රැක්ටරයක් සඳහා පාපැදි 6 සහ 10 අතර ප්‍රමාණයකි.
(5) එක් ට්‍රැක්ටරයක් සඳහා පාපැදි 10කට වැඩි ප්‍රමාණයකි. (……)

**44.** රටක වෙළෙඳ අනුපාතයෙහි පිරිහීමක් ඇති කිරීමේ ලා, මිල වෙනස්කම්වල පහත සඳහන් සංයෝජන අතුරෙන් කවරක් හේතුවේ ද?

| | අපනයනවල සාමාන්‍ය මිල | ආනයනවල සාමාන්‍ය මිල |
|---|---|---|
| (1) | පහළ වැටේ | ඉහළ නගී |
| (2) | පහළ වැටේ | පහළ වැටේ |
| (3) | ඉහළ නගී | පහළ වැටේ |
| (4) | ඉහළ නගී | ඉහළ නගී |
| (5) | නොවෙනස් ව පවතී | පහළ වැටේ |

(……)

**45.** නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයක් යටතේ, ඇමෙරිකානු ඩොලරයේ රුපියල් මිල ඉහළ නංවනුයේ පහත සඳහන් කවර කරුණක් ද?
(1) ශ්‍රී ලංකාවට වඩා ඇමෙරිකා එක්සත් ජනපදයෙහි උද්ධමන අනුපාතිකය ඉහළ අගයක් වීම
(2) ශ්‍රී ලංකාවට වඩා වේගයකින් ඇමෙරිකා එක්සත් ජනපදයෙහි ජාතික ආදායම ඉහළ යාම
(3) ශ්‍රී ලංකාවේ ඇඟලුම් සඳහා ඇමෙරිකානු වැසියන්ගේ රුචිකත්වය වැඩි වීම
(4) ඇමෙරිකා එක්සත් ජනපදයේ සිට ශ්‍රී ලංකාවට ගලා එන ආනයන ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩු වීම
(5) ශ්‍රී ලංකාවට වඩා ඇමෙරිකා එක්සත් ජනපදයෙහි මූර්ත පොලී අනුපාතිකය ඉහළ යාම (……)

**46.** ආර්ථික වෘද්ධිය සාමාන්‍යයෙන් මිනුම් කරනුයේ,
(1) නාමික දළ දේශීය නිෂ්පාදිතයේ වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස මගිනි.
(2) මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස මගිනි.
(3) නාමික ප්‍රති ශීර්ෂ දළ දේශීය නිෂ්පාදිතයේ වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස මගිනි.
(4) ප්‍රතිශීර්ෂ වැය කළ හැකි ජාතික ආදායමේ වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස මගිනි
(5) ක්‍රය ශක්ති සාම්‍ය ප්‍රති ශීර්ෂ දළ දේශීය නිෂ්පාදිතයේ වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස මගිනි. (……)

**47.** කිසියම් කල්පිත ආර්ථිකයක සේවා වියුක්ත ජනගහනය ලෙස වර්ග කෙරුණු පිරිස 50 000ක් ද, සේවා නියුක්ත ජනගහනය ලෙස වර්ග කෙරුණු පිරිස 450 000ක් ද වේ නම්, එම ආර්ථිකයේ සේවා වියුක්ත අනුපාතිකය,

(1) 11.1% ක් වේ. (2) 10.0% ක් වේ. (3) 9.2% ක් වේ.
(4) 8.0% ක් වේ. (5) 7.4% ක් වේ. (……)

**48.** පසුගිය වසර 10 තුළ කිසියම් රටක ආදායම් ව්‍යාප්තියේ ජිනි සංගුණකය 0.45 සිට 0.65 දක්වා ඉහළ ගොස් ඇතැයි වාර්තා වී තිබේ. මෙම වෙනස්වීම ඇති කරලීමෙහි ලා හේතු විය හැක්කේ පහත සඳහන් කවර කරුණක් ද?

(1) සාධක වෙළෙඳපොළෙහි සහ භාණ්ඩ වෙළෙඳපොළෙහි වෙළෙඳපොළ බලය වැඩි වීම
(2) ශ්‍රම වෙළෙඳපොළෙහි විෂමතා ඉවත්කරලීම
(3) වඩා සාධාරණ ලෙසින් ධනය සහ දේපළ බෙදී යාම
(4) වැඩිහිටි ජනගහනයෙන් බහුතරයක් අවම වශයෙන් උසස් පෙළ සාමාර්ථයවත් ලබා තිබීම
(5) වඩාත් අනුක්‍රම බදු ක්‍රමයක් අනුගමනය කිරීම (……)

**49.** කිසියම් රටක ආදායම් ව්‍යාප්තියෙහි අසමානතා අඩු කිරීමෙහි ලා වඩාත් දායකවිය හැක්කේ පහත සඳහන් කවර කරුණක් ද?

(1) ජනගහන වර්ධන අනුපාතිකයෙහි ඉහළ යාම
(2) අඩු නිපුණතා සහිතව සේවා නියුක්ත ශ්‍රමිකයනට වෘත්තීය පුහුණුව ලබාදීම
(3) අයවැය හිඟය ඉහළ යාම
(4) සේවා වියුක්ත ශ්‍රමිකයන් පුහුණු කිරීම සඳහා වෙන් කෙරෙන අරමුදල් ප්‍රමාණය අඩුවීම
(5) ප්‍රතික්‍රම බද්දක් පැනවීම (……)

**50.** පසුගිය දශක කීපය මුළුල්ලේ ගෝලීය වශයෙන් හටගෙන ඇති ආනයන හා අපනයන වෙළෙඳාමේ දැවැන්ත ප්‍රසාරණයට මූලික වශයෙන් හේතු වී ඇත්තේ,

(1) බොහෝ රටවල තීරු බදු නොවන බාධක ඉවත් කරළීම ය.
(2) බොහෝ රටවල් ආරක්ෂණවාදී ප්‍රතිපත්ති කරා වැඩි වශයෙන් යොමු වීම ය.
(3) ලෝකයේ ප්‍රවාහන හා සන්නිවේදන පිරිවැය වේගයෙන් පහළ වැටෙමින් පැවතීම ය.
(4) සංවර්ධනය වන රටවල වැටුප් මට්ටම් පහළ වැටීම ය.
(5) බොහෝ රටවල දේශපාලන අධිකාරිය මධ්‍යගත සැලසුම්කරණයෙන් ඉවත් වීම ය. (……)


* * *

**2.1.3. I ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 1 | 26. | 2 |
| 02. | 2 | 27. | 4 |
| 03. | 2 | 28. | 4 |
| 04. | 4 | 29. | 5 |
| 05. | 2 | 30. | 5 |
| 06. | 5 | 31. | 4 |
| 07. | 2 | 32. | 3 |
| 08. | 5 | 33. | 3 |
| 09. | 5 | 34. | 4 |
| 10. | 1 | 35. | 3 |
| 11. | 3 | 36. | 2 |
| 12. | 5 | 37. | 4 |
| 13. | 4 | 38. | 2 |
| 14. | 1 | 39. | 5 |
| 15. | 1 | 40. | 3 |
| 16. | 3 | 41. | 1 |
| 17. | 2 | 42. | 1 |
| 18. | 5 | 43. | 2 |
| 19. | 4 | 44. | 1 |
| 20. | 3 | 45. | 5 |
| 21. | 5 | 46. | 2 |
| 22. | 4 | 47. | 2 |
| 23. | 2 | 48. | 1 |
| 24. | 5 | 49. | 2 |
| 25. | 4 | 50. | 3 |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු **02** බැගින් ලකුණු **100** කි.

## 2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ




ඉහත ප්‍රස්තාරයට අනුව, I ප්‍රශ්න පත්‍රය සැලකීමේදී පහසුතාව අඩුම ප්‍රශ්නය, 29 වන ප්‍රශ්නය වේ. එහි පහසුතාව 9%කි. එනම්, අයදුම්කරුවන් අතුරෙන් අඩු ම ප්‍රතිශතයක් නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ 29 වන ප්‍රශ්නයට ය. එසේම පහසුතාව වැඩිම ප්‍රශ්නය වන්නේ, 2 වන ප්‍රශ්නය වන අතර, එහි පහසුතාව 94%කි. එනම්, අයදුම්කරුවන් අතුරෙන් වැඩි ම ප්‍රතිශතයක් නිවැරදි ව පිළිතුරු සපයා ඇති ප්‍රශ්නය 02 වන ප්‍රශ්නයටය.

සමස්ත ප්‍රශ්න පත්‍රය සැලකීමේදී I ප්‍රශ්න පත්‍රයෙහි සමස්ත පහසුතාව 29%ක් වේ.

## 2.1.5. I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | **1** | **2** | **3** | **4** | **5** | **Missing** |
| 1 | 1 | 80.50 | 8.00 | 4.70 | 2.40 | **4.20** | 0.20 |
| 2 | 2 | 1.50 | **94.30** | 1.30 | 0.30 | 2.60 | - |
| 3 | 2 | 2.90 | **43.50** | 5.40 | 44.60 | 3.40 | 0.20 |
| 4 | 4 | 3.60 | 4.60 | 3.70 | **84.30** | 3.60 | 0.20 |
| 5 | 2 | 5.00 | 64.50 | 9.50 | 11.30 | **9.50** | 0.20 |
| 6 | 5 | 4.10 | 4.70 | 4.20 | 4.00 | **82.70** | 0.30 |
| 7 | 2 | 4.90 | 83.6 | 4.00 | 5.80 | **1.70** | - |
| 8 | 5 | 5.80 | 1.3 | 13.80 | **3.40** | 75.60 | 0.10 |
| 9 | 5 | 9.20 | 14.90 | 5.20 | 4.50 | **65.80** | 0.40 |
| 10 | 1 | 52.50 | **2.00** | 1.60 | 1.60 | 42.30 | - |
| 11 | 3 | 4.70 | 12.3 | 57.30 | **15.60** | 9.10 | 1.00 |
| 12 | 5 | 21.30 | **11.5** | 10.30 | 8.00 | 48.70 | 0.20 |
| 13 | 4 | **4.60** | 7.70 | 7.10 | 70.20 | 9.70 | 0.70 |
| 14 | 1 | **50.20** | 5.80 | 26.80 | 6.00 | 11.00 | 0.20 |
| 15 | 1 | 62.90 | 5.70 | **11.00** | 7.20 | 2.80 | 0.40 |
| 16 | 3 | 10.60 | 19.00 | **53.60** | 11.30 | 4.60 | 0.90 |
| 17 | 2 | 8.60 | **22.70** | 2.40 | 3.20 | 2.90 | 0.20 |
| 18 | 5 | 4.20 | **7.00** | 3.90 | 13.70 | 70.90 | 0.20 |
| 19 | 4 | 4.20 | 5.40 | 18.00 | 64.50 | **7.40** | 0.50 |
| 20 | 3 | 17.20 | 18.20 | 23.00 | 6.40 | **34.80** | 0.40 |
| 21 | 5 | 10.10 | 7.00 | 6.10 | **12.10** | 64.50 | 0.20 |
| 22 | 4 | 27.80 | 3.40 | 6.50 | **49.10** | 13.00 | 0.20 |
| 23 | 2 | 6.50 | 70.10 | 6.80 | 12.60 | **3.60** | 0.40 |
| 24 | 5 | **13.20** | 8.10 | 11.50 | 22.50 | 44.20 | 0.50 |
| 25 | 4 | 2.00 | **10.00** | 5.70 | 75.90 | 5.90 | 0.50 |
| 26 | 2 | 3.90 | 33.60 | **8.00** | 44.00 | 9.60 | 0.90 |
| 27 | 4 | 1.70 | 9.60 | 14.60 | **71.50** | 1.90 | 0.70 |
| 28 | 4 | 18.30 | 5.50 | **16.10** | 54.10 | 5.50 | 0.50 |
| 29 | 5 | 14.40 | 8.70 | 9.70 | 57.90 | **9.00** | 0.20 |
| 30 | 5 | 4.70 | 24.60 | **7.40** | 8.70 | 54.40 | 0.20 |
| 31 | 4 | 13.40 | 13.00 | 6.30 | **44.50** | 22.20 | 0.70 |
| 32 | 3 | **9.40** | 24.10 | 38.70 | 10.40 | 16.70 | 0.70 |
| 33 | 3 | **3.50** | 23.10 | 59.30 | 8.10 | 5.70 | 0.40 |
| 34 | 4 | 16.60 | **12.00** | 22.50 | 26.20 | 21.90 | 0.80 |
| 35 | 3 | 30.00 | **10.20** | 42.20 | 14.00 | 2.30 | 0.70 |
| 36 | 2 | 6.30 | 46.30 | **14.10** | 12.70 | 20.30 | 0.30 |
| 37 | 4 | 9.20 | 16.80 | 5.60 | 63.60 | **4.60** | 0.20 |
| 38 | 2 | 17.60 | 40.00 | **9.20** | 12.80 | 19.60 | 0.80 |
| 39 | 5 | 1.90 | 5.10 | **7.30** | 14.30 | 71.10 | 0.40 |
| 40 | 3 | 13.90 | 5.00 | 61.30 | **15.32** | 4.20 | 0.40 |
| 41 | 1 | 74.10 | 4.30 | 7.80 | **11.30** | 2.50 | - |
| 42 | 1 | 46.50 | **21.30** | 5.10 | 22.10 | 4.70 | 0.40 |
| 43 | 2 | 10.50 | **71.70** | 3.10 | 10.50 | 3.60 | 0.60 |
| 44 | 1 | 72.00 | **6.80** | 12.30 | 3.90 | 4.50 | 0.50 |
| 45 | 5 | **21.80** | 21.60 | 19.80 | 20.50 | 16.00 | 0.30 |
| 46 | 2 | 7.10 | **68.9** | 6.10 | 6.70 | 10.80 | 0.40 |
| 47 | 2 | **24.50** | 58.50 | 9.80 | 4.40 | 2.50 | 0.30 |
| 48 | 1 | 41.90 | **13.70** | 22.30 | 7.00 | 14.50 | 0.60 |
| 49 | 2 | **4.50** | 59.90 | 59.40 | 8.40 | 17.50 | 0.30 |
| 50 | 3 | 50.00 | **13.90** | 22.10 | 2.00 | 11.80 | 0.20 |

* එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු පසුබිමෙහි දක්වා ඇත.

* Missing යනුවෙන් දක්වා ඇත්තේ, ප්‍රශ්නය සඳහා වරණ තෝරා නැති හෝ එක් වරණයකට වඩා වැඩියෙන් වරණ තෝරා ඇති හෝ ශිෂ්‍ය ප්‍රතිශතයයි.

## 2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

- සමස්තයක් ලෙස සළකා බලන විට, බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත I ප්‍රශ්න පත්‍රයේ අංක 01, 02, 04, 05, 06, 07, 08, 09, 13, 15, 17, 18, 19, 21, 23, 25, 27, 37, 39, 40, 41, 43, 44, 46 යන ප්‍රශ්න සඳහා අපේක්ෂකයින්ගෙන් අවම වශයෙන් 60% ඉක්මවූ ප්‍රතිශතයක් නිවැරදි ව පිළිතුරු සපයා ඇත.

- අංක 20, 26, 29, 32, 34, 45, 50 යන ප්‍රශ්න සඳහා නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ සමස්ත අපේක්ෂකයින් අතුරින් 40%ට අඩු ප්‍රතිශතයකි.

- 20 වන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය තෝරා ඇති ප්‍රතිශතය 23%කි. මෙම ප්‍රශ්නයේදී, පූර්ණ තරග වෙළෙඳපොළ ආයතනයක ආන්තික අයභාර, ආන්තික පිරිවැය රේඛා හඳුනා ගනිමින් ලාභ උපරිම කරන නිමැවුම් මට්ටම, දෙන ලද රූප සටහනක් ඇසුරෙන් තීරණය කරන ආකාරය විමසීමට ලක් කොට ඇති නමුත්, ඒ පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා දැනුම භාවිත කොට විග්‍රහ කර ගැනීම පිළිබඳව අවබෝධයක් අයදුම්කරුවන්ට නොමැති බැව් අනාවරණය වේ. එබැවින් උක්ත මාතෘකාව පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා රූප සටහන් අර්ථකථනය කිරීමේ කුසලතාව සිසුන්ට ලබා දිය යුතුය.

- 29 වන ප්‍රශ්නය යොමු වී ඇත්තේ අපනයන, ස්වාධීන සංරචකයක් ලෙස හා ආනයන මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ ශ්‍රිතයක් වන බව හඳුනාගෙන තිබේද යන්න විමසීමටයි. නමුත් අපේක්ෂකයින්ගෙන් 91%කට පමණ ඒ පිළිබඳ න්‍යායික දැනුමක් නොමැති බව දී ඇති පිළිතුරු අනුව පැහැදිලි වේ. අපනයන, මූර්ත දළ දේශීය නිමැවුම මත තීරණය නොවන බවත්, ආනයන මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ ධන ශ්‍රිතයක් බවත් සිසුන්ට අවධාරණය කළ යුතුය.

- 34 වන ප්‍රශ්නය යොමු වී ඇත්තේ ශ්‍රී ලංකාවේ $M_4$ මූල්‍ය සමස්තය සමන්විත වන සංරචක පිළිබඳ දැනුම පිරික්සීම සඳහාය. නමුත් ඒ පිළිබඳ ප්‍රායෝගික දැනුමක් අයදුම්කරුවන්ට නැති බව පෙනී යයි. මක් නිසාද යත් එම ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු ලබා දී ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 26%ක් පමණ අඩු ප්‍රතිශතයක් බැවිනි. එම නිසා මුදල් සැපයුමේ $M_1$, $M_2$, $M_{2b}$, $M_4$ යන මූල්‍ය සමාහාරයන් තුළ අන්තර්ගත සංරචකයන්ගේ ප්‍රතිශතාත්මක වැදගත්කම පිළිබඳ අවබෝධය වර්ධනය කළ යුතුය.

- 45 වන ප්‍රශ්නය යොමු වී ඇත්තේ නම්‍ය විනිමය අනුපාතිකය තීරණය වන ආකාරය සහ එය වෙනස්වීම කෙරෙහි බලපාන සාධක පිළිබඳ න්‍යායාත්මක දැනුම පරීක්ෂා කිරීම සහ විනිමය අනුපාතිකය වෙනස්වන ආකාරය පිළිබඳ විශ්ලේෂණාත්මක හැකියා පරීක්ෂා කිරීමටයි. මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු ලබා දී ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 16%ක් තරම් අඩු ප්‍රතිශතයකි. එබැවින් නම්‍ය විනිමය අනුපාතිකය තීරණය වීම කෙරෙහි බලපාන සාධක, එක් එක් සාධකය වෙනස් වන විට විනිමය අනුපාතිකය වෙනස් වන ආකාරය පිළිබඳ විග්‍රහ කර ගැනීමේ දැනුම හා කුසලතා ශිෂ්‍යයාට ලබා දිය යුතුය.

- 50 වන ප්‍රශ්නය යොමු වී ඇත්තේ ගෝලීය වෙළෙඳාමේ වර්තමාන ප්‍රවණතා සහ එම ප්‍රවණතා කෙරෙහි සෘජුව බලපා ඇති කාලීන සාධක පිළිබඳ දැනුම විමසීම සඳහාය. එම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී 78%ක් පමණ ප්‍රතිශතයක් අසාර්ථක වීමෙන් පෙනී යන්නේ උක්ත මාතෘකාව පිළිබඳ දැනුම යාවත්කාලීන වී නැති බවයි. එම නිසා ඒ පිළිබඳ යාවත්කාලීන වන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය.

## 2.2. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03කි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත ය.

'අ' කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 05කි.

'ආ' කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 05කි.

අවම වශයෙන් එක් කොටසකින් ප්‍රශ්න 02 බැගින් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් මුළු ලකුණු 100කි.

අවසාන ලකුණු ගණනය කිරීම

| | | | |
|---|---|---|---|
| I පත්‍රය | සඳහා ලකුණු | = | 100 |
| II පත්‍රය | සඳහා ලකුණු | = | 100 |
| අවසාන ලකුණ = 200 ÷ 2 | | = | 100 |

## 2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

★ II පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර අංක 2, 3, 4.1 සහ 4.2 ඇසුරින් ඉදිරිපත් කර ඇත.

### "අ" කොටස

### 01 ප්‍රශ්නය

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

1. (i) නිදර්ශන යොදා ගනිමින් ආර්ථික නොවන භාණ්ඩයක් (free good) සහ ආර්ථික භාණ්ඩයක් අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
   (ii) ආවස්ථික පිරිවැය සංකල්පය පැහැදිලි කොට, ආවස්ථික පිරිවැය, හිඟකම පිළිබඳ ප්‍රශ්නයට සම්බන්ධ වන්නේ කෙසේ දැයි විස්තර කරන්න. (ලකුණු 04 යි)
   (iii) වර්තමාන පරිභෝජනය කපා හැරීමට කැමැත්තක් දක්වන රටවල ආර්ථිකයන්, වඩා වේගයෙන් වර්ධනය වන්නේ කෙසේ දැයි නිෂ්පාදන හැකියා වක්‍ර භාවිත කරමින් විස්තර කරන්න. (ලකුණු 04 යි)
   (iv) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් මත පිහිටි සියලු ම ලක්ෂ්‍යයන් ආර්ථික කාර්යක්ෂමතාව අතින් එක හා සමානත්වයක් පෙන්නුම් කරන්නේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
   (v) වෙළෙඳපොළ ආර්ථිකයන් අවශ්‍යයෙන් ම ධනේශ්වර ආර්ථිකයන් වන්නේ ද? එසේ ම විධානගත ආර්ථිකයන් අවශ්‍යයෙන් ම සමාජවාදී ආර්ථිකයන් වන්නේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(1) (i) **ආර්ථික නොවන භාණ්ඩයක්:**

- ශූන්‍ය මිලක දී අසීමිත සැපයුමක් සහිත භාණ්ඩ ආර්ථික නොවන භාණ්ඩ වේ.

(ලකුණු **01**යි)

[විකල්ප පිළිතුර:

- නිෂ්පාදනයේ දී කිසිදු ආර්ථික සම්පතක් උපයෝජනය නොවන හෙවත් ආවස්ථික පිරිවැය කින් තොරව අසීමිතව සැපයෙන භාණ්ඩ, ආර්ථික නොවන භාණ්ඩ වේ.)
- උදාහරණ: සූර්යාලෝකය, වාතය (ලකුණු **01**යි)

**ආර්ථික භාණ්ඩයක්:**

- සැපයුමෙහි හිඟකමක් දක්නට ලැබෙන භාණ්ඩ ආර්ථික භාණ්ඩ වේ.

(ලකුණු **01**යි)

[විකල්ප පිළිතුර:

- නිෂ්පාදනයේ දී ආර්ථික සම්පත් උපයෝජනය කෙරෙන හෙවත් ආවස්ථික පිරිවැයක් හට ගන්නා භාණ්ඩ වේ.)
- උදාහරණ: ආහාර, ඇඳුම්, මෝටෝ රථ, ගෘහ භාණ්ඩ (ලකුණු 01යි)

(ii) - නිෂ්පාදනය හා පරිභෝජනය පිළිබඳව තේරීම් කිරීමේ දී අවශ්‍යයෙන් ම කැපකිරීම් කිරීමට සිදුවන අතර එලෙස කැප කිරීමට සිදුවන හොඳ ම විකල්පයේ වටිනාකම ආවස්ථික පිරිවැය වේ.

(ලකුණු 01යි)

- ආවස්ථික පිරිවැය පුද්ගල බද්ධ වේ. එබැවින් තමන් විසින් කැප කරනු ලබන ඊළඟ හොඳ ම විකල්ප අවස්ථාවේ වටිනාකම ඇස්තමේන්තු කළ හැක්කේ අදාළ පුද්ගලයාට පමණි.

(ලකුණු 01යි)

- ආවස්ථික පිරිවැය, හිඟකම පිළිබඳ ප්‍රශ්නය සමඟ අවශ්‍යයෙන් ම බැඳී පවතී. ආවස්ථික පිරිවැය හට ගන්නේ සම්පත් හිඟය සහ හිඟ සම්පත්වල විකල්ප භාවිත පැවතීම කරන කොට ගෙනය. හිඟකම යනු අසීමිත මිනිස් වුවමනා සපුරා ගැනීම සඳහා සමාජය සතු සම්පත් සම්භාරය ප්‍රමාණවත් නො වීමය. වුවමනා සියල්ල ම පවත්නා සීමිත සම්පත්වලින් සපුරාගත නොහැකි බැවින් අවශ්‍යයෙන් ම විකල්ප අතර තේරීමක් කිරීමට සිදු වේ.

(ලකුණු 01යි)


- මෙලෙස තේරීම් කරන විට කැප කිරීම් ද අවශ්‍යයෙන් ම හට ගනී. හිඟකම පිළිබඳ ගැටලුව හමුවේ නිෂ්පාදනය හා පරිභෝජනයට අදාළ තේරීම් කිරීමේ දී කැප කිරීම් කිරීමට සිදුවන හොඳ ම විකල්පයේ වටිනාකම ආවස්ථික පිරිවැය වේ.

(ලකුණු 01යි)


(iii)- කිසියම් ආර්ථිකයක් විසින් වර්තමාන ප්‍රාග්ධන සම්පාදනය වෙනුවෙන් කැප කරනු ලබන වර්තමාන පරිභෝජනයේ ප්‍රමාණය මත එම ආර්ථිකයේ අනාගත වෘද්ධි ශීඝ්‍රතාව තීරණය වේ.

- වර්තමානයේ දී ආර්ථිකයේ සම්පත් සාපේක්ෂව වැඩි ප්‍රමාණයක් ප්‍රග්ධන භාණ්ඩ නිෂ්පාදනය සඳහා උපයෝජනය කෙරේ නම්, ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාව ප්‍රසාරණය වී අනාගත විභව නිමැවුම විශාල වර්ධනයක් පෙන්නුම් කරනු ඇත. එරටෙහි අනාගත නිෂ්පාදන හැකියා වක්‍රය විශාල වශයෙන් දකුණට විතැන් වනු ඇත.

- අනික් අතට, වර්තමානයේ දී ප්‍රාග්ධන සම්පාදනය සඳහා වැඩි වශයෙන් සම්පත් උපයෝජනය නොකොට, වර්තමාන පරිභෝජනය සඳහා සම්පත් විශාල වශයෙන් යොදාගනු ලැබුවහොත්, එම ආර්ථිකයේ අනාගත නිෂ්පාදන හැකියාවේ වර්ධනය ඉතා සීමාසහිත වනු ඇත. අනාගත නිෂ්පාදන හැකියා වක්‍රය දකුණට විතැන් වුවහොත් විතැන් වනුයේ ඉතා මඳ වශයෙනි.





(අ) වර්තමාන පරිභෝජනය සඳහා සාපේක්ෂ වශයෙන් අඩු සම්පත් ප්‍රමාණයක් යොමු කරන ආර්ථිකයක්




(අ) වර්තමාන පරිභෝජනය සඳහා සාපේක්ෂ වශයෙන් විශාල සම්පත් ප්‍රමාණයක් වැය කරන ආර්ථිකයක්

විකල්ප ප්‍රස්තාර සටහනක්:




**(නිවැරදි පැහැදිළි කිරීම සඳහා ලකුණු 02යි. නිවැරදි ප්‍රස්තාර සටහන/ සටහන් සඳහා ලකුණු 02යි)**

(iv) - ආර්ථික කාර්යක්ෂමතාව යන්නෙන් අදහස් වන්නේ ආර්ථිකය සතු සම්පත් පුරවැසියන්ගේ වුවමනා සපුරාලීම පිණිස කාර්යක්ෂමව උපයෝජනය කිරීමය.

- ආර්ථික කාර්යක්ෂමතාව සඳහා, කාර්යක්ෂමතා දෙකක් එක්වර සාක්ෂාත් කර ගැනීම අවශ්‍ය වේ. එම කාර්යක්ෂමතාව වනුයේ නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව සහ සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාවය යි.

- නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් මත පිහිටි සියලු ම ලක්ෂ්‍යයන් නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව පෙන්නුම් කරනු ලැබුව ද, සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව පෙන්නුම් කරනුයේ එම ලක්ෂ්‍ය අතුරෙන් එක් සුවිශේෂ ලක්ෂ්‍යයක් පමණි.

- එම සුවිශේෂී ලක්ෂ්‍යය තීරණය වනුයේ නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ හා සේවා පිළිබඳ සමාජයීය වරණ හා ඇගයීම මත ය. සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව පෙන්නුම් කරන භාණ්ඩ සංයෝගය තෝරාගත යුත්තේ අදාළ භාණ්ඩ මිශ්‍රණයේ ආන්තික ප්‍රතිලාභ සහ ආන්තික පිරිවැය සසඳා බලා ඒවා එකිනෙකට සමාන වන භාණ්ඩ සංයෝජනය මතය. එබැවින් ආර්ථික කාර්යක්ෂමතාව තීරණය කිරීම සඳහා නිෂ්පාදන හැකියා වක්‍රයේ දැක්වෙන තොරතුරුවලට අතිරේකව සමාජ වරණය පිළිබඳ තොරතුරු ද, සම්බන්ධ කර ගත යුතුවේ.

**(ලකුණු 04යි)**


(v) - වෙළෙඳපොළ ආර්ථිකයක් අවශ්‍යයෙන් ම ධනේශ්වර ආර්ථිකයක් නොවන අතර සමාජවාදී ආර්ථිකයක් ද අවශ්‍යයෙන් ම විධානගත ආර්ථිකයක් නො වේ. මක් නිසා ද යත්, ආර්ථික පද්ධති ධනේශ්වර හා සමාජවාදී වශයෙන් බෙදනු ලබන්නේ නිෂ්පාදන සම්පත්වල හිමිකාරිත්වය නැමැති නිර්ණායකය පදනම් කරගෙන ය. සියලු ම නිෂ්පාදන සම්පත් පෞද්ගලික හිමිකාරිත්වය යටතේ පවතින ආර්ථික පද්ධති, ධනේශ්වර ආර්ථික පද්ධති ලෙසත් සියලු ම නිෂ්පාදන සම්පත් රාජ්‍ය හිමිකාරිත්වය යටතේ පවතින ආර්ථික පද්ධති, සමාජවාදී ආර්ථික පද්ධති ලෙසත් වර්ග කෙරේ.

- අනිත් අතට වෙළෙඳපොළ ආර්ථික පද්ධති සහ විධානගත ආර්ථික පද්ධති වශයෙන් කරනු ලබන බෙදීම, මූලික වශයෙන් පදනම් කරගනු ලබන්නේ සම්පත් බෙදා වෙන් කිරීමේ යාන්ත්‍රණය මතය. සම්පත් බෙදා වෙන් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් මිල යාන්ත්‍රණය උපයෝගී කරගනු ලබන ආර්ථික පද්ධති වෙළෙඳපොළ ආර්ථික පද්ධති වශයෙනුත් විධාන (මධ්‍යගත සැළසුම්) උපයෝගි කරගනු ලබන ආර්ථික පද්ධති විධානගත ආර්ථික පද්ධති වශයෙනුත් වර්ග කෙරේ.

- එසේම බොහෝ ධනේෂ්වර ආර්ථික ක්‍රම, මිල යාන්ත්‍රණය පදනම් කරගත් වෙළෙඳපොළ ආර්ථික වශයෙනුත්, බොහෝ සමාජවාදී ආර්ථික ක්‍රම මධ්‍යගත සැලසුම් පදනම් කරගත් විධානගත සමාජවාදී ආර්ථික වශයෙනුත් ක්‍රියාත්මක වන බව දැකිය හැකි වුව ද, හැම විට ම එසේ සිදු නොවන බව ද සැළකිය යුතුය. සම්පත් හිමිකාරිත්වය හා සම්පත් බෙදා වෙන් කිරීමේ යාන්ත්‍රණය යන නිර්ණායකයන්ගේ විවිධ මිශ්‍රණ සහිත මිශ්‍ර ආර්ථික පද්ධති සැබෑ ලොව සුලභ වශයෙන් දැකිය හැකිය. ඒ අනුව සමාජවාදී වෙළෙඳපොළ ආර්ථික පද්ධති සහ වෙළෙඳපොළ ධනේෂ්වර ආර්ථික පද්ධති දැකිය හැකිය. පිරිසිදු ධනේෂ්වර විධානගත ආර්ථිකයක් හෝ පිරිසිදු සමාජවාදී විධානගත ආර්ථිකයක් ලෝකයේ කිසිදු රටක දැකිය නොහැකිය.


**(ලකුණු 4යි)**

**01 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




01 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 97%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 18%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 41%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 29%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 12%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයට කොටස් 05ක් ඇත. පහසුතාව අඩු ම කොටස (v) වී ඇති අතර, එහි පහසුතාව 25%කි. එමෙන්ම (i) කොටස පහසු ම කොටස වී ඇති අතර එහි පහසුතාව 86%කි.

- i වන කොටසෙහි පහසුතාව 86% කි. ආර්ථික භාණ්ඩයක් සහ ආර්ථික නොවන භාණ්ඩයක් අතර වෙනස සැසඳීම සඳහා මෙම ප්‍රශ්නය යොමු වී ඇති අතර, සිසුන් වැඩි දෙනෙකු නිවැරදි පිළිතුරු සපයා තිබීමෙන් පෙනී යන්නේ උක්ත සංකල්ප පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ශිෂ්‍යයින් තුළ ඇති බවයි.

- ii වන කොටසෙහි පහසුතාව 69% කි. ආවස්ථික පිරිවැය යන සංකල්පය පැහැදිලි කොට එය හිඟකම පිළිබඳ ප්‍රශ්නය හා සම්බන්ධ වන්නේ කෙසේ දැයි විග්‍රහ කිරීමේ හැකියාව විමසීමට යොමු වූ ප්‍රශ්නයකි. ආවස්ථික පිරිවැය සංකල්පය විග්‍රහ කිරීමට අපේක්ෂකයින් වැඩි දෙනෙකු තුළ දැනුම ඇති නමුත්, ආවස්ථික පිරිවැය, හිඟකම හා සම්බන්ධ වන ආකාරය පැහැදිලි කිරීමේ හැකියාව නොමැතිකම හේතුවෙන් පහසුතාව 69% දක්වා අඩු වී ඇත. ආවස්ථික පිරිවැය නිර්වචනය කිරීම මෙන්ම එහි සුවිශේෂතා දැක්වීම සමඟ ආවස්ථික පිරිවැය හට ගන්නේ සම්පත් හිඟකම හා එහි විකල්ප භාවිත අතර තේරීම් කරන විට බව අවධාරණය කළ යුතුය.

  හිඟකම නිසා අසීමිත වුවමනා සියල්ල ම ඉටුකර ගත නො හැකි බවත්, එනිසා ම විකල්ප අතර තේරීම් කිරීමට සිදුවන බවත්, එවිට ආවස්ථික පිරිවැයක් හට ගන්නා බවත් පිළිතුරෙහි අවශ්‍යයෙන් ම ඇතුළත් විය යුතු ය.

- iii වන කොටසෙහි පහසුතාව 39% කි. පරිභෝජනය හා ආයෝජනය අතර තේරීම් කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස අනාගත ආර්ථික වෘද්ධි වේගය තීරණය වන බව නිෂ්පාදන හැකියා මායිමක් ඇසුරින් පැහැදිලි කිරීමට මෙම කොටස යොමු වී ඇත. මෙම කොටසට පිළිතුරු සැපයූ අපේක්ෂකයින් 61% ක පමණ දුෂ්කරතාවක් පෙන්නුම් කිරීමෙන් තහවුරු වන්නේ පරිභෝජනය හා ආයෝජනය අතර තේරීම් කිරීමේ ක්‍රියාවලිය මත අනාගත ආර්ථික වෘද්ධි වේගය තීරණය වන ආකාරය පිළිබඳ නිවැරදි අවබෝධයක් හා එය නිෂ්පාදන හැකියා මායිමක් මගින් ඉදිරිපත් කිරීමේ කුසලතාව ශිෂ්‍යයාට ලබා දිය යුතු බවයි.

  නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර ඇඳීමේ දී ප්‍රාග්ධන භාණ්ඩ හා පරිභෝජන භාණ්ඩ වශයෙන් අක්ෂ නම් නොකර X හා Y ලෙස අක්ෂ නම් කර තිබීම නිසා ලකුණු අහිමි වී ඇත. එබැවින් මෙම පිළිතුරේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර නිර්මාණයේ දී එක් අක්ෂයක් ප්‍රාග්ධන භාණ්ඩ ලෙසත් අනෙක් අක්ෂය පරිභෝජන භාණ්ඩ ලෙසත් නම් කළ යුතුය යන්න පිළිබඳව ශිෂ්‍යයින් දැනුවත් කළ යුතුය.

- iv කොටස මගින් විමසා ඇත්තේ ආර්ථික කාර්යක්ෂමතාව, එය තීරණය කරන සාධක හා එය නිෂ්පාදන හැකියා මායිම මත පිහිටි එක් ලක්ෂ්‍යයකින් පමණක් නිරූපණය කළ හැකි බව පිළිබඳ ශිෂ්‍යයින් තුළ ඇති දැනුම විමසීම කෙරෙහිය. නමුත් සිසුන් කෙරෙහි මෙම ගැටලුවේ දුෂ්කරතාව 65% ක් වීමෙන් පෙනී යන්නේ උක්ත ඉගෙනුම් ඵලය පිළිබඳ දැනුම ප්‍රමාණවත් නො වන බවයි. එහෙයින් ආර්ථික කාර්යක්ෂමතාව, හා එහි ප්‍රධාන කොන්දේසි දෙක විග්‍රහ කිරීමත්, එය නිෂ්පාදන හැකියා මායිමක් මගින් ඉදිරිපත් කිරීමේ නිවැරදි අවබෝධයත් සිසුන් තුළ තහවුරු කළ යුතුය.

  ආර්ථික කාර්යක්ෂමතාව අර්ථ දක්වන්නේ සමාජයේ මිනිසුන්ගේ වුවමනා සපුරා ලීමට සමාජය සතු සම්පත් කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමක් වශයෙනි. මේ සඳහා නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව හා සම්පත් බෙදී යාමේ කාර්යක්ෂමතාව යන කොන්දේසි දෙක ම එකවර ඉටු විය යුතුය. සම්පත් බෙදී යාමේ කාර්යක්ෂමතාවයේ දී සමාජ වරණය දක්වන භාණ්ඩ සංයෝග පවතින්නේ එකක් පමණි. P= mc වන එම සංයෝගය ආන්තික ප්‍රතිලාභ හා පිරිවැය විශ්ලේෂණය මත තීරණය කරන ආකාරය පිළිබඳ දැනුම ශිෂ්‍යයාට ලබා දිය යුතුය.

- v කොටස පළමුවන ප්‍රශ්නයේ පහසුතාව අඩු ම කොටසයි. මෙම කොටසෙන් විමසා ඇත්තේ වෙළෙඳපොළ ආර්ථික හා විධානගත ආර්ථික සමඟ ධනේශ්වර හා සමාජවාදී ආර්ථික ස්වරූප සංකලනය වන ආකාරයයි. සිසුන් බොහොමයක් විවිධ නිර්ණායක ඔස්සේ ආර්ථික පද්ධති වර්ග කිරීමේ න්‍යායාත්මක දැනුම ප්‍රදර්ශනය කළත්, සැබෑ ලෝකයේ ආර්ථික ක්‍රම ප්‍රායෝගිකව වර්ග කිරීමේදී ඉහත නිර්ණායකයන්ගේ සම්මිශ්‍රණය හඳුනා ගැනීමට අසමත් වී ඇත. එබැවින් ආර්ථික ක්‍රම වර්ග කිරීමේ න්‍යායාත්මක අවබෝධය මෙන්ම, ප්‍රායෝගිකව ආර්ථික ක්‍රම වර්ග කර ඇති ආකාරය පිළිබඳ දැනුම ද, සිසුන් තුළ වර්ධනය කළ යුතුය.

  ආර්ථික පද්ධති වර්ගීකරණය කිරීමේ මූලික නිර්ණායකයන්, ලෙස දේපළ හිමිකම අනුව වර්ගීකරණය කර ගැනීම සහ සම්පත් බෙදා වෙන් කිරීමේ යාන්ත්‍රණය මත ආර්ථික පද්ධති වර්ගීකරණය කිරීම පිළිබඳ ශිෂ්‍යයා දැනුවත් විය යුතුය. වෙළෙඳපොළ ආර්ථික හා මධ්‍යගතව සැළසුම් කළ ආර්ථික පද්ධති වර්ගීකරණය කිරීමේ දී, වෙළෙඳපොළ ආර්ථිකයක පෞද්ගලික දේපොළ හිමිකම් පැවතීම සාමාන්‍ය ලක්ෂණයක් වුව ද, එය අත්‍යවශ්‍ය ම සාධකයක් නො වේ. එසේම මධ්‍යගතව සැළසුම් කළ ආර්ථික පද්ධතිය යන්න අර්ථ කථනය කර ගත යුත්තේ සම්පත් වෙන් කිරීමේ යාන්ත්‍රණය මතය. සාමාන්‍යයෙන් ආර්ථිකයක් මධ්‍ය සැලසුම් ආර්ථිකයක් ලෙස ක්‍රියාත්මක වන විට දේපල හිමිකාරීත්වය රජය යටතේ තබා ගනී. නමුත් එය ද අවශ්‍ය ම සාධකයක් නො වේ.

## 02 ප්‍රශ්නය

**2.** (i) වෙළෙඳපොළ සැපයුම් වක්‍රයක් ඇඳීමේ දී ස්ථාවරව පවතිතැයි සලකනු ලබන සාධක කවරේ ද? (ලකුණු 04 යි)

(ii) ආදායම් හා ආදේශන ප්‍රතිවිපාක විසින් 'ඉල්ලුම් නීතිය' පැහැදිලි කරනු ලබන්නේ කෙසේ දැයි විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) අවම මිලක් සහ උපරිම මිලක් අතර වෙනස උදාහරණය බැගින් දක්වමින් පෙන්වා දෙන්න. (ලකුණු 04 යි)

(iv) සැපයුමේ අනම්‍යතාවක් පවතින භාණ්ඩයක නිෂ්පාදකයන් මත විශේෂිත (ඒකක) බද්දක් පනවනු ලැබුවහොත්, බදු බරින් වැඩි කොටසක් දරනු ලබන්නේ කවුරුන් විසින් ද? යෝග්‍ය ප්‍රස්තාර සටහනක් යොදා ගනිමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) කිසියම් භාණ්ඩයක් සඳහා පවත්නා වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිතවලට අදාළ සමීකරණ පහත දැක්වේ.

$Q_d = 100 - 4P$ (ඉල්ලුම) $Q_s = -30 + 6P$ (සැපයුම)

(අ) සමීකරණ යොදා ගනිමින් සමතුලිත මිල සහ ප්‍රමාණය ගණනය කොට, එම සමතුලිතය ප්‍රස්තාර සටහනක නිවැරදිව පෙන්නුම් කරන්න. (ලකුණු 02 යි)

(ආ) වෙළෙඳපොළ සමතුලිත අවස්ථාවේ දී නිෂ්පාදක අතිරික්තය හා පාරිභෝගික අතිරික්තය ගණනය කොට, ප්‍රස්තාර සටහනක ඒවා පෙන්නුම් කරන්න. (ලකුණු 02 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

2 (i) - යෙදවුම්වල මිල
- සම්බන්ධිත භාණ්ඩවල මිල
- තාක්ෂණය
- අපේක්ෂිත අනාගත මිල
- රාජ්‍ය ප්‍රතිපත්තිඃ බදු සහ සහනාධාර
- සැපයුම්කරුවන් සංඛ්‍යාව

**(එක් කරුණකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 04; මිල හැර අනෙකුත් කරුණු ලෙස සඳහන් කර තිබුණොත් ලකුණු 01 ක් පමණි.)**

(ii) - ආදායම් ප්‍රතිවිපාකය පෙන්නුම් කරනුයේ අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී, භාණ්ඩයේ මිල වෙනස් වීමක් නිසා හට ගන්නා මූර්ත ආදායම වෙනස්වීම මත, ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වෙනස්වන ආකාරය යි. අනිකුත් කරුණු නොවෙනස්ව තිබිය දී, සළකා බලන භාණ්ඩයේ මිල ඉහළ ගිය විට, පාරිභෝගිකයාගේ මූර්ත ආදායම අඩුවන බැවින්, සළකා බලන භාණ්ඩය සාමාන්‍ය භාණ්ඩයක් වේ නම්, එම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම ද, ඉහළ යනු ඇත. මේ අනුව ආදායම් ප්‍රතිවිපාකය ඉල්ලුම් නීතිය තහවුරු කරයි.

(ලකුණු 02යි)

- ආදේශන ප්‍රතිවිපාකය පෙන්නුම් කරනුයේ අනිකුත් කරුණු නො වෙනස්ව තිබිය දී, සාපේක්ෂ මිල වෙනස් වීමක් නිසා ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ හට ගන්නා වෙනස් වීම යි. ඉල්ලුම කෙරෙහි බලපාන අනිකුත් කරුණු නොවෙනස්ව තිබිය දී, සලකා බලන භාණ්ඩයේ මිල වැඩි වුවහොත් සාපේක්ෂ මිල ඉහළ යාමක් සිදු වේ. එවිට සාපේක්ෂව මිල වැඩි භාණ්ඩයට ඇති ඉල්ලුම අඩු කොට, සාපේක්ෂව මිල අඩු භාණ්ඩ මිල දී ගනී. එසේම අනිකුත් කරුණු නොවෙනස්ව තිබිය දී, සලකා බලන භාණ්ඩයේ මිල පහළ වැටුනහොත් සාපේක්ෂව එම භාණ්ඩය ලාභ වේ. එබැවින් සාපේක්ෂව මිල අඩු භාණ්ඩය වැඩිපුර මිල දී ගනී. මේ අනුව ආදේශන ප්‍රතිවිපාකය අනුව ද ඉල්ලුම් නීතියෙන් පෙන්නුම් කරන මිල හා ඉල්ලුම් ප්‍රමාණය අතර ඇති ප්‍රතිලෝම සම්බන්ධය තහවුරු වේ.

**(ලකුණු 02යි)**

(iii)- ඇතැම් භාණ්ඩ හා සේවා සඳහා වෙළෙඳපොළෙහි පවත්නා මිල නිෂ්පාදකයන්ට හා සැපයුම්කරුවන්ට අවාසිදායක හා අසාධාරණ යැයි පෙනීයන අවස්ථාවලදී, ඔවුනට සහනයක් ලබා දෙනු පිණිස, රජය විසින් අවම මිලක් නීත්‍යානුකූලව නියම කිරීම අවම මිල වශයෙන් හඳුන්වනු ලැබේ.

(ලකුණු 01යි)

- උදාහරණ: අවම වැටුප් නියම කිරීම;
  කෘෂිකර්ම බෝග සඳහා සහතික මිල නියම කිරීම

**(ලකුණු 01යි)**

- ඇතැම් භාණ්ඩ හා සේවා සඳහා වෙළෙඳපොළෙහි පවත්නා මිල ගැනුම්කරුවන්ට අවාසිදායක සහ අසාධාරණයැයි පෙනී යන අවස්ථාවලදී, රජය විසින් උපරිම මිලක් නීත්‍යානුකූලව නියම කිරීම උපරිම මිල වශයෙන් හඳුන්වනු ලැබේ.

**(ලකුණු 01යි)**


- උදාහරණ: අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා උපරිම මිල නියම කිරීම. (සහල්, පාන්, කිරි පිටි, LP ගෑස් යනාදිය)
  මගී බස් ප්‍රවාහන ගාස්තු නියම කිරීම.
  උපරිම පොලී අනුපාතික නියම කිරීම.
  උපරිම ගෙවල් කුලී නියම කිරීම.

**(ලකුණු 01යි)**

(iv) - සැපයුමේ අනම්‍යතාවක් පවතින භාණ්ඩයක් මත විශේෂිත (ඒකක) බද්දක් පනවනු ලැබුවහොත් බදු බරින් වැඩි කොටසක් දරනු ලබන්නේ සැපයුම්කරුවා විසින් වන අතර, ගැනුම්කරුවා විසින් උසුලනු ලබන බදු බරෙහි ප්‍රමාණය සාපේක්ෂ වශයෙන් කුඩා වේ.

**(ලකුණු 02යි)**

- ප්‍රස්තාර සටහන:




**(ලකුණු 02යි)**


(v) (අ)

| | | |
|---|---|---|
| Qd | = | QS |
| 100 - 4 P | = | -30 + 6P |
| 100 + 30 | = | 4P+6P |
| 130 | = | 10P |
| 13 | = | P |

| | | | | | |
|---|---|---|---|---|---|
| Qd | = | 100 - 4P | Qs | = | -30 - 6P |
| | = | 100 - 4(13) | | = | -30 + 6 (13) |
| | = | 100 - 52 | | = | -30 + 78 |
| | = | 48 | | = | 48 |

**(ලකුණු 02යි)**

සමතුලිත ප්‍රස්තාරයක පෙන්වීම




(ලකුණු 02යි)

(ආ) නිෂ්පාදක අතිරික්තය $= \dfrac{(\text{සමතුලිත මිල - අවම සැපයුම් මිල}) \times \text{සමතුලිත ප්‍රමාණය}}{2}$

$$= \frac{(13 - 5) \times 48}{2} \quad = \quad \frac{384}{2} \quad = \quad \underline{\underline{192}}$$


පාරිභෝගික අතිරික්තය $= \dfrac{(\text{උපරිම ඉල්ලුම් මිල - සමතුලිත මිල}) \times \text{සමතුලිත ප්‍රමාණය}}{2}$

$$= \frac{(25 - 13) \times 48}{2} \quad = \frac{576}{2} \quad = \underline{\underline{288}}$$

**නිෂ්පාදක අතිරික්තය හා පාරිභෝගික අතිරික්තය දැක්වෙන නිවැරදි ප්‍රස්තාරයට ලකුණු 01යි;**


**ගණනය කිරීමට ලකුණු 01යි**

**02 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




02 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 92.76%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 28%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 27%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 26%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 19%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නය කොටස් 5 කින් සමන්විත වන අතර ඉන් පහසුතාව වැඩිම කොටස v (අ) වේ. එහි පහසුතාව 77%කි. v (ආ) කොටසේ පහසුතාව 63%කි.

- i කොටසේ පහසුතාව 57%කි. වෙළෙඳපොළ සැපයුම් වක්‍රය ඇඳීමේදී වෙනස්වන සාධක හා ස්ථාවර සාධක පිළිබඳව මෙම ගැටලුව යොමු වී ඇති අතර අපේක්ෂකයන් අතරින් සැළකිය යුතු ප්‍රතිශතයක් අදාළ මාතෘකාව පිළිබඳ නිවැරදි දැනුමක් ලබා නොමැත. සැපයුම වෙනස්වීම කෙරෙහි බලපාන සාධක අතර සළකා බලන භාණ්ඩයේ මිල වෙනස්වීම අදාළ නොවිය යුතු බව සනාථ කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කර ගන්න. ඉල්ලුම් හා සැපයුම් වක්‍ර ඇඳීමේ දී මිල හැර අන් සාධක ස්ථාවරව පවතින බවට උපකල්පනය කළ යුතු බව අවධාරණය කර ගන්න.

- ii කොටසේ පහසුතාව 43%කි. ඉල්ලුම් නීතියට හේතු විමසන මෙම ප්‍රශ්නය අපේක්ෂකයින් වැඩි දෙනෙකු අවබෝධ කරගෙන නොතිබුණි. ඉල්ලුම් නීතියට බලපාන හේතු, ඉල්ලුම් තීරක ලෙස අපේක්ෂකයින් වැඩි දෙනෙකු වැරදි ලෙස අවබෝධ කරගෙන තිබීම දුෂ්කරතාව ඉහළ යාමට හේතු වී ඇත. එම නිසා මිල වෙනස්වීමක ආදායම් ප්‍රතිවිපාකය හා ආදේශන ප්‍රතිවිපාකය පැහැදිලි වන සේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සුදුසුය.

- iii කොටස අවම මිල හා උපරිම මිල අතර වෙනස නිදසුන් දක්වමින් පැහැදිලි කිරීම වෙත යොමු වී ඇති අතර ගැටලුවට අයදුම්කරුවන් දැක්වූ පහසුතාව 45%කි. අවම මිලත්, උපරිම මිලත් අතර වෙනස නිර්වචනය කිරීමට සිසුන් සමත් වුව ද ප්‍රායෝගික උදාහරණ දැක්වීමට අපොහොසත් වීම ගැටලුවේ දුෂ්කරතාවට හේතුව බව පෙනේ. අවම මිල සමතුලිත මිලට ඉහළ මිලක් ලෙසත්, උපරිම මිල සමතුලිත මිලට පහළ මිලක් ලෙසත් එවැනි තත්ත්වයන්ට ප්‍රායෝගික උදාහරණ දැක්වීමේ හැකියාව වර්ධනය වන ලෙසත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම අවශ්‍යය.

- iv කොටසේ පහසුතාව 44%කි. සැපයුම් නම්‍යතාව මත බදු බර නිෂ්පාදකයින් හා ගැනුම්කරුවන් අතර බෙදී යන්නේ කෙසේද යන්න ගැටලුවෙන් විමසා ඇති අතර වැඩි දෙනෙකු ඒ පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබා නොතිබුණි. ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාවේ විවිධ අවස්ථා නිවැරදි ව ප්‍රස්තාර ගත කිරීමටත් ඒ අනුව බදු බර පාරිභෝගිකයින් හා නිෂ්පාදකයින් අතර බෙදී යන ආකාරය නිවැරදිව විග්‍රහ කර ගැනීමටත් සිසුන් තුළ කුසලතා වර්ධනය කළ යුතුය.

- v (අ) කොටසේ පහසුතාව 77%කි. බොහෝ සිසුන් සමීකරණ විසඳීම මඟින් සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කිරීමේ කුසලතාව පෙන්නුම් කොට තිබුණි. නමුත් ඉල්ලුම් හා සැපයුම් සමීකරණ අන්තඃඛණ්ඩ සහිතව නිවැරදිව ප්‍රස්තාරිකව නිරූපණය කිරීමේ කුසලතාව සිසුන් තුළ ඇති කළ යුතුය.

  (ආ) කොටසේ පහසුතාව 63%කි. ඉල්ලුම් සැපයුම් සමීකරණ භාවිතයෙන් පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්ත ගණනය කිරීමටත් එම අතිරික්තයන් ප්‍රස්තාරිකව ඉදිරිපත් කිරීමටත් සිසුන්ගේ කුසලතාව විමසූ මෙම උප කොටසෙහි දුෂ්කරතාවට හේතු වී ඇත්තේ ප්‍රස්තාරය ඇසුරෙන් නිෂ්පාදක හා පාරිභෝගික අතිරික්ත ගණනය කිරීමට නොහැකි වීම නිසයි. ඒ අතිරික්ත දැක්වෙන ප්‍රදේශ නිවැරදිව හඳුනාගෙන වර්ග ප්‍රමාණය ගණනය කිරීමට නොහැකි වීමයි. නිෂ්පාදන හා පාරිභෝගික අතිරික්ත හඳුනා ගැනීමටත්, ඒවා ගණනය කර ගැනීමටත් ශිෂ්‍යයා තුළ හැකියා දියුණුවන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය.

## 03 ප්‍රශ්නය

**3.** (i) සෘජු පිරිවැය සහ ආරෝපිත (වක්‍ර) පිරිවැය අතර වෙනස එක එකක් සඳහා උදාහරණය බැගින් දක්වමින් පෙන්වා දෙන්න. (ලකුණු 04 යි)

(ii) ආර්ථික විද්‍යාඥයින් විසින් ප්‍රාමාණික ලාභය පිරිවැයක් ලෙස සලකනු ලබන්නේ ඇයි? (ලකුණු 04 යි)

(iii) වෙළෙඳපොළ ව්‍යුහයන්ගේ ස්වරූප **හතර** නම් කරන්න. (ලකුණු 04 යි)

(iv) ලාභ උපරිමනය කිරීමේ නීතිය යනු කවරක් ද? මිලගනුවෙක් වශයෙන් ක්‍රියා කරන නිෂ්පාදන ආයතනයක් සම්බන්ධයෙන් එම නීතිය ප්‍රකාශ කළ හැක්කේ කෙසේ ද? (ලකුණු 04 යි)

(v) යම් දෙන ලද කෙටි කාලයක දී මිලගනුවෙකු වශයෙන් ක්‍රියා කරන නිෂ්පාදන ආයතනයක්, නිමැවුම් ඒකක 20ක් නිෂ්පාදනය කරනු ලැබේ යැයි සලකන්න. නිමැවුම් ඒකකයක වෙළෙඳපොළ මිල රු. 50ක් වන අතර නිමැවුම් ඒකක 20ක දී ආයතනයේ සාමාන්‍ය මුළු පිරිවැය රු. 60ක් ද, සාමාන්‍ය විචල්‍ය පිරිවැය රු. 40ක් ද වේ.

(අ) මෙම කෙටි කාල පරිච්ඡේදය තුළ ආයතනයේ ලාභය හෝ අලාභය කොපමණ වේ ද? (ලකුණු 02 යි)

(ආ) ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය කොපමණ ද? (ලකුණු 02 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(3) (i) - නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ආයතනය විසින් පිටතින් මිල දී ගත් යෙදවුම් සඳහා වැය කරන මුදල් ප්‍රමාණය සෘජු පිරිවැය වේ. **(ලකුණු 01යි)**

(විකල්ප පිළිතුරක් : සෘජු පිරිවැය යනු ආයතනය විසින් පිටතින් ලබා ගත් නිෂ්පාදන සම්පත්වල ආවස්ථික පිරිවැය වේ.)

- උදාහරණ : පිටතින් ලබාගත් ශ්‍රමය සඳහා කරනු ලබන වැටුප් ගෙවීම්;
පිටතින් මිල දී ගත් අමු ද්‍රව්‍ය, විදුලිය, ජලය, ඉන්ධන වැනි යෙදවුම් සඳහා කරනු ලබන ගෙවීම්. **(ලකුණු 01යි)**

- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගැනෙන ආයතන සතු නිෂ්පාදන සම්පත්වල ආවස්ථික පිරිවැය ආරෝපිත (වක්‍ර) පිරිවැය වේ. **(ලකුණු 01යි)**

- උදාහරණ: කිසියම් නිෂ්පාදන ආයතනයක් තමන්ගේ අරමුදල් ආයතනයේ නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගැනීම නිසා එම අරමුදල් හොඳ ම විකල්ප භාවිතයකට යොමු කොට උපයාගත හැකිව තිබූ පොලී ආදායම අහිමි වීම ආරෝපිත පිරිවැයකි;

- ආයතනය තමන් සතු භූමිය හා ගොඩනැගිලි නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා කැප කිරීම නිසා අහිමිවන බදු කුලී ආදායම්;

- ප්‍රාමාණික ලාභය. **(ලකුණු 01යි)**

(ii) - කිසියම් ව්‍යවසායකයෙකු පවත්නා නිෂ්පාදන ක්‍රියාවලියෙහි රඳවා තබා ගැනීම සඳහා එම ව්‍යවසායකයා අපේක්ෂා කරන අවම ගෙවීම ප්‍රාමාණික ලාභය ලෙස හැඳින්වේ. **(ලකුණු 02යි)**

- ව්‍යවසායකයෙකු ප්‍රාග්ධනය ඇතුළු විවිධ නිෂ්පාදන සම්පත් සංචල කරමින්, අවදානමක් දරමින් නිෂ්පාදන කාර්යයෙහි නියැලීමේ දී, එම ප්‍රයත්නයට සරිලන අවම ගෙවීමක් ඔහු අපේක්ෂා කරයි. පවත්නා නිෂ්පාදන ක්‍රියාවලිය තුළ එම අවම ගෙවීමවත් ඔහුට උපයාගත නොහැකි වේ නම්, ඔහු තම ව්‍යවසායකත්වය එම ව්‍යාපාරයෙන් ඉවත් කර ගනී. එබැවින් ව්‍යවසායක කාර්යභාරයන් ඉටු කිරීම වෙනුවෙන් ලැබිය යුතු ගෙවීමක් වන නිසා, ප්‍රාමාණික ලාභය ආරෝපිත පිරිවැයකි. **(ලකුණු 02යි)**

(iii) - පූර්ණ තරගය - ඒකාධිකාරී තරගය
- කතිපයාධිකාරය - ඒකාධිකාරය

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)**

(iv) - ලාභය යන්නෙන් අදහස් කරන්නේ නිෂ්පාදන ආයතනයක මුළු පිරිවැය (TC) ඉක්මවා ඇති මුළු අයභාරය (TR) ප්‍රමාණයයි. කිසියම් නිමැවුම් මට්ටමක දී ආන්තික අයභාරය (MR) එහි ආන්තික පිරිවැයට (MC) හරියට ම සමාන වුවහොත්, ඉන් අදහස් වන්නේ එම නිමැවුම් මට්ටම ලාභ උපරිම කරන නිමැවුම් මට්ටමක් බවය. මේ අනුව ලාභ උපරිමනය කිරීමේ නීතිය ලෙස හඳුන්වනුයේ MR = MC කොන්දේසිය යි. නිමැවුම එම ලක්ෂ්‍යය කරා ළඟා වූ විට, ලාභයට තව දුරටත් එකතු වීමක් හෝ ලාභයෙන් කිසිවක් අඩු වීමක් හෝ සිදු නො වේ.

**(ලකුණු 02යි)**

\- මිල ගනුවෙකු වශයෙන් කටයුතු කරන නිෂ්පාදන ආයතනයක ආන්තික අයභාරය (MR) මිලට (P) සමාන වන බැවින්, එබඳු නිෂ්පාදන ආයතනයක් සම්බන්ධයෙන් ලාභ උපරිමනය කිරීමේ නීතිය P = MC ලෙස දැක්විය හැකිය. මෙය අනිකුත් වෙළෙඳපොළ තත්ත්වයන්ට අදාළ නොවන පූර්ණ තරගකාරී හෙවත් මිල ගනුවෙකු වශයෙන් කටයුතු කරන නිෂ්පාදන ආයතනයකට පමණක් විශේෂිත වූ කොන්දේසියක් ලෙස දැක්වේ.

**(ලකුණු 02යි)**

(v) (අ) ආයතනයේ ලාභය හෝ අලාභය:

ලාභය හෝ අලාභය = මුළු අයභාරය (P × Q) -මුළු පිරිවැය (ATC × Q)
(50 × 20) - (60 × 20) = 1,200
අලාභය = රු. 200

**(ලකුණු 02යි)**

(ආ) මුළු ස්ථාවර පිරිවැය (TFC) = සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC) × නිමැවුම (Q)

සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC) = සාමාන්‍ය මුළු පිරිවැය (ATC) - සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC)
= 60 - 40 = 20

මුළු ස්ථාවර පිරිවැය (TFC) = සා. ස්ථාවර පිරිවැය (AFC) × නිමැවුම (Q)
= 20 × 20 = රුපි. 400

**(ලකුණු 02යි)**


(විකල්ප පිළිතුර:

මුළු පිරිවැය (TC) = සාමාන්‍ය මුළු පිරිවැය (AC) × නිමැවුම (Q)
= 60 × 20 = 1,200

මුළු විචල්‍ය පිරිවැය (TVC) = සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) × නිමැවුම (Q)
= 40 × 20 = 800


මුළු ස්ථාවර පිරිවැය (TFC) = 1,200 - 800 = 400

03 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




03 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 64%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 21%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 26%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 28%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 25%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 05ක් ඇත. පහසුතාව අඩු ම කොටස (iv) වී ඇති අතර, එහි පහසුතාව 34%කි. පහසුතාව වැඩි ම කොටස (iii) වී ඇති අතර, එහි පහසුතාව 87%කි.

- i කොටසේ පහසුතාව 66%කි. ඍජු පිරිවැය හා ආරෝපිත පිරිවැය පිළිබඳ න්‍යායාත්මක දැනුම හා ප්‍රායෝගික නිදසුන් ගැටලුවෙන් විමසා ඇති නමුත් ගැටලුව දුෂ්කර වීමට ප්‍රායෝගික නිදසුන් දැක්වීමේ අපහසුතාව හේතු වී ඇත. එම ගැටලු නිරාකරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුය.

- ii කොටසේ පහසුතාව 46%කි. ප්‍රාමාණික ලාභය පිරිවැයක් ලෙස සලකනු ලැබීමට හේතුව විමසීමට මෙම කොටස යොමු වී ඇත. ප්‍රාමාණික ලාභය නිවැරදිව නිර්වචනය කර ගැනීමේ අපහසුතාවත්, එය වක්‍ර පිරිවැයෙහි සංරචකයක් බව විග්‍රහ කිරීමට අවබෝධයක් නො වීමත් ගැටලුවේ දුෂ්කරතාවට හේතු වී ඇත. එහෙයින් ප්‍රාමාණික ලාභය අර්ථ දැක්වීමටත් එය වක්‍ර පිරිවැයක් බව අවබෝධ කර ගැනීමටත් සිසුන් තුළ දැනුම වර්ධනය කළ යුතුය.

- iii කොටසට අපේක්ෂකයින් බහුතරයක් නිවැරදි පිළිතුරු සපයා තිබූ අතර 3 වන ප්‍රශ්නයේ වැඩි ම පහසුතාව, පෙන් වූ කොටසයි. එය 87% කි.

- iv කොටස 3 වන ප්‍රශ්නයේ දුෂ්කරතාව ඉහළ ම කොටසයි. මෙහි දුෂ්කරතාව 66%කි. ලාභ උපරිම කිරීමේ නීතිය හා පූර්ණ තරග ආයතනයක් සම්බන්ධයෙන් එම නීතිය ප්‍රකාශ කළ හැකි ආකාරය විමසීමට ගැටලුව සකස් වී ඇත. අපේක්ෂකයින් වැඩි දෙනෙකු ලාභ උපරිම කිරීමේ නීතිය අවබෝධ කරගෙන නො තිබූ අතර පූර්ණ තරග ආයතනයක් සම්බන්ධයෙන් එය ප්‍රකාශ කරන ආකාරය පිළිබඳ නිවැරදි දැනුමක් නො තිබුණි. එබැවින් ඕනෑම ව්‍යාපාර ආයතනයක ලාභ උපරිම කිරීමේ කොන්දේසියත්, පූර්ණ තරගය සඳහා එය සුවිශේෂී ලෙස ප්‍රකාශ කරන ආකාරයත් පැහැදිලි වන සේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කර ගත යුතුය.

  ඕනෑම ආයතනයක ලාභ උපරිම කිරීමේ නීතිය වන්නේ, ආන්තික අයභාරය (MR) ආන්තික පිරිවැය (MC) ට සමාන වන අවස්ථාවයි. පිළිතුරේ ඒ බව ඇතුළත් විය යුතුය.

  මෙම ප්‍රශ්නයේ දී ‘පූර්ණ තරග ආයතනය’ යන යෙදුම වෙනුවට, ‘මිල ගනුවෙකු වන ආයතනයක්’ ලෙස සඳහන් වේ. මිල ගනුවෙකු වන්නේ පූර්ණ තරග ආයතනයක් ය.

- v (අ) කොටසේ පහසුතාව 68%කි. පූර්ණ තරග ආයතනයක කෙටි කාලයක් තුළ දී ඇති අයභාර හා පිරිවැය තත්ත්වයන් ඇසුරින් ලාභය හෝ අලාභය ගණනය කරන ආකාරය ගැටලුවෙන් විමසා තිබුණ නමුත් ඒ පිළිබඳ නිවැරදි දැනුම අපේක්ෂකයින්ගෙන් යම් පිරිසකට නොමැති බව පෙන්නුම් කරයි. පූර්ණ තරග ආයතනයක මුළු අයභාරය හා මුළු පිරිවැය හඳුනා ගනිමින් ලාභ ගණනය කිරීමේ දැනුම ලබා දිය යුතුය.

  මෙහි (ආ) කොටසේ පහසුතාව 62%කි. පූර්ණ තරග ආයතනයක් සම්බන්ධයෙන් දී ඇති තොරතුරු ඇසුරෙන් මුළු ස්ථාවර පිරිවැය ගණනය කර ගැනීමේ දැනුම ගැටලුවෙන් පිරික්සයි. සැළකිය යුතු අපේක්ෂකයින් පිරිසකට එම දැනුම නොතිබූ බැවින් පිරිවැය විශ්ලේෂණය කර ගැනීමට හැකිවන පරිදි ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුය.

## 04 ප්‍රශ්නය

**4.** (i) කිසියම් රටක සමස්ත ආර්ථික ක්‍රියාවලිය මිනුම් කිරීම සඳහා භාවිත කෙරෙන ප්‍රවේශ **තුන** කවරේ ද? එම ප්‍රවේශ තුනම සමස්ත ආර්ථික ක්‍රියාවලිය පිළිබඳ එකම අගයක් ලබා දෙන්නේ ඇයි? (ලකුණු 04 යි)

(ii) ශ්‍රී ලංකාවේ ජාතික ඉතුරුම්වල ප්‍රධාන මූලාශ්‍ර කවරේ ද? (ලකුණු 04 යි)

(iii) ජාතික ආදායම් සංඛ්‍යා ලේඛන ප්‍රයෝජනවත් වන්නේ කවර ආකාරයන්ගෙන් ද? (ලකුණු 04 යි)

(iv) එක්තරා කල්පිත ආර්ථිකයක් පිළිබඳ පහත සඳහන් දත්ත ඔබ වෙත දී ඇතැයි සලකන්න. (සියලු ම සංඛ්‍යා රුපියල් මිලියනවලිනි.)

| අයිතමය | වටිනාකම | අයිතමය | වටිනාකම |
|---|---|---|---|
| දළ දේශීය පෞද්ගලික ආයෝජනය | 70 | ආණ්ඩුවෙන් කුටුම්බ වෙත ලබාදෙන සංක්‍රාම | 25 |
| ආණ්ඩුවේ මිල දී ගැනීම් | 50 | ආණ්ඩුවෙන් කුටුම්බ වෙත කරනු ලබන පොලී ගෙවීම් | 15 |
| වෙළෙඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය | 400 | විදේශවලින් ලැබෙන සාධක ආදායම් | 7 |
| ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුමේ ශේෂය | -25 | විදේශ වෙත කරනු ලබන සාධක ආදායම් ගෙවීම් | 12 |
| බදු | 100 | ශුද්ධ විදේශ වර්තන සංක්‍රාම | 10 |

ඉහත තොරතුරු ආශ්‍රයෙන් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) ශුද්ධ අපනයන (ලකුණු 02 යි)

(ආ) පෞද්ගලික පරිභෝජන වියදම (ලකුණු 02 යි)

(ඉ) වැය කළ හැකි දළ ජාතික ආදායම (ලකුණු 02 යි)

(ඊ) ආණ්ඩුවේ ඉතුරුම් (ලකුණු 02 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

04. (i) - නිමැවුම් ප්‍රවේශය
- ආදායම් ප්‍රවේශය
- වියදම් ප්‍රවේශය

(ප්‍රවේශ තුනම සඳහන් කර ඇත්නම් ලකුණු 02යි; ප්‍රවේශ දෙකක් පමණක් සඳහන් කොට ඇත්නම් ලකුණු 01 ක් පමණි.)

- නිෂ්පාදන, ආදායම් හා වියදම් ප්‍රවේශ පිළිබිඹු කෙරෙනුයේ එක ම ක්‍රියාවලියක විවිධ පැතිකඩ තුනකි. නිෂ්පාදන ප්‍රවේශය ඔස්සේ මිනුම් කරනුයේ දෙන ලද වර්ෂය තුළ රට තුළ නිෂ්පාදනය කරන ලද සියලු ම අවසාන භාණ්ඩ හා සේවාවල වටිනාකම ය. ආදායම් ප්‍රවේශය ඔස්සේ මනිනු ලබන්නේ එම අවසාන භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා දායක වූ නිෂ්පාදන සාධකවලට කරන ලද මුළු ගෙවීම් ප්‍රමාණයේ හෙවත් මුළු ආදායමේ වටිනාකමය. නිෂ්පාදනයේ වටිනාකම අවශ්‍යයෙන් ම නිෂ්පාදනය බිහි කිරීම සඳහා යොදාගත් නිෂ්පාදන සම්පත්වල වටිනාකමට සමාන විය යුතු බැවින්, ආදායමේ වටිනාකමත් නිෂ්පාදනයේ වටිනාකමත් අනන්‍ය වේ. එසේම වියදම් ප්‍රවේශය ඔස්සේ මිනුම් කරනුයේ අවසාන භාණ්ඩ හා සේවා ප්‍රමාණය මිල දී ගැනීම සඳහා වැය කළ යුතු මුළු වියදමේ වටිනාකමයි. නිමැවුමේ වටිනාකම නිමැවුම මිල දී ගැනීම සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණයට අවශ්‍යයෙන් ම සමාන විය යුතු බැවින්, නිමැවුම් වටිනාකම සහ වියදමේ වටිනාකම ද එකිනෙකට සමාන විය යුතුය. මේ අනුව බලන විට නිමැවුම්, ආදායම් හා වියදම් ප්‍රවේශ ලබා දෙනුයේ සමස්ත නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා එක ම වටිනාකමකි.

(ලකුණු 02යි)

(ii) - දේශීය ඉතුරුම්

- පෞද්ගලික ඉතුරුම් (කුටුම්බ හා සමාගම්)
- රජයේ ඉතුරුම්

- විදේශීය ඉතුරුම්

- විදේශ ශුද්ධ සාධක ආදායම්
- විදේශ ශුද්ධ පෞද්ගලික වර්තන සංක්‍රාම

**(ලකුණු 02යි)**

(දේශීය ඉතුරුම් සහ විදේශීය ඉතුරුම් යනුවෙන් පමණක් සඳහන් කොට ඇත්නම් ලකුණ 01 ක් පමණි.)

(iii)- ආර්ථිකයේ කාර්ය සාධනය ඇගයීම.
- ආර්ථික වෘද්ධිය මැනීම.
- ප්‍රතිශීර්ෂ ආදායම් ජාත්‍යන්තර වශයෙන් සැසඳීම.
- ආර්ථිකයේ ව්‍යුහමය ලක්ෂණ හඳුනා ගැනීම.
- මිනිසුන්ගේ ජීවන තත්ත්වය හා ශුභසාධනය තක්සේරු කිරීම.
- ආදායම්වල කාර්යාත්මක ව්‍යාප්තිය (වැටුප්, පොලී, බදු කුලී, ලාභ) හඳුනා ගැනීම.
- සාර්ව ආර්ථිකයේ ශ්‍රිතාත්මක සම්බන්ධතාව හඳුනා ගැනීම.
- ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති සම්පාදනය හා සැළසුම්කරණය.
- ආර්ථිකයේ මුළු සම්පත් හා ඒවා උපයෝජනය කරන ආකාරය හඳුනා ගැනීම.
- සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම් පුරෝකථනය කිරීම.

**(ඕනෑම කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)**

(iv) (අ) - ශුද්ධ අපනයනः

ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුමේ ශේෂය } = ශුද්ධ අපනයන + විදේශ ශුද්ධ සාධක ආදායම් ශුද්ධ විදේශ වර්තන සංක්‍රාම

ශුද්ධ අපනයන = ජංගම ගිණුමේ ශේෂය – (වි. ශු. සාධක ආදායම + ශු. වි. වර්තන සංක්‍රාම)

**(ලකුණු 01යි)**

= -25 - (7 - 12) - 10 = [–25 – (–5) – 10]

= රුපියල් මිලියන -30

**(ලකුණු 01යි)**

(ආ) පෞද්ගලික පරිභෝජන වියදම (C) = Y - (I + G + NX)

C = 400 - [70 + 50 + (30)]

C = 400 [70 + 50 + (-30)]

= 400 - 90 = මිලියන 310

**(ලකුණු 01යි)**

(ඉ) වැය කළ හැකි දළ ජාතික ආදායම :

= ද. දේ. නිෂ්පාදිතය + විදේශ ශුද්ධ සාධක ආදායම + ශුද්ධ විදේශ වර්තන සංක්‍රාම

= 400 + (-5) + 10 = 405

= රුපියල් මිලියන 405

**(ලකුණු 01යි)**


(ඊ) ආණ්ඩුවේ ඉතුරුම් ($S_G$) :

$S_G$ = (T - Tr - ITN) - G

= (100 - 25 - 15) - 50


= (60 - 50 = 10 (ලකුණු 01යි)

**04 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




04 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 22%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 45%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 27%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 19%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 9%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 04ක් ඇත. පහසුතාව අඩු ම කොටස (iv)(ඊ) වී ඇති අතර, එහි පහසුතාව 13%කි. පහසුතාව වැඩි ම කොටස (i) වී ඇති අතර, එහි පහසුතාව 61%කි.

★ i කොටසෙහි පහසුතාව 61% කි. රටක සමස්ත ආර්ථික ක්‍රියාවලිය මිනුම් කිරීම සඳහා භාවිත වන ප්‍රවේශ විමසීමට ප්‍රශ්නය යොමු වී ඇති අතර අපේක්ෂකයින් යම් ප්‍රතිශතයක් ගැටලුව අවබෝධ කර ගැනීමේ දුෂ්කරතාවට මුහුණ දී ඇති බැවින් පහසුතාව සීමා වී ඇත. එබැවින් ජාතික ගිණුම් සකස් කිරීමේ ප්‍රවේශ විවිධ නම්වලින් හැඳින්වෙන බව ශිෂ්‍යයාට අවධාරණය කිරීම අවශ්‍ය වන අතර ප්‍රවේශ තුන මගින් ම එක ම දෙයක් මැනෙන බව තහවුරු වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය.

★ ii වන කොටසෙහි පහසුතාව 34% කි. ශ්‍රී ලංකාවේ ජාතික ඉතුරුම්වල මූලාශ්‍ර විමසන ගැටලුව කෙරෙහි බහුතර අපේක්ෂකයින් නිවැරදි පිළිතුරු සැපයීමට අසමත් වී ඇත්තේ ජාතික ඉතුරුම් උත්පාදනය වන මූලාශ්‍ර හා ඒවායේ අනු කොටස් පිළිබඳ නිශ්චිත අවබෝධයක් නොවීම හේතුවෙනි. එබැවින් ශ්‍රී ලංකාවේ ඉතුරුම් ප්‍රභේද හා ඒවායේ මූලාශ්‍ර පිළිබඳ යාවත්කාලීන දැනුම ශිෂ්‍යයා වෙත ලබා දීමට කටයුතු කළ යුතුය. ආදර්ශ පිළිතුරේ දී ඇති පරිදි ඉතුරුම් සමන්විත වන්නේ කෙසේද යන්න පිළිතුරට ඇතුළත් විය යුතු ය.

★ iii වන කොටසෙහි පහසුතාව 51% කි. ගැටලුව යොමු වී ඇත්තේ ජාතික ආදායම් සංඛ්‍යාලේඛනවල ප්‍රයෝජනය විමසීමට යි. අපේක්ෂකයින්ගෙන් අඩක් පමණ නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් වීම එම මාතෘකා පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොතිබූ බව අනාවරණය කරයි. ජාතික ගිණුම්වල වැදගත්කම විස්තර කිරීමට සිසුන් තුළ දැනුම ප්‍රවර්ධනය කළ යුතුය.

★ iv වන කොටසෙහි අ, ආ, ඉ, ඊ කොටස්වලින් විමසා තිබූයේ, දී ඇති සංඛ්‍යා ඇසුරින් ජාතික ගිණුම් ආශ්‍රිත මිනුම් ගණනය කිරීමයි. නමුත් අනුපිළිවෙළින් එම කොටස්වල පහසුතාව 33%, 31%, 22% සහ 13% වශයෙන් පහළ මට්ටමක පැවතීම මගින් පෙන්නුම් කරන්නේ අපේක්ෂකයින් වැඩි දෙනෙකු එම කුසලතාව ලබා නොතිබූ බවයි. එබැවින් දී ඇති සංඛ්‍යා අදාළ කරගෙන ප්‍රවේශ තුන යටතේ ජාතික ගිණුම් සංකල්ප මෙන්ම, ඊට සම්බන්ධ වන උප සංරචක ද, ගණනය කිරීමේ කුසලතාව අයදුම්කරුවන් තුළ වර්ධනය කළ යුතුය.

(අ) ප්‍රශ්නයේ දී ඇති තොරතුරු අනුව ශුද්ධ අපනයන හඳුනා ගත හැක්කේ ගෙවුම් තුළනයේ ජංගම ගිණුමේ ශේෂය ඇසුරෙනි. ජංගම ගිණුම පහත සඳහන් සංරචකවලින් සමන්විත වේ.

1. ශුද්ධ අපනයන.
2. විදේශ ශුද්ධ සාධක ආදායම
3. විදේශ ශුද්ධ වර්තන සංක්‍රාම

මේ නිසා ගෙවුම් තුළනයේ ජංගම ගිණුමේ ශේෂයෙන් විදේශ ශුද්ධ සාධක ආදායම හා විදේශ ශුද්ධ වර්තන සංක්‍රාම අඩු කළ විට ශුද්ධ අපනයන ලැබේ.

සැලකිය යුතුයිඃ නව ගෙවුම් ශේෂ ලේඛන ආකෘතිය අනුව විදේශ ශුද්ධ සාධක ආදායම වෙනුවට ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂයත්, විදේශ ශුද්ධ වර්තන සංක්‍රාම වෙනුවට ද්විතියික ආදායම් ගිණුමේ ශේෂයත් ගැළපිය යුතුය.

(ආ) රටක දළ දේශීය නිෂ්පාදිතය පහත සඳහන් කාර්යයන්හි උපයෝජනය වේ.

- පෞද්ගලික පරිභෝජනය. (C)
- දළ දේශීය ආයෝජනය (I)
- රජයේ මිල දී ගැනීම් (G)
- ශුද්ධ අපනයන (NX)

මේ අනුව ආදායමෙන් (Y)/ දළ දේශීය නිෂ්පාදිතයෙන් I +G + NX යන කොටස් අඩු කිරීමෙන් පෞද්ගලික පරිභෝජනය සොයාගත හැකිය.

(ඉ) ආර්ථිකයකට වැය කළ හැක්කේ දළ දේශීය නිෂ්පාදිතය/ ආදායම පමණක් නො වේ. විදේශ ශුද්ධ සාධක ආදායම් ද, වර්තන සංක්‍රාම වශයෙන් විදේශවලින් ලැබෙන ආදායම් ද, වැය කළ හැකිය. එහෙත් ද.දේ.නි ගණනය කිරීමේ දී විදේශ ශුද්ධ සාධක ආදායම ද, විදේශ සංක්‍රාම ද, ඇතුළත් නො වේ. එබැවින් ද.දේ.නි ට ඒවා එකතු කිරීමෙන් වැය කළ හැකි ජාතික ආදායම ලැබේ. දේශීය නිෂ්පාදිතයට/ ආදායමට විදේශ ශුද්ධ සාධක ආදායම එකතු කළ විට දළ.ජාතික නිෂ්පාදිතය/ ආදායම ලැබෙන අතර එයට විදේශ වර්තන සංක්‍රාම එකතු කළ විට වැය කළ හැකි ජාතික ආදායම ලැබේ.

(ඊ) මෙහි ලකුණු අඩු වීමට හේතු වී ඇත්තේ ශුද්ධ බදු අයභාරය හඳුනා ගැනීමට අසමත් වීමයි. රජයේ ශුද්ධ බදු අයභාරයෙන්, ආණ්ඩුවේ මිල දී ගැනීම් අඩු කළ විට රජයේ ඉතුරුම් ලැබේ. ශුද්ධ බදු අයභාරය ලෙස සැලකෙන්නේ රජයේ අයභාරයෙන්, රජයෙන් දෙන සංක්‍රාම හා කුටුම්භ වෙත ගෙවන සංක්‍රාම අඩු කිරීමෙන් පසු ලැබෙන අගයයි.

## 05 ප්‍රශ්නය

**5.** (i) පහත දැක්වෙන සමාහාර පරිභෝජන ශ්‍රිතය සැලකිල්ලට ගන්න.

$$C = a + bY_d$$

මෙම සමීකරණයෙහි C වලින් මුළු පරිභෝජන වියදමත්, $Y_d$ වලින් වැය කළ හැකි ජාතික ආදායම් මට්ටමත් අදහස් කෙරේ. **a** සහ **b** යන සංගුණක ඔබ අර්ථ දක්වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) සමතුලිත ජාතික ආදායම් මට්ටමක් යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? විවෘත ආර්ථිකයක ජාතික ආදායම් මට්ටමේ සමතුලිතතාව සඳහා අවශ්‍ය කරන කොන්දේසි කවරේ ද? (ලකුණු 04 යි)

(iii) ආවෘත ආර්ථිකයක සැලසුම් කළ ආයෝජනයට වඩා සැලසුම් කළ ඉතුරුම් ඉහළ අගයක පවතිනවා යැයි සලකන්න. මෙවැනි තත්ත්වයක දී ආර්ථිකය, සමතුලිත ජාතික ආදායම් මට්ටමක් කරා ළඟා වනුයේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) ආවෘත ආර්ථිකයකට අදාළ සාර්ව ආර්ථික දත්ත කිහිපයක් පහත දැක්වේ. (සියලු ම සංඛ්‍යා රුපියල් මිලියනවලිනි.)

| | | |
|---|---|---|
| පරිභෝජනය (C) | = | $50 + 0.8\,Y_d$ |
| ආයෝජනය (I) | = | 120 |
| ආණ්ඩුවේ මිල දී ගැනීම් (G) | = | 100 |
| බදු (T) | = | 80 |
| ආණ්ඩුවෙන් කුටුම්බ වෙත ලබාදෙන සංක්‍රාම (Tr.) | = | 55 |

(අ) මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම් මට්ටම නිර්ණය කරන්න. (ලකුණු 02 යි)

(ආ) ආණ්ඩුවේ මිල දී ගැනීම් රු. මිලියන 200ක් දක්වා ඉහළ ගියහොත්, නව සමතුලිත ජාතික ආදායම් මට්ටම කොපමණ ද? (ලකුණු 02 යි)

(ඉ) ආණ්ඩුවේ වියදම් ගුණකයේ අගය කොපමණ ද? (ලකුණු 02 යි)

(ඊ) රුපියල් මිලියන 2 000ක ජාතික ආදායම් ඉලක්කයක් අත්කර ගැනීමට රජය අදහස් කරන්නේ නම්, ඒ සඳහා අවශ්‍ය කරන ආණ්ඩුවේ මිල දී ගැනීම්වල මුළු අගය කොපමණ ප්‍රමාණයක් විය යුතු ද? (ලකුණු 02 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(5) (i) - පාරිභෝජන ශ්‍රිතයේ 'a' සංගුණකය පෙන්නුම් කරනුයේ ජීවිතය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කරන අවම පරිභෝජන වියදම් ප්‍රමාණය යි. එය පවත්නා ආදායම් මට්ටම සමඟ සම්බන්ධයක් නොදක්වයි. වර්තමාන ආදායම ශුන්‍ය අගයක් ගනු ලැබුවත්, ජීවිතය පවත්වා ගැනීම සඳහා මෙම අවම පරිභෝජන වියදම දැරිය යුතු වේ.

(ලකුණු 02යි)

[ඉහත පැහැදිළි කිරීම නොමැතිව 'a' යනුවෙන් අදහස් කරනුයේ ස්වායත්ත පරිභෝජන වියදම හෝ පරිභෝජන ශ්‍රිතයෙහි අන්තඃඛණ්ඩය වශයෙන් සඳහන් කොට ඇත්නම් ලකුණු 01 ක් පමණක් ලබා දීම සුදුසු ය.]

- පරිභෝජන ශ්‍රිතයේ 'b' සංගුණකය පෙන්නුම් කරනුයේ ආදායම වෙනස් වීම හා ආන්තික පරිභෝජන වියදමේ වෙනස්වීම අතර අනුපාතය යි. එනම් $\Delta C/\Delta Y$ වශයෙනි.

(ලකුණු 02යි)

['b' සංගුණකය පෙන්නුම් කරනුයේ පරිභෝජන ශ්‍රිතයේ බෑවුම පමණක් සඳහන් කර ඇත්නම්, ලකුණු 01 ක් පමණක් ලබා දීම සුදුසුය.]

(ii) - කිසියම් ජාතික ආදායම් මට්ටමක් පවත්නා අගයේ සිට ඉහළට හෝ පහළට හෝ වෙනස් වීමට ප්‍රවණතාවක් නොදක්වන්නේ නම්, එම ජාතික ආදායම් මට්ටම සමතුලිත ජාතික ආදායම් මට්ටමක් ලෙස සැලකේ.

(ලකුණු 02යි)

- $Y = E$

  $Y = C + I + G + (X - M)$

(ලකුණු 01යි)

- $W = J$

  $S + T + M = I + G + X$

(ලකුණු 01යි)

(iii) - ආවෘත ආර්ථිකයක, සැලසුම් කළ ආයෝජනයට වඩා, සැලසුම් කළ ඉතුරුම් ඉහළ අගයක් ගන්නා විට, (එනම් $S > I$) ආර්ථිකයේ සැලසුම් කළ සමාහාර වියදම (E) සමාහාර නිමැවුමට (Y) වඩා අඩු අගයක් ගනී. එනම් $Y > E$ වශයෙනි. මෙය අසමතුලිත තත්ත්වයක් වන බැවින් , එයට ප්‍රතිචාර වශයෙන් අඩු වූ සමාහාර වියදමට ගැළපෙන අයුරින් නිමැවුම් මට්ටම ද සංකෝචනය වනු ඇත.

(ලකුණු 02යි)

- සමාහාර වියදමට වඩා සමාහාර නිමැවුම විශාල වූ විට, තොග සමුච්චනය වීමක් හට ගනී. ආයතනය විසින් සැලසුම් කළ ප්‍රමාණය ඉක්මවා තොග සමුච්චනය වන විට, නිෂ්පාදන ආයතන නිමැවුම සංකෝචනය කරමින්, තොග සැලසුම් කළ මට්ටමේ පවත්වා ගැනීමට උත්සාහ කරයි. සැලසුම් කළ ඉතුරුම් ප්‍රමාණයට සැලසුම් කළ ආයෝජනය සමාන වන තුරු, නිමැවුම සංකෝචනය වීමේ ක්‍රියාවලිය සිදු වන අතර, ඉතුරුම්, ආයෝජන සමාන වූ විට ($S = I$), ආදායම් මට්ටම යළිත් සමතුලිත වනු ලැබේ. එහි දී සැලසුම් නො කළ තොග වෙනස්වීම් දක්නට නො ලැබෙන අතර, සමාහාර නිමැවුම සමාහාර වියදමට සමාන වෙමින් සමතුලිත මට්ටමේ පවතී.

(ලකුණු 02යි)

(iv) (අ) සමතුලිත ජාතික ආදායම් මට්ටම

$Y = C + I + G$

$Y = 50 + 0.8Yd + 120 + 100$

$Y = 50 + 0.8(Y - T + Tr) + 220$

$Y = 50 + 0.8(Y - 80 + 55) + 220$

$Y = 50 + 0.8Y - 64 + 44 + 220$

$Y = 270 + 0.8Y - 20$

$Y = 250 + 0.8Y$

$Y - 0.8Y = 250$

$0.2Y = 250$

Y = රු. මිලියන 1250

(ලකුණු 01යි)

(ආ) ආණ්ඩුවේ මිල දී ගැනීම් මිලියන 200 දක්වා ඉහළ ගිය විට නව සමතුලිත ජාතික ආදායම් මට්ටම:

$Y = 50 + 0.8Y_d + 120 + 200$

$Y = 50 + 0.8(Y - 80 + 55) + 320$ (ලකුණු 01යි)

$= 50 + 0.8Y - 64 + 44 + 320$

$= 350 + 0.8Y$

$Y - 0.8Y = 350$

$0.2Y = 350$

Y = රු. මිලියන 1,750

(ලකුණු 01යි)

[විකල්ප පිළිතුර:

$$K_G = \frac{1}{1-b} = \frac{1}{1-0.8} = 5 \text{ (ආණ්ඩුවේ වියදම් ගුණකය)}$$

$\Delta G = 100 \longrightarrow \Delta Y = 100 \times 5 = 500$

නව සමතුලිත ජාතික ආදායම = 1,250 + 500 = 1750]

(ඉ) - ආණ්ඩුවේ වියදම් ගුණකය

$$K_G = \frac{1}{1 - MPC} = \frac{1}{1-0.8} = \frac{1}{0.2} = 5$$

**(ලකුණු 02යි)**

(ඊ) රුපියල් මිලියන 2,000 ජාතික ආදායම් ඉලක්කයක් අත්කර ගැනීමට අවශ්‍ය කරන ආණ්ඩුවේ මිල දී ගැනීම්වල මුළු වටිනාකම:

වර්තමාන ආදායම් මට්ටම = 1,750
ඉලක්ක ආදායම් මට්ටම = 2,000

ආදායම වැඩිකළ යුතු ප්‍රමාණය $(\Delta Y)$ = 2,000 - 1,750 = 250
ආණ්ඩුවේ වියදම් ගුණකය = 5
ආණ්ඩුවේ වියදම් ගුණකය 5ක් වේ නම් ආදායම 250 කින් ඉහළ නැංවීමට

අවශ්‍ය කරන අතිරේක වියදම $(\Delta G) = \frac{(\Delta Y)}{K_G} = \Delta G = \frac{250}{5} = 50$

අවශ්‍ය කරන ආණ්ඩුවේ මිල දී ගැනීම්වල මුළු අගය = 200 + 50 + = 250
= රුපියල් මිලියන 250

**(ලකුණු 02යි)**

[විකල්ප පිළිතුර:

$Y = C + I + G$

$2,000 = 50 + 0.8Y_d\ 120 + G$ **(ලකුණු 01යි)**

$2,000 = 50 + 0.8(Y - T + Tr) + 120 + G$

$2,000 = 50 + 0.8(Y - 80 + 55) + 120 + G$

$2,000 = 50 + 0.8Y - 64 + 44 + 120 + G$


$2,000 = 150 + 0.8\ (2,000) + G$

$2,000 = 150 + 16,00 + G$

$2,000 - 1,750 = G$


$250 = G$]

**05 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




05 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 29%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 24%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 30%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 31%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 15%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 4ක් ඇති අතර (iv) වන කොටස (අ), (ආ), (ඉ), (ඊ) වශයෙන් අනුකොටස් හතරකින් යුක්තය. මෙම ප්‍රශ්නය තුළ වැඩි ම පහසුතාව (iv) (ඉ) අනුකොටසට හිමිවන අතර, එහි පහසුතාව 70%කි. අඩු ම පහසුතාව ඇත්තේ (iii) කොටසට වන අතර, එහි පහසුතාව 16% කි.

- i කොටසෙහි පහසුතාව 60% කි.සරල පරිභෝජන ශ්‍රිතයෙහි සංරචක පිළිබඳ දැනුම විමසීම වෙත ප්‍රශ්නය යොමු වී ඇත. ගැටලුව කෙරෙහි අපේක්ෂකයින්ගෙන් 40% ක් පමණ සතුටුදායක නොවූ ප්‍රතිචාර දක්වා ඇති බැවින් ඒ පිළිබඳ සිසුන් තුළ දැනුම වර්ධනය කළ යුතු බව අනාවරණය කරයි.

- ii කොටස මගින් සමතුලිත ජාතික ආදායම නිර්වචනය කිරීම හා විවෘත ආර්ථිකයක ජාතික ආදායම් මට්ටමේ සමතුලිතතාව සඳහා අවශ්‍ය කොන්දේසි විමසා ඇත. අපේක්ෂකයින් හට 49% ක දුෂ්කරතාවක් පැවතීම මගින් අනාවරණය කරන්නේ ජාතික ආදායම නිවැරදිව නිර්වචනය කිරීමේ දැනුම හා ජාතික ආදායමේ සමතුලිතය තීරණය වීම කෙරෙහි (එනම් එක් එක් ආකෘතීන් හි) අවශ්‍ය කොන්දේසි විග්‍රහ කිරීමේ අවබෝධය නොතිබූ බවයි. එම කුසලතාව වර්ධනය වන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කළ යුතුය.

★ iii කොටස මෙම ප්‍රශ්නයේ 84% ක් වන ඉහළ ම දුෂ්කරතාව පෙන්වූ කොටසයි. ආවෘත ආර්ථිකයක කාන්දුවීම් හා විදීම් හඳුනා ගනිමින් ආයෝජනයට වඩා ඉතුරුම් ඉහළ අගයක පවතින විට සමතුලිත ජාතික ආදායම් මට්ටම කරා ළඟා වන ආකාරය විමසීමට මෙම කොටස යොමු වී ඇත. නමුත් අපේක්ෂකයින් විශාල පිරිසක් කාන්දු වීම්, විදීම් වෙනස් වීම අනුව සමතුලිත ආදායම තීරණය වන ආකාරය විග්‍රහ කර ගැනීමේ කුසලතාව නොමැති බව පෙන්වයි. එබැවින් එම කුසලතාව වර්ධනය වන පරිදි වගු හා ප්‍රස්තාර මගින් මෙන්ම සමීකරණ මගින් ද, කාන්දුවීම්, විදීම් වෙනස්වීම මත සමතුලිත ආදායම තීරණය වන ආකාරය පැහැදිළි කරන්න.

සාර්ව ආර්ථිකයේ සමතුලිතතාවය තීරණය වීම පිළිබඳ කේන්සියානු න්‍යාය යටතේ කාන්දුවීම් = විදීම් (W = J) ප්‍රවේශය අනුව සමතුලිතතාවයේ දී අනපේක්ෂිත තොග සමුච්චනයක් හෝ ඌණතාවයක් නොපැවතිය යුතුය. සැළසුම් කළ ඉතුරුම් හා සැළසුම් කළ ආයෝජන එකිනෙකට සමාන වූ විට අනපේක්ෂිත තොග සමුච්චනය ශුන්‍ය වේ. සැළසුම් කළ ආයෝජනයට වඩා සැළසුම් කළ ඉතුරුම් වැඩි නම් අනපේක්ෂිත තොග සමුච්චනයක් සිදුවන බැවින් ආයතන තොග අඩු කර ගැනීමට කටයුතු කරයි. මේ ක්‍රියාවලිය සමතුලිත නිමැවුම් මට්ටම දක්වා ම සිදු වේ. මේ ආකාරයට S සහ I අගයන් අතර වෙනස්කම් පවතින විට තොග වෙනස්වීම් කවර අගයක් ගන්නේ ද යන්න හා සමතුලිතය කරා ගමන් කිරීමේ දී තොග වෙනස්වීම්වලට කුමක් සිදු වන්නේ ද යන්න පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබා ගැනීම අවශ්‍ය වේ.

★ iv (අ) කොටසෙහි පහසුතාව 60% කි. දී ඇති තොරතුරු ඇසුරින් සමතුලිත ජාතික ආදායම ගණනය කිරීමට මෙම කොටස යොමු වී ඇත. සැලකිය යුතු අපේක්ෂකයින් පිරිසක් එම කුසලතාව නොපෙන්වා ඇති බැවින් අදාළ දැනුම හා කුසලතාව වර්ධනය කළ යුතුය.

(ආ) කොටසේ පහසුතාව 51% කි. ගැටලුව යොමු වී ඇත්තේ ස්වාධීන වියදම් ගුණකය ගණනය කොට ඒ ඇසුරින් ස්වාධීන වියදමක වෙනසට අනුරූපව සමතුලිත ආදායම වෙනස්වන ප්‍රමාණය මිනුම් කිරීම වෙතය. අපේක්ෂකයින්ගෙන් අඩක් පමණ එම කුසලතාව ලබා නො තිබුණි. ස්වාධීන වියදමක වෙනසට අනුව සමතුලිත ආදායමේ වෙනස් වීම ගණනය කිරීමේ දී ගුණකය භාවිත කිරීම හුරු කරවන්න.

(ඉ) කොටස මගින් ආණ්ඩුවේ වියදම් ගුණකය ගණනය කිරීමේ කුසලතාව විමසා ඇත. එම කොටසේ පහසුතාව 70% කි. ඉන් පෙනී යන්නේ ගුණකය ගණනය කිරීමේ කුසලතාව ශිෂ්‍යයා තුළ ඇති බවයි.

(ඊ) රජයේ වියදම් වෙනස් වීම හා සමතුලිතය වෙනස්වීම අතර සම්බන්ධය ගුණකය ඇසුරින් ගණනය කර ගැනීමේ කුසලතාව අපේක්ෂකයින් වැඩි දෙනෙකු තුළ නො තිබූ බව (ඊ) කොටසෙහි දුෂ්කරතාව 63% ක් වීමෙන් පෙනීයයි. ගුණකය ඇසුරින් ස්වාධීන වියදමක වෙනස මත සමතුලිත ආදායම වෙනස්වීම ඇස්තමේන්තු කිරීමේ කුසලතාව ශිෂ්‍යයා තුළ වර්ධනය කළ යුතුය.

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යටතේ රජයේ වියදම් වැඩි කිරීම මගින් නිමවුම් මට්ටම කෙරෙහි බලපෑමක් ඇති කළ හැකිය. එහි දී රජයේ වියදම් ගුණකය හා නිමවුම වෙනස් කළ යුතු ප්‍රමාණය අතර සබඳතාවයක් පවතී. එම සබඳතාවයේ ස්වරූපය නිවැරදිව අවබෝධ කර ගැනීම වැදගත් වේ. මේ සඳහා යෝජිත පිළිතුර හොඳින් අධ්‍යයනය කරන්න.

**"ආ" උප කොටස**

## 06 ප්‍රශ්නය

(මෙම කොටසෙන් ද අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

**6.** (i) 'මුදල්' නිර්වචනය කොට, භාණ්ඩ හුවමාරු (බාටර්) ක්‍රමයක දක්නට ලැබුණු දුෂ්කරතා ඉවත් කරලීමට මුදල් සමත් වී ඇත්තේ කෙසේ දැයි සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) ණයපත් මුදල් **නොවන්නේ** ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(iii) ආර්ථිකයක මුදලට ඇති ඉල්ලුම තීරණය කරන සාර්ව ආර්ථික විචල්‍යයන් නම් කොට, එම විචල්‍යයන් මුදල් ඉල්ලුම කෙරෙහි බලපාන්නේ කෙසේ දැයි සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය සහ පිරිවැයෙන් තල්ලු වුණු උද්ධමනය අතර වෙනස ඔබ පෙන්වා දෙන්නේ කෙසේ ද? යෝග්‍ය ප්‍රස්තාර සටහන් භාවිත කරමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) වර්තමානයේ ශ්‍රී ලංකාවේ දේශීය මුදල් වෙළෙඳපොළෙහි, ඉතා ඉහළ මට්ටමේ අධි ද්‍රවශීලතාවක් දක්නට ලැබෙන්නේ ඇයි? බැංකු පද්ධතියේ අධි ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේ ද? (ලකුණු 06 යි)

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(6) (i) - භාණ්ඩ හා සේවා හුවමාරු කිරීමේ දී ගෙවීම් මාධ්‍යයක් වශයෙන් පොදුවේ පිළිගන්නා වූ ඕනෑම දෙයක් මුදල් වශයෙන් සලකනු ලැබේ.

**(ලකුණු 02යි)**

- සෘජු හුවමාරුව පදනම් කරගත් ගනුදෙනු ක්‍රමයක් හෙවත් බාටර් ක්‍රමයක් තුළ, හුවමාරුවක් සිදු වීමට නම් හුවමාරුවට සහභාගිවන දෙපාර්ශ්වයේ අවශ්‍යතා අන්‍යොන්‍ය වශයෙන් එකිනෙකට ගැළපිය යුතු වීම. වුවමනා පිළිබඳ ද්වීක සම්පාතය නමින් හඳුන්වනු ලබන මෙම කොන්දේසිය අත්කර ගැනීම අතිශයින් ම දුෂ්කර වේ.

**(ලකුණු 01යි)**

- ප්‍රවාහන අපහසුතා (දුර බැහැර ප්‍රදේශ සමඟ ගනුදෙනු කිරීමේ දී භාණ්ඩ රැගෙන ඒම ඉතා දුෂ්කර වීම.)
- ගබඩා කර තැබීමේ අපහසුතාව.
- හුවමාරුව සඳහා එකඟතාවකට ඒමට විශාල කාලයක් ගත වීම.
- කුඩා කොටස් වශයෙන් බෙදා හුවමාරු කර ගැනීමේ අපහසුතාව.

**(ඕනෑම කරුණකට ලකුණු 01යි)**

(ii) - ණය පත් මුදල් ලෙස නොසැලකෙනුයේ මුදලේ තිබිය යුතු ප්‍රධාන ගුණාංග ණයපත්වල දක්නට නො ලැබෙන බැවිනි. ණයපත් වටිනාකම් සන්නිධියක් වශයෙන් ක්‍රියා නො කරන අතර, තාවකාලික හුවමාරු මාධ්‍යයක් වශයෙන් පමණක් කටයුතු කරයි.

**(ලකුණු 01යි)**

- ණයපත් වූ කලී කිසියම් සමාගමකින් හෝ මූල්‍ය ආයතනයකින්, හෝ කෙටි කාලීන ණය මුදලක් ලබා ගැනීමේ වැඩ පිළිවෙළකි. කෙටි කාලීන හුවමාරු මාධ්‍යයක් එමගින් සැපයුන ද, ණයපත් ගිණුම පියවීමේ දී, හුවමාරු මාධ්‍යයක් වශයෙන් මුදල් යොදා ගැනීමට ණයපත් හිමියාට සිදු වේ. ගනුදෙනුව සම්පූර්ණ වන්නේ මුදල්වලින් ණයපත් ගිණුම පිය වූ පසුව ය.

**(ලකුණු 01යි)**

(iii)- මූර්ත ආදායම
- පොලී අනුපාතිකය
- මිල මට්ටම
- අපේක්ෂිත උද්ධමන අනුපාතිකය

**(ඕනෑම කරුණු දෙකකට ලකුණු 02යි)**

- ගනුදෙනු ප්‍රමාණය තීරණය කෙරෙන ඉතා වැදගත් සාධකයක් වන්නේ මූර්ත ආදායමේ ප්‍රමාණයයි. මූර්ත ආදායම ඉහළ යන විට ගනුදෙනු කිරීමේ පරමාර්ථයෙන් මුදල් ශේෂ සඳහා කරනු ලබන ඉල්ලුම ද, ඉහළ යයි.

- පොලී අනුපාතිකය මුදල් ශේෂ ළඟ තබා ගැනීමේ ආවස්ථික පිරිවැය පෙන්නුම් කරයි. පොලී අනුපාතික ඉහළ යන විට, මුදල් ශේෂ තබා ගැනීමේ ආවස්ථික පිරිවැය අධික ය. එබැවින් මුදල් සඳහා කරන ඉල්ලුම අඩු කරන අතර, ඒ වෙනුවට විකල්ප වත්කම්වල ආයෝජනය කෙරේ.

- පොලී අනුපාතිකය සමපේක්ෂණය ඔස්සේ මුදල් ශේෂ සඳහා කරන ඉල්ලුමට ද, බලපායි. පොලී අනුපාතිකය අනාගතයේ දී පහළ වැටෙතියි අපේක්ෂා කෙරේ නම්, එමඟින් ඇතිවිය හැකි ප්‍රාග්ධන වාසි ලබා ගැනීම සඳහා මුදල් ශේෂ සඳහා ඉල්ලුම අඩුකොට පිළිනපත්වල ආයෝජනය වැඩි කරගනු ඇත.

- මිල මට්ටම ඉහළ යන විට ගනුදෙනුවල වටිනාකම ඉහළ යන බැවින් වැඩි වැඩියෙන් මුදල් ශේෂ ළඟ තබා ගැනීමට සිදු වනු ඇත.


- අනාගත උද්ධමන අනුපාතිකය ඉහළ යතියි අපේක්ෂා කෙරේ නම් මුදල් ශේෂවල මූර්ත අගය අඩු විය හැකි බැවින් මුදල් ශේෂ ළඟ තබා ගැනීමට ඇති ඉල්ලුම අඩු විය හැකි ය. මුදල් වෙනුවට මූර්ත වත්කම් ඉල්ලුම් කිරීමට නැඹුරු වනු ඇත.

**(ඕනෑම කරුණු දෙකකට ලකුණු 02යි)**

(iv)- සමාහාර සැපයුමට සාපේක්ෂව සමාහාර ඉල්ලුම ඉහළ යාම නිසා, භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යාම මඟින් පොදු මිල මට්ටමෙහි හට ගන්නා අඛණ්ඩ ඉහළ යාම, ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය ලෙස හැඳින්වේ.

**(ලකුණු 01යි)**


- ප්‍රස්තාරික නිරූපණය:




**(නිවැරදි රූප සටහනකට ලකුණු 01යි)**

- පිරිවැයෙන් තල්ලු වුණු උද්ධමන ප්‍රවේශයෙන් දැක්වෙන්නේ, යෙදවුම් මිල හෙවත් නිෂ්පාදන පිරිවැය ඉහළ යාම නිසා සමාහාර සැපයුම අඩු වීමෙන් භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යාම මඟින් පොදු මිල මට්ටමේ අඛණ්ඩ ඉහළ යාමක් හට ගත හැකි බව ය.

ප්‍රස්තාරික නිරූපණය: පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනය




(නිවැරදි රූප සටහනකට ලකුණු 01යි)

(v) **දේශීය මුදල් වෙළෙඳපොළෙහි අධි ද්‍රවශීලතාවක් දක්නට ලැබීමට හේතු:**

- මහ බැංකුව විසින් දේශීය/විදේශීය විනිමය වෙළෙඳපොළින් විදේශ විනිමය මිල දී ගැනීම ඉහළ යාම.
- මහ බැංකුව බලපත්‍රලාභී බැංකු (ලංකා බැංකුව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව) සමඟ විදේශ විනිමය හුවමාරු ගිවිසුම්වලට (SWAP arrangements) එළැඹීම මඟින් එම බැංකුව විසින් ලබා ගත් විදේශ විනිමය මහ බැංකුව විසින් මිල දී ගැනීම.
- පෞද්ගලික අංශය විසින් සාංගමික ණයකර හා කොටස්, විදේශ ආයෝජකයන් නිකුත් කිරීම තුළින් උපයාගත් විදේශ විනිමය මහ බැංකුව විසින් මිල දී ගැනීම.
- මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළෙන් භාණ්ඩාගාර බිල්පත්‍ර මිල දී ගැනීම.
- මහ බැංකුවේ ලාභයෙන් කොටසක් රජයට ලබා දීම.
- 2013 ජූලි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි මහ බැංකුවේ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 2 කින් පහළ හෙළීම.
- බැංකු පද්ධතිය වෙතින් පෞද්ගලික අංශය ලබා ගත් ණය පහළ වැටීම.


**(ඕනෑම කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 03යි)**

**අධි ද්‍රවශීලීතාව අවශෝෂණය කර ගැනීම සඳහා ගනු ලැබූ ක්‍රියා මාර්ග:**

- දෛනික විවට වෙළෙඳපොළ කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම.
- විවිට වෙළෙඳපොළ කටයුතු සඳහා යොදා ගත හැකි මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් තොගය ප්‍රමාණවත් නො වූ හෙයින් අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම සඳහා අනිකුත් ආයතනවලින් (උදා: සේවක අර්ථසාධක අරමුදල) ණයට ගත් සුරැකුම්පත් යොදා ගැනීම.
- නිත්‍ය තැන්පතු පහසුකම (SDF) හඳුන්වා දීම.
- කාලීන ප්‍රති මිල දී ගැනීම් වෙන්දේසි පැවැත්වීම.
- වාණිජ බැංකු සතු අධි ද්‍රවශීලතාව ණය ලබා දීම් ඔස්සේ පෞද්ගලික අංශයට යොමු කිරීම් වස් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතික යටතේ නිත්‍ය තැන්පතු පහසුකම් සඳහා ප්‍රවේශ වීමේ ඉඩකඩ සීමා කිරීම (මසකට 3 වරක් පමණි.)


**(ඕනෑම කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 03යි)**

**06 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




06 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 83%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 42%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 34%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 20%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 4%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 5 ක් ඇති අතර (i) කොටසෙහි පහසුතාව උපරිම වුව ද එහි පහසුතාව 72% කට සීමා වී ඇත. පහසුතාව අඩු ම අනු කොටස v (අ) වන අතර, එහි පහසුතාව 15% ක් පමණි. ii, iii, iv, v කොටස් 4 හි පහසුතා පොදුවේ ගත්විට 42% ට වඩා අඩු මට්ටමක පවතී.

* i කොටස, 72% ක පහසුතාවක් පෙන්වයි. මෙම කොටසෙන් විමසා ඇත්තේ මුදල් නිර්වචනය කොට එය බාටර් ක්‍රමයේ දුෂ්කරතා ඉවත් කරලීමට සමත් වූයේ කෙසේ ද යන්න පිළිබඳවයි. අපේක්ෂකයින්ගෙන් 28% කට පමණ මෙම ප්‍රශ්නය දුෂ්කර වීමට හේතු වී ඇත්තේ මුදල් නිර්වචනය කර ගැනීමේ හැකියාව තිබුණත් එය බාටර් ක්‍රමයේ ප්‍රබල දුෂ්කරතා ඉවත් කිරීමට සමත් වූයේ කෙසේද යන්න පැහැදිලි කිරීමේ නොහැකියාව නිසයි. එබැවින් මුදල් භාවිතය බාටර් ක්‍රමයේ දුෂ්කරතා ඉවත් කිරීමට සමත්ව ඇති ආකාරය පිළිබඳ දැනුම සිසුන් තුළ පෝෂණය කරන්න.

* ii කොටසෙහි දුෂ්කරතාව 59% කි. ඉහළ දුෂ්කරතා මට්ටමකට හේතු වූ මෙම ගැටලුව මගින් විමසන්නේ ණයපත් මුදල් නොවන්නේ මන්ද යන්නයි. මෙහි ඉහළ දුෂ්කරතාවට හේතු වී ඇත්තේ ණය පත් යනු කුමක් ද යන්න සහ ණය පත් මුදල් නොවන්නේ කුමන සාධක නිසා ද යන්න දැන නො සිටීම නිසා ය. එබැවින් ණය පත් ඇතුළු මුදල් ආදේශකවල ගුණාංග සහ මුදල්වල ගුණාංග පැහැදිලි කරමින් ණය පත් මුදල් නො වීමට හේතු අවධාරණය කළ යුතුය.

* iii කොටසේ පහසුතාව 26% කි. මෙම කොටස මගින් විමසන්නේ මුදල් ඉල්ලුම තීරණය කරන සාර්ව ආර්ථික විචල්‍යයන් සහ එම විචල්‍යයන්ගේ වෙනස් වීම මුදල් ඉල්ලුම කෙරෙහි බලපාන ආකාරය පිළිබඳවය. සිසුන් වැඩි දෙනෙකු මුදල් සඳහා ඉල්ලුමක් ඇති වීමට බලපාන සාධක එනම් ගනුදෙනු, ආරක්ෂණ, සමපේක්ෂණ යන චේතනා මුදල් ශේෂ ළඟ තබා ගැනීමට බලපෑ හේතු යැයි වැරදි ලෙස වටහා ගෙන ඇත. එම නිසා සාර්ව ආර්ථික විචල්‍යයන් සහ ඒවා අතරින් මුදල් ඉල්ලුම තීරණය කරන විචල්‍යයන් සහ එම විචල්‍යයන්හි වෙනස් වීම මුදල් ඉල්ලුම කෙරෙහි බලපාන ආකාරයත් පිළිබඳ දැනුම හා විශ්ලේෂණ කුසලතා සිසුන් තුළ වර්ධනය කළ යුතුය. පිළිතුර වඩා හොඳින් අධ්‍යයනය කර අදාළ සාර්ව ආර්ථික විචල්‍ය හඳුනා ගන්න.

* iv කොටස ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය හා පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනය අතර වෙනස හා එම තත්වයන් ප්‍රස්තාරිකව නිරූපණය කිරීම පිළිබඳ දැනුම හා කුසලතා විමසීමට යොමු වූ ප්‍රශ්නයකි. මෙහි දුෂ්කරතාව 63% ක් වීම මගින් අනාවරණය වන්නේ අපේක්ෂකයින් වැඩි දෙනෙකු මේ පිළිබඳ නිවැරදි දැනුම හා කුසලතා ලබා නොමැති බවයි. එබැවින් උක්ත මාතෘකා පිළිබඳ දැනුම, ප්‍රස්තාර මගින් පැහැදිලි කිරීමේ කුසලතා වර්ධනය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලය සංවිධානය කර ගත යුතුය. ප්‍රස්තාර මගින් පිළිතුර ඉදිරිපත් කිරීමේ දී නිවැරදි ව අක්ෂ නම් නො කිරීම ලකුණු අඩු වීමට හේතුවකි.

* v කොටස ප්‍රශ්නයේ 85% ක් වූ ඉහළ ම දුෂ්කරතාව පෙන්වයි. මෙම කොටස මගින් විමසා ඇත්තේ ශ්‍රී ලංකාවේ මුදල් වෙළෙඳපොළෙහි ඉහළ අධි ද්‍රවශීලතාවට හේතු සහ එම අධි ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීමට මහ බැංකුව ගෙන ඇති ක්‍රියා මාර්ග පිළිබඳවයි. අපේක්ෂකයින් ඉහළ පිරිසකට ගැටලුව දුෂ්කර වී ඇත්තේ උක්ත ගැටලුව පිළිබඳ නිවැරදි දැනුම නොතිබුණු බැවිනි. එම නිසා ශ්‍රී ලංකාවේ මුදල් වෙළෙඳපොළෙහි අධි ද්‍රවශීලතාවට හෝ ඌණ ද්‍රවශීලතාවට බලපාන කාලීන හේතු හා එම තත්වයන් ඉදිරියේ මහ බැංකුව ගත් ක්‍රියා මාර්ග පිළිබඳ දැනුම යාවත්කාලීන කළ යුතුය. මහ බැංකු වාර්තාවේ විශේෂ සටහන් කියවීමට ශිෂ්‍යයා නැඹුරු වන්නේ නම් කාලීන තොරතුරු ඇතුළත් මෙවැනි ප්‍රශ්නවලට සාර්ථක ව පිළිතුරු සැපයිය හැකිය.

## 07 ප්‍රශ්නය

**7.** (i) 'ශුද්ධ පොදු භාණ්ඩ' සහ 'ශුභසාධන භාණ්ඩ' අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 04 යි)

(ii) කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ දී බාහිර පිරිවැය හටගන්නා අවස්ථාවක, සම්පත් කාර්යක්ෂමව බෙදා වෙන්කරලීමෙහි ලා වෙළෙඳපොළ ක්‍රමය අසමත් වන්නේ ඇයි දැයි යෝග්‍ය ප්‍රස්තාර සටහනක් උපයෝගී කර ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iii) සමානුපාතික බද්ද, අනුක්‍රම බද්ද සහ ප්‍රතික්‍රම බද්ද නිර්වචනය කරන්න. (ලකුණු 03 යි)

(iv) 'බදු අය කිරීමේ අධිබර' (excess burden of taxation) යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? කිසියම් භාණ්ඩයක නිෂ්පාදකයන් මත ඒකක බද්දක් පනවනු ලැබුවහොත් හටගනු ලබන 'අධි බදු බර' ප්‍රස්තාර සටහනක් ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 05 යි)

(v) "ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය, ආණ්ඩුවේ අයහාරය සමග සංසන්දනය කිරීමේ දී වඩාත් කනස්සලුකාරී ස්වරූපයක් පෙන්නුම් කරයි." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(07) (i) - ශුද්ධ පොදු භාණ්ඩයක පරිභෝජනය සීමා කළ නොහැක. එබඳු භාණ්ඩයක් සැපයූ විට එම භාණ්ඩයෙන් ලැබෙන ප්‍රතිලාභ පරිභෝජකයන් අතර සීමා කළ හැකි නො වේ. පොදු භාණ්ඩවල දක්නට ඇත්තේ සාමූහික පරිභෝජන ලක්ෂණයයි. **(ලකුණු 04යි)**

- ශුද්ධ පොදු භාණ්ඩයක පරිභෝජනයේ තරගකාරීත්වයක් දක්නට නොමැත. එක් පුද්ගලයෙක් විසින් කරනු ලබන පරිභෝජනය නිසා තවත් පුද්ගලයෙකුට එම භාණ්ඩයෙන් සැපයෙන ප්‍රමාණයෙහි අඩුවක් හට නො ගනී. **(ලකුණු 04යි)**

- ශුභසාධන භාණ්ඩයක් යනුවෙන් අදහස් කරනුයේ කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් පරිභෝජනය කිරීමේ දී, එම පරිභෝජනයේ ප්‍රතිලාභය එම භාණ්ඩය පරිභෝජනය කළ පුද්ගලයාට මෙන් ම, තවත් බාහිර පාර්ශ්වයන්ට භුක්ති විඳිය හැකි වීම ය. එබඳු භාණ්ඩයක පරිභෝජනයේ සමාජ ප්‍රතිලාභ එහි පෞද්ගලික ප්‍රතිලාභ ඉක්මවා යයි.

- ශුභසාධන භාණ්ඩ, වෙළෙඳපොළ මඟින් සැපයෙන විට එම භාණ්ඩ ඌණ පරිභෝජනයකට පාත්‍ර වීමේ නැඹුරුවක් පවතී.
  උදා :- අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා **(ලකුණු 02යි)**


(ii) - නිෂ්පාදන ක්‍රියාවලියේ දී බාහිර පිරිවැය හට ගන්නා විට, සම්පත් කාර්යක්ෂමව බෙදා වෙන්කර ලීමේ ලා වෙළෙඳපොළ ක්‍රමය අසමත් වන්නේ වෙළෙඳපොළ තුළ තීරණ ගැනීමේ ක්‍රියාවලියට බාහිර පිරිවැය ඇතුළත් කර නො ගන්නා බැවිනි.

- නිෂ්පාදන ක්‍රියාවලියේ දී බාහිර පිරිවැය හට ගන්නා විට, නිෂ්පාදනයේ සමාජ පිරිවැය, පෞද්ගලික පිරිවැය ඉක්මවා යයි. එහෙත් වෙළෙඳපොළ තුළ තීරණ ගනු ලබන්නේ පෞද්ගලික පිරිවැය සහ පෞද්ගලික ප්‍රතිලාභය පමණක් සැලකිල්ලට ගනිමිනි.

- බාහිර පිරිවැය සැලකිල්ලට නො ගත් විට, නිෂ්පාදනයේ සැබෑ පිරිවැය ඌණ තක්සේරුවට ලක්වන අතර, වෙළෙඳපොළ තුළ තීරණය වන සමතුලිත නිමැවුම සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම් මට්ටම ඉක්මවා යනු ඇත. එහි දී හිඟ සම්පත් අධි පරිභෝජනයට ලක් වේ. එබැවින් එය අකාර්යක්ෂම ලෙස සම්පත් බෙදා වෙන් කිරීමක් පෙන්නුම් කරයි.

**(ලකුණු 03යි)**

- යෝග්‍ය ප්‍රස්තාර සටහන :




බාහිර පිරිවැය සැළකිල්ලට නොගත් විට, වෙළෙඳපොළේ සමතුලිත නිමැවුම $Q_m$ වන අතර, බාහිර පිරිවැය සැලකිල්ලට ගත් විට සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම් මට්ටම විය යුත්තේ $Q_s$ ය. **(නිවැරදි ප්‍රස්ථාරයට ලකුණු 02යි)**

(iii)- **සමානුපාතික බද්ද** : බදු පදනම විශාල වීමත් සමඟ අය කරනු ලබන බදු අනුපාතිකය නො වෙනස්ව පවතින්නේ නම් එය සමානුපාතික බද්දක් වේ.
ආදායමෙන් ස්ථාවර ප්‍රතිශතයක් බදු වශයෙන් අය කෙරේ.

**(ලකුණු 01යි)**

- **අනුක්‍රම බද්ද** : බදු පදනම විශාල වීමත් සමඟ අය කරනු ලබන බදු අනුපාතිකයන් ක්‍රමයෙන් ඉහළ නගී නම් එය අනුක්‍රම බද්දක් ලෙස හැඳින්වේ.
ආර්ථික වශයෙන් වඩා ශක්තිමත් අය, ශක්තියෙන් අඩු අයට වඩා වැඩි ප්‍රතිශතයක් බදු වශයෙන් ගෙවති. **(ලකුණු 01යි)**

- **ප්‍රතික්‍රම බද්ද** : බදු පදනම විශාල වීමත් සමඟ අය කරනු ලබන බදු අනුපාතිකය ක්‍රමයෙන් පහළ වැටේ නම් එය ප්‍රතික්‍රම බද්දක් ලෙස සැළකේ. ආදායම ඉහළ යන විට බදු ප්‍රතිශතය පහළ වැටුනත්, නිරපේක්ෂ බදු මුදල ඉහළ යාමට පිළිවන.

**(ලකුණු 01යි)**


(iv)- බද්දක් පැනවීම නිසා වෙළෙඳපොළ තුළ කුටුම්බ හා නිෂ්පාදන ආයතනවල තීරණ ගැනීමේ ක්‍රියාවලිය විකෘති වීම මඟින්, බද්ද නිසා ඇරීමට සිදුවන මූල්‍යමය බදු බරට අමතරව, තවත් අතිරේක බදු බරක් ආර්ථිකය මත පතිත වේ නම් එය බදු අය කිරීමේ අධිබර ලෙස හැඳින්වේ.

- බද්දේ බලපෑම නිසා නිෂ්පාදන ආයතනය සහ කුටුම්බ විසින් නිෂ්පාදනය හා පරිභෝජනය පිළිබඳව කරනු ලබන තේරීම් වෙනස් කිරීමට සිදු වේ. උදාහරණයක් වශයෙන් භාණ්ඩයක් මත බද්දක් පැන වූ පසු භාණ්ඩයේ මිල ඉහළ යන බැවින්, කුටුම්භ විසින් මිල දී ගනු ලබන ප්‍රමාණය සහ ආයතන නිපදවනු ලබන ප්‍රමාණය අඩු විය හැකිය. ශ්‍රම ආදායම් මත බදු පැන වූ විට, සපයනු ලබන ශ්‍රම ප්‍රමාණය වෙනස් කිරීමට නැඹුරුවක් පවතී.

- බදු ගැනීම නිසා මෙලෙස තීරණ ගැනීමේ ක්‍රියාවලිය විකෘති වීමෙන් නිෂ්පාදකයන්ට හා පාරිභෝගිකයන්ට අහිමිවන ආර්ථික අතිරික්තයේ ප්‍රමාණය අධි බදු බර ලෙස පෙන්වා දිය හැකි ය එය මූල්‍යමය බදු බරට අමතරව හට ගන්නා අතිරේක බදු බරකි.

**(ලකුණු 03යි)**

- අධි බදු බර ප්‍රස්තාර සටහනක් ඇසුරින් පෙන්වීම.




(නිවැරදි ප්‍රස්තාරයට ලකුණු 01යි)

(iv) - ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය බරෙහි විශාලත්වය බොහෝ විට පෙන්නුම් කරනු ලබන්නේ ද.දේ. නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙනි. ණය බරෙහි සැබෑ තත්ත්වය එමඟින් නිවැරදිව නිරූපණය නො වේ. උදාහරණයක් වශයෙන් පහත දත්ත දැක්විය හැකිය. මුළු ණය ද.දේ නිෂ්පාදිතය ප්‍රතිශතයක් ලෙස:

2010 - 81.9%     2011 - 78.5%

2012 - 79.2%     2013 - 78.3%

මෙම දත්ත දෙස බැලූ විට සතුටුදායක ප්‍රවණතාවක් ඇතැයි කිසිවෙකුට නිගමනය කිරීමට පිළිවන.

- එහෙත් සැබැවින් ම ශ්‍රී ලංකාව ඉතා බරපතල අන්දමින් ණය බර ප්‍රශ්නයෙන් පීඩනයට පත්ව සිටී. එහි බරපතල බව නිවැරදිව අවබෝධ කර ගත හැක්කේ ණය පරිමාව ද.දේ. නිෂ්පාදිතය සමඟ සැසඳීමෙන් නො ව ආර්ථිකයේ ණය සේවාකරණ ධාරිතාව පෙන්නුම් කරන රාජ්‍ය අයභාරයේ ප්‍රතිශතයක් වශයෙන් ගත් විට ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතී.


2011 - 530%     2013 - 597%

2012 - 571%     2014 - 618%

- ණය සේවාකරණ ගෙවීම් රාජ්‍ය අයභාරයේ ප්‍රතිශතයක් වශයෙන් ගත් වීට ද දැකිය හැක්කේ දැඩි කනස්සලුකාරී ස්වභාවයකි. 2013 වර්ෂයේ දී ණය සේවාකරණ ගාස්තු මුළු රාජ්‍ය අයභාරයෙන් 102.2% ක් විය. මෙය ඉතා බරපතල තත්වයකි. රජයේ අනිකුත් වියදම් පියවා ගැනීම කෙසේ වෙතත්, ණය ආපසු ගෙවීමටත් ණය ලබා ගැනීමට සිදුව ඇති තත්ත්වයකි. ශ්‍රී ලංකාව දැනටමත් ණය පාෂයකට හසුව ඇති බව තහවුරු කරන්නකි. මෙම තත්වය නිවැරදි කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග නොගත හොත් ණය ගෙවීම් පැහැර හැරීම් වැනි බරපතල අර්බුදකාරී තත්ත්වයකට ආර්ථිකය මුහුණ දිය හැකිය.


(ලකුණු 03යි)

**07 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




07 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 69%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 34%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 32%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 26%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 8%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 5 ක් ඇති අතර iii කොටස පහසු ම ප්‍රශ්නය වී ඇත. එහි පහසුතාව 69%කි. පහසුතාව අඩු ම කොටස v වී ඇති අතර, එහි පහසුතාව 14%කි. i, ii, iv කොටස්වල පහසුතා පිළිවෙළින් 67%, 40% සහ 31% වේ.

- ⋆ i කොටස 67% ක පහසුතාවක් පෙන්නුම් කරයි. වැඩි දෙනෙකුට ශුද්ධ පොදු භාණ්ඩ සහ ශුභසාධන භාණ්ඩ විස්තර කර ගැනීමට හැකි වී ඇත. තව දුරටත් මෙම සංකල්ප සහ ඊට ගැළපෙන නිදසුන් විස්තර කිරීමේ දැනුම ලබා දිය යුතුය.

- ⋆ ii කොටසින් විමසා ඇත්තේ නිෂ්පාදන ක්‍රියාවලියේ දී බාහිර පිරිවැයක් හට ගැනීම නිසා සම්පත් බෙදා වෙන් කිරීමේ ලා වෙළෙඳපොළ අසමත් වන්නේ කෙසේ ද යන්නයි. මෙම ගැටලුව සම්බන්ධයෙන් අපේක්ෂකයින් 60% ක දුෂ්කරතාවක් පෙන්නුම් කරන්නේ නිෂ්පාදන ක්‍රියාවලියේ බාහිර පිරිවැයක් පවතින විට වෙළෙඳපොළේ අධි නිෂ්පාදනයක් සිදු වීම පිළිබඳ දැනුම හා එය ප්‍රස්තාරිකව නිරූපණය කිරීමේ කුසලතාව නොතිබූ හෙයිනි.

- ⋆ iii කොටසේ පහසුතාව 69% කි. මෙම කොටසින් විමසා ඇත්තේ බදු අනුපාතික ව්‍යුහය අනුව බදු වර්ග නිර්වචනය කිරීමයි. අපේක්ෂකයින් කිසියම් ප්‍රතිශතයක් එම හැකියාව නො පෙන්වයි. එම නිසා අනුක්‍රමික, ප්‍රතික්‍රමික, සමානුපාතික බදු නිර්වචනය කිරීම, නිදසුන් දැක්වීම පිළිබඳ කුසලතා වර්ධනය කළ යුතුය.

- ⋆ iv කොටසින් විමසනු ලබන්නේ බදු අය කිරීමක අධි බදු බර සහ එය ප්‍රස්තාරිකව නිරූපණය කරන ආකාරය පිළිබඳවයි. මෙහි පහසුතාව 31% කි. මින් නිරූපණය වන්නේ අපේක්ෂකයින් බහුතරයකට ගැටලුව ඉතා දුෂ්කර වී ඇති බවයි. ඊට හේතුව අධි බදු බර සංකල්පය විස්තර කිරීමේ නොහැකියාවයි. එම කුසලතාව වර්ධනය කළ යුතු මට්ටමක පවතී,

  බදු අය කිරීමේ අධිබර හෙවත් අධි බදු බර, යන සංකල්පය පැහැදිළි කිරීමේ දී ළමුන් ප්‍රස්තාර සටහන මගින් මෙම සංකල්පය ඉදිරිපත් කිරීමට සමත් වුව ද, අධි බදු බර සංකල්පය විස්තර කිරීමට අසමත් වී ඇත. එම නිසා බද්දේ අධි බදු බර නිවැරදිව නිර්වචනය කර ගැනීම සඳහා යොමු විය යුතුය. ඒ සඳහා ලකුණු ලබා දීමේ පටිපාටියෙහි අදාළ පිළිතුර අධ්‍යයනය කිරීමෙන් සාර්ථක පිළිතුරක් ගොඩ නගා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

- ⋆ වැඩිම දුෂ්කරතාවක් පෙන්වන මෙම කොටසෙහි දුෂ්කරතාව 86% කි. ප්‍රශ්නයෙන් විමසා ඇත්තේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය, නිරපේක්ෂ හා සාපේක්ෂ ප්‍රමාණය පිළිබඳ දැනුම සහ එය ආර්ථිකය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අවබෝධයයි. සිසුන් දැක්වූ ප්‍රතිචාර සතුටුදායක නො වූ බැවින් රාජ්‍ය ණය පිළිබඳ ප්‍රවණතා සහ එහි ප්‍රතිවිපාක පිළිබඳ දැනුම යාවත්කාලීන කළ යුතුය. රජයේ ආදායම සහ ණය ප්‍රමාණය, පිළිබඳ දත්ත මතකයේ තබා ගත යුතුය.

## 08 ප්‍රශ්නය

**8.** (i) අන්තර්ජාතික වෙළෙඳාම ඔස්සේ රටවලට ලබාගත හැකි ප්‍රතිලාභ කවරේ ද? (ලකුණු 04 යි)

(ii) වෙළෙඳ ආරක්ෂණවාදයට පක්ෂව ඉදිරිපත් කොට ඇති ප්‍රධාන ආර්ථික තර්ක සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) රටක ජාත්‍යන්තර තරගකාරිත්වය නිර්ණය වීම කෙරෙහි බලපාන සාධක කවරේ ද? (ලකුණු 04 යි)

(iv) එක්තරා කල්පිත ආර්ථිකයක ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුමට අදාළ ගනුදෙනුවල සාරාංශයක් පහත සඳහන් වගුවේ දැක්වේ. (සියලු ම සංඛ්‍යා රුපියල් මිලියනවලිනි.)

| අයිතමය | බැර | හර | අයිතමය | බැර | හර |
|---|---|---|---|---|---|
| වෙළෙඳ භාණ්ඩ | 800 | 1200 | මුහුදු ප්‍රවාහන | 180 | 150 |
| සේවක වැටුප් | 5 | 10 | පොලී ආදායම් | – | 35 |
| මූල්‍ය සේවා | 25 | 30 | සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 285 | 50 |
| ලාභාංශ | 10 | 70 | සංචාරක | 140 | 100 |
| ගුවන් ප්‍රවාහන | 100 | 60 | විදුලි සංදේශ සේවා | 75 | 30 |
| ආණ්ඩුවේ සංක්‍රාම | 15 | – | මූල්‍ය නොවන රත්‍රන් | 5 | 55 |

ඉහත දත්ත ඇසුරෙන් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) වෙළෙඳ ශේෂය (ලකුණු 01 යි)

(ආ) භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය (ලකුණු 01 යි)

(ඉ) ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය (ලකුණු 01 යි)

(ඊ) ද්විතියික ආදායම් ගිණුමේ ශේෂය (ලකුණු 01 යි)

(v) පාවෙන විනිමය අනුපාතික ක්‍රමයක් යටතේ, පහත සඳහන් දේශීය සාධක විනිමය අනුපාතිකය කෙරෙහි බලපානුයේ කවර ආකාරයකින්ගෙන් දැයි පැහැදිලි කරන්න.

(අ) මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ ඉහළ නැගීමක් (ලකුණු 02 යි)

(ආ) උද්ධමන අනුපාතිකයේ පහළ වැටීමක් (ලකුණු 02 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(08) (i) - විශේෂ ප්‍රාගුණ්‍යය කළ ක්ෂේත්‍රයන්හි නිෂ්පාදනය සිදුවන විට ඵලදායිතාව ඉහළ නගින අතර, එය ආර්ථික වෘද්ධිය වේගවත් කර ගැනීමටත්, ජීවන තත්ත්වය ඉහළ නංවා ගැනීමටත් ඉවහල් වේ.

- ගෝලීය තරගකාරීත්වය සහ අඩු පිරිවැයට ආනයනය කිරීමට හැකි වීම නිසා උද්ධමන පීඩන ඇතිවීමට ඇති හැකියාව බෙහෙවින් අඩු වේ.

- විවෘත ආර්ථිකයක් ඔස්සේ තාක්ෂණය දියුණු වීමටත්, නව්‍යතා ප්‍රවර්ධනයටත් නව අදහස් හා ආකල්ප රට තුළට ප්‍රවේශ වීමටත් අවස්ථාව උදාවේ.

- අපනයනාභිමුඛ නිෂ්පාදන ක්ෂේත්‍රයේ සේවා නියුක්ත වූවන්ට ඉහළ වැටුප් හා ආදායම් ලබා ගැනීමට අවස්ථාව සැලසේ.

- විදේශ වෙළෙඳාම මත පනවන බදු නිසා රාජ්‍ය අයභාරය පුළුල් වේ.

- රට තුළ නිපදවිය නොහැකි භාණ්ඩ පරිභෝජනය කිරීමට අවස්ථාව සැලසේ.

- විදේශ ආයෝජන ආකර්ශණීය කර ගැනීමට ද, අනුබලයක් සැපයේ.

**(ඕනෑම කරුණු හතරකට ලකුණු 04යි)**

(ii) ආරක්ෂණවාදයට පක්ෂ ආර්ථික තර්ක
- ළදරු කර්මාන්ත ආරක්ෂාකර ගැනීම.
- ප්‍රපතනය වළක්වා ගැනීම.
- උපාය මාර්ගික වැදගත්කමක් උසුලන නිෂ්පාදන ක්ෂේත්‍ර ආරක්ෂාකර ගැනීම.
- සේවා නියුක්තිය ආරක්ෂාකර ගැනීම.
- දේශීය ආර්ථිකය විවිධාංගීකරණය කර ගැනීමේ අවශ්‍යතාව.
- ආණ්ඩුවේ අයභාර මූලාශ්‍රයක් වීම.
- ගෙවුම් ශේෂය ශක්තිමත්කර ගැනීම.
- ස්වයංපෝෂිත දේශීය ආර්ථිකයක් ගොඩනංවා ගැනීම.

**(ඕනෑම කරුණු හතරකට ලකුණු 04යි)**

(iii)
- ඵලදායීතාව.
- සාර්ව ආර්ථික ස්ථායීතාව.
- යටිතල පහසුකම්.
- පර්යේෂණ හා සංවර්ධනය සඳහා කෙරෙන ආයෝජන.
- බදු ව්‍යුහය.
- විනිමය අනුපාතයේ ස්ථාවරත්වය.
- නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය.
- ව්‍යාපාර කිරීමේ පිරිවැය (Cost of Doing Business)
  - නියාමන ක්‍රමයේ ස්වභාවය
  - ශ්‍රම වෙළෙඳපොළ හිමිකම සුරක්ෂිත වීම.
  - රාජ්‍ය පරිපාලනයේ කාර්යක්ෂමතාව.
  - පෞද්ගලික දේපොළ හිමිකම් සුරක්ෂතවීම.
  - නීතියේ ආධිපත්‍යය.
  - යහපාලනය.

**(එක් කරුණකට ලකුණු 02 බැගින් ඕනෑම කරුණු දෙකකට ලකුණු 04යි)**

(iv) (අ) වෙළෙඳ ශේෂය = වෙළෙඳ භාණ්ඩ + මූල්‍ය නොවන රත්‍රන්
= (800-1,200) + (5 - 55)
= -400 + (-50)
= -450
= <u>රුපි. මිලියන -450</u>

**(ලකුණු 01යි)**

(ආ) භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය:
භාණ්ඩ + සේවා = -450 + සේවා
සේවා = මුහුදු ප්‍රවාහන + ගුවන් ප්‍රවාහනය + සංචාරක + මූල්‍ය සේවා + විදුලි සංදේශ සේවා
සේවා = [30 + 40 + 40 + (-5) + 45] = 150
භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය = -450 + 150 = -300

**(ලකුණු 01යි)**

(ඉ) **ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය:**
සේවක වැටුප් + ලාභාංශ + පොලී ආදායම්
= -5 + (-60) + (-35) = -100
ප්‍රාථමික ගිණුමේ ශේෂය = <u>රුපි. මිලියන 100</u>

**(ලකුණු 01යි)**

(ඊ) **ද්විතියික ආදායම් ගිණුමේ ශේෂය:**

= ආණ්ඩුවේ සංක්‍රාම + සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ

= 15 + 235 = 250

= රුපි. මිලියන 250

**(ලකුණු 01යි)**

(iv) (අ) **මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ ඉහළ නැගීම:**

- මූර්ත දළ දේශිය නිෂ්පාදිතය ඉහළ යන විට, ආනයන ඇතුළු භාණ්ඩ හා සේවා සඳහා මහජනතාව විසින් කරනු ලබන ඉල්ලුම ද වැඩිවේ. ආනයන ඉල්ලුම වැඩි වන විට, සිදුවන්නේ විදේශීය මුදල් ලබා ගැනීම සඳහා සපයනු ලබන දේශිය මුදල් ප්‍රමාණය වැඩි වීම යි. විදේශ විනිමය මිලට ගැනීමට සැපයෙන දේශීය මුදල් ප්‍රමාණය වැඩි වන විට, විදේශ මුදලට සාපේක්ෂව, දේශීය මුදලේ වටිනාකම පහළ වැටේ. විනිමය අනුපාතිකය ක්ෂය වීමක් ලෙස මෙය හඳුන්වනු ලැබේ.


**(ලකුණු 02යි)**

(ආ) **උද්ධමන අනුපාතිකයේ පහළ වැටීමක්:**

- රටක උද්ධමන අනුපාතිකය පහළ වැටෙන විට, එම රටේ අපනයන තරගකාරිත්වය ඉහළ යනු ඇත. අපනයන සඳහා විදේශිකයන්ගේ ඉල්ලුම වැඩි වන විට, දේශීය මුදල් ඒකක සඳහා විදේශීකයන්ගේ ඉල්ලුම ද වැඩි වේ. එවිට විදේශීය මුදලට සාපේක්ෂව, දේශීය මුදල් ඒකකයේ වටිනාකම ඉහළ යනු ඇත. විනිමය අනුපාතිකයේ අගය වැඩි වීමක් ලෙස මෙය හඳුන්වනු ලබයි.


**(ලකුණු 02යි)**

## 08 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




08 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 31%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 50%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 37%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 11%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 2%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 5 ක් ඇති අතර i කොටස වඩාත් ම පහසු වී ඇත. එහි පහසුතාව 63%කි. පහසුතාව අඩු ම කොටස iv වී ඇති අතර, අ, ආ, ඉ, ඊ වශයෙන් එහි කොටස් 4 ක් ඇත. ඒවායේ පහසුතාව පිළිවෙළින් 10%, 10%, 16% හා 20% වේ. v කොටසෙහි "අ" හා "ආ" යන කොටස්වල පහසුතාව අඩු මට්ටමක පවතී. එය පිළිවෙළින් 12% හා 20% වේ.

- i කොටසෙහි පහසුතාව 63% කි. අදාළ ගැටලුවෙන් විමසා ඇත්තේ අන්තර් ජාතික වෙළෙඳාමෙන් රටවලට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව ය. සිසුන් යම් පිරිසකට මෙම ගැටලුව දුෂ්කර වී තිබෙන්නේ ජාත්‍යන්තර වෙළෙඳාමෙන් රටකට ලැබෙන ප්‍රතිලාභ හා එහි පිරිවැය පිළිබඳ දැනුම ප්‍රමාණවත් නො වූ නිසයි.

- ii කොටසින් විමසා ඇත්තේ වෙළෙඳාමේ ආරක්ෂණවාදයට පක්ෂව ඉදිරිපත් කෙරෙන තර්ක පිළිබඳවයි. එම ගැටලුවේ පහසුතාව 55% කි. 45% ක් වූ දුෂ්කරතාව කෙරෙහි ආරක්ෂණවාදයට පක්ෂව ඉදිරිපත් වන තර්ක පිළිබඳව දැනුම ප්‍රමාණවත් නොවීම හේතු වී ඇත.

- iii කොටස ජාත්‍යන්තර වෙළෙඳාමේ තරගකාරීත්වය තීරණය වීමට බලපාන සාධක පිළිබඳව විමසයි. මෙම කොටසෙහි 83% ක දුෂ්කරතාවට හේතු වී ඇත්තේ ජාත්‍යන්තර වෙළෙඳාමේ තරගකාරීත්වය හා ඊට හේතුවන සාධක නිවැරදිව විග්‍රහ කර ගැනීමේ දැනුම නොමැති වීමයි. ප්‍රායෝගික හේතු සහිතව ජාත්‍යන්තර වෙළෙඳාමේ තරගකාරිත්වය විග්‍රහ කර ගැනීමේ දැනුම වර්ධනය කළ යුතුය.

- iv කොටසින් අපේක්ෂා කරන්නේ දී ඇති තොරතුරු පදනම් කරගෙන ගෙවුම් ශේෂ ලේඛනයේ විවිධ ගිණුම්වල ශේෂයන් ගණනය කර ගැනීමේ කුසලතාව විමසීම යි. මෙම කොටසෙහි (අ), (ආ), (ඉ), (ඊ) අනු කොටස්වල පහසුතාව පිළිවෙළින් 10%, 10%, 16% හා 20% වැනි පහළ මට්ටම්වල පැවතීමෙන් පෙනී යන්නේ අපේක්ෂිත කුසලතාව බහුතර සිසුන් තුළ නොමැති බවයි. එබැවින් ගෙවුම් තුලනයේ උප ගිණුම්වලට අයත් සංරචක, විශේෂයෙන් මූල්‍ය නොවන රන් වෙළෙඳ ගිණුමේ සංරචකයක් ලෙස ගෙන, එම ගිණුමේ ශේෂයන් පිළියෙල කිරීමේ කුසලතා වර්ධනය කළ යුතුය.

- v කොටසෙහි (අ) සහ (ආ) අනු කොටස් මගින් විමසන්නේ විවිධ සාධක මත නම්‍ය විනිමය අනුපාතය වෙනස්වන ආකාරය පිළිබඳවයි. එම කොටස්වල දුෂ්කරතාව පිළිවෙළින් 88% හා 80% වශයෙන් ඉහළ මට්ටමක පැවතීමෙන් පෙනී යන්නේ ඉහත ඉගෙනුම් ඵලය පිළිබඳ සිසුන් තුළ මනා දැනුමක් නොමැති බවයි. එබැවින් දෙන ලද සාධක වෙනස්වන විට නම්‍ය විනිමය අනුපාතිකය වෙනස් වන්නේ කෙසේ දැයි විග්‍රහ කිරීමේ කුසලතාව සිසුන් තුළ වර්ධනය කළ යුතුය.

## 09 ප්‍රශ්නය

**9.** (i) සංවර්ධනය පිළිබඳ මිනුමක් වශයෙන් ප්‍රතිශීර්ෂ ආදායම කෙබඳු වැදගත්කමක් උසුලන්නේ ද? (ලකුණු 04 යි)

(ii) ලෝක බැංකුව, ඒ ඒ රටවල ප්‍රතිශීර්ෂ ආදායම් මට්ටම් පදනම් කර ගනිමින් රටවල් වර්ගීකරණය කරනුයේ කෙසේ ද? (ලකුණු 04 යි)

(iii) ආර්ථික වෘද්ධිය සහ තිරසාර සංවර්ධනය එකිනෙකට නොගැළපෙන්නේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ අතුරෙන් ශ්‍රී ලංකාව සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇත්තේ කවර ක්ෂේත්‍රයන් පිළිබඳව ද? (ලකුණු 04 යි)

(v) මෑත වර්ෂවල දී ශ්‍රී ලංකාවේ විරැකියා අනුපාතිකය පහළ වැටීමට දායක වී ඇති ප්‍රධාන කරුණු කවරේ ද? (ලකුණු 04 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(09) (i) සංවර්ධනය පිළිබඳ මිනුමක් වශයෙන් ප්‍රතිශීර්ෂ ආදායමේ වැදගත්කම:

- ප්‍රතිශීර්ෂ ආදායම රටක භෞතික භාණ්ඩ හා සේවා ප්‍රමාණය කැටි කොට දක්වන මිනුමක් වන අතර, සංවර්ධනයට අදාළ ගුණාත්මක වෙනස්කම් පෙන්නුම් නො කරයි.

- ප්‍රතිශීර්ෂ ආදායම රටක ආදායම් ව්‍යාප්තියේ ස්වභාවය නිවැරදිව පෙන්නුම් නො කරයි. ප්‍රතිශීර්ෂ ආදායම් මට්ටම එක හා සමාන රටවල් දෙකක, ආදායම් ව්‍යාප්තිය එකිනෙකට හාත්පසින් ම වෙනස්ව තිබිය හැකි ය.

- ප්‍රතිශීර්ෂ ආදායම, සංවර්ධනයට අදාළ තිරසාර සංවර්ධනය පිළිබඳ පැතිකඩ මුළුමනින්ම නො සලකා හරියි. පරිසර දූෂණය, ස්වභාවික ප්‍රාග්ධනය ක්ෂය වීම පිළිබඳ තොරතුරු ප්‍රතිශීර්ෂ ආදායම් දත්ත මඟින් ලබාගත නො හැකිය.

- සන්තෘෂ්ටිය, නිදහස, සෞඛ්‍ය, මානව අයිතිවාසිකම් වැනි ආදායම් නො වන සංවර්ධනයේ අවශේෂ පැතිකඩවල් පිළිබඳව ප්‍රති ශීර්ෂ ආදායම අවධානය යොමු නො කරයි.

- නොවිධිමත් අංශයේ නිෂ්පාදනයේ වටිනාකම් නිවැරදිව පිළිබිඹු නො වන බැවින් රටේ නිෂ්පාදන මට්ටම වුව ද, ඌණ තක්සේරු කොට දැක්වේ.

- අන්තර්ජාතික සන්සන්දනයන් සඳහා ප්‍රතිශීර්ෂ ආදායම් මට්ටම යොදා ගැනීමේ දී ඇමරිකානු ඩොලර්වලින් ප්‍රකාශ කෙරෙන අතර, ඒ සඳහා යොදා ගැනෙන නාමික විනිමය අනුපාතිකය රටවල මිල මට්ටම් අතර වෙනස්කම් නිවැරදිව නිරූපණය නො කෙරෙන බැවින් ජීවන තත්වයේ වෙනස්කම් හඳුනාගත හැකි නො වේ.

- දරිද්‍රතාව, විරැකියාව වැනි සංවර්ධනයට අදාළ සමාජ ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම ද, ප්‍රතිශීර්ෂ ආදායම් දත්ත තුළින් හෙළි නො වේ.

- ප්‍රතිශීර්ෂ ආදායම සම්බන්ධ විවිධ විවේචන හා අඩුපාඩුකම් දක්නට ලැබුණත් රටවල ආර්ථික සංවර්ධනය මැනීම සඳහා තවමත් බහුල වශයෙන් එම මිනුම යොදා ගනී. දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය හෙවත් ආර්ථික වෘද්ධි අනුපාතිකය රටක සංවර්ධනයට බලපාන ප්‍රබල විචල්‍යයක් වේ. සංවර්ධනයට අදාළ සාක්ෂරතාව, සෞඛ්‍ය පහසුකම්, අධ්‍යාපනය වැනි වැදගත් විචල්‍යයන් රැසක් ප්‍රතිශීර්ෂ ආදායම් මට්ටම සමඟ සම්බන්ධතාවක් පෙන්නුම් කරයි.

**(ඕනෑම කරුණු හතරකට ලකුණු 04යි)**

(ii)
- පහළ ආදායම් රටවල්
- පහළ මැදි ආදායම් රටවල්
- ඉහළ මැදි ආදායම් රටවල්
- ඉහළ ආදායම් රටවල්

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04යි)**

(iii)- ආර්ථික වෘද්ධිය නිසා ආදායම් මට්ටම් ඉහළ යන බැවිනුත්, භෞතික ජීවන තත්වය ඉහළ නංවා ගැනීම සඳහා ඉහළ ආදායම් මට්ටමක් අවශ්‍ය වන බැවිනුත්, ආර්ථික වෘද්ධිය තිරසාර සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් ලෙස පොදුවේ පිළිගැනේ.

- එසේ වුව ද ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය හේතු කොට ආර්ථිකයේ හිඟ සම්පත් උපයෝජනය ඉතා වේගවත් වීමත්, ස්වභාවික ප්‍රාග්ධනය හායනයකට පාත්‍ර වීමත්, සමාජයීය විෂමතා පැන නැගීමටත් පිළිවන. වර්තමානයේ ආදායම් මට්ටම් වේගයෙන් ඉහළ යාම, අනාගත ආදායම් විභවතාව පහළ හෙළීමට ද, හේතු විය හැකිය.

- ආර්ථික වෘද්ධිය සහ තිරසාර සංවර්ධනය අතර ගැටුම හැම විට ම දක්නට ලැබෙන්නක් ද නො වේ. ආර්ථික වෘද්ධිය හැම විට ම පාරිසරික හායනයට තුඩු දෙන්නේ නැත. ආර්ථික වෘද්ධි ක්‍රියාවලියෙහි ආරම්භක අදියරයන්හි දී පසුබෑමක් ඇති විය හැකිය. එහෙත් ප්‍රති ශීර්ෂ ආදායම් වේගයෙන් වර්ධනය වන විට එම තත්ත්වය දක්නට නො ලැබෙන අතර පරිසරයේ ගුණාත්මක තත්ත්වය ඉහළ යනු ඇත.

- පාරිසරික දූෂණය බොහෝ විට ජනගහනය සමග සෘජු සම්බන්ධයක් පෙන්නුම් කරයි. එහෙත් ජනගහනය ආර්ථික වෘද්ධිය සමග ප්‍රතිලෝම සම්බන්ධතාවක් දක්වයි. මේ අනුව ඉහළ ආර්ථික වෘද්ධි මට්ටමක් පරිසරයට හිතකර ලෙස බලපායි.

- තව ද, ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය නිසා සමාජයේ ආදායම් මට්ටම් ඉහළ යාමත්, පුද්ගලයන්ගේ මූලික අවශ්‍යතා තෘප්තිමත් වීමත් නිසා, සමාජ සාරධර්ම හා ප්‍රතිමානයන් වෙනස් විය හැකිය. සමාජ විෂමතා හා පාරිසරික ගැටලු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ඇත. පරිසර හිතකාමී භාණ්ඩ පරිභරණයට පුද්ගලයන් වඩ වඩාත් යොමු වනු ඇත. වඩා කාර්යක්ෂම පරිසර මිත්‍රශීලී නිෂ්පාදන ශිල්ප ක්‍රම භාවිතයට ගනු ඇත.

- ආර්ථික වෘද්ධියත් සමග ආදායම් ඉහළ යන විට, තාක්ෂණ, පර්යේෂණ හා සංවර්ධන යන ක්ෂේත්‍රයන්හි වැඩි වැඩියෙන් ආයෝජනය කිරීමට අවස්ථාව සැලසේ. තාක්ෂණය ඉහළ යාම නිසා ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත් උපයෝජනය සීමා කරමින් පරිසරය කෙරෙහි ඇති කරන අයහපත් ප්‍රතිවිපාක අවම කර ගැනීමට ද පිළිවන.

**(ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)**

(iv)- ආදායම් දරිද්‍රතාව අඩු කිරීම :
- දිළිඳු ජනගහන ප්‍රතිශතය අඩකින් අඩු කිරීම
- දරිද්‍රතා අන්තර් අනුපාතය අඩකින් අඩු කිරීම

- ප්‍රාථමික අධ්‍යාපනයට ඇතුළු වීමේ අනුපාතිකය 100% දක්වා වැඩි කිරීම.

- පළමුවන ශ්‍රේණියට ඇතුළු කරන සිසුන්ගෙන් පස්වන ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ප්‍රතිශතය 100% දක්වා ඉහළ නැංවීම.

- අවුරුදු 15 - 24 වයස් කාණ්ඩයේ ස්ත්‍රී/ පුරුෂ දෙපාර්ශ්වයේ ම සාක්ෂරතාව 100% දක්වා ඉහළ නැංවීම.

- ප්‍රාථමික, ද්විතීයික හා තෘතියික අධ්‍යාපනයෙහි පිරිමි ළමුන්ට ගැහැණු ළමුන්ගේ අනුපාතය 100% දක්වා වැඩි කිරීම.

- ළමා මරණ සංඛ්‍යාව පහළ හෙළීම:
  - වයස අවුරුදු 5ට අඩු ළමයින්ගේ මර්ත්‍යතා අනුපාතිකය අඩු කිරීම.
  - ළදරු මර්ත්‍යතා අනුපාතිකය අඩු කිරීම
  - සරම්ප රෝගයට එරෙහිව එන්නත් ලබා ගත් වයස අවුරුදු 1ක්වන ළමුන්ගේ අනුපාතිකය ඉහළ නැංවීම.

- මාතෘ සෞඛ්‍ය ඉහළ නැංවීම:
  - මාතෘ මර්ත්‍යතා අනුපාතිකය අඩු කිරීම.
  - සෞඛ්‍ය සේවක සහාය ලද දරු ප්‍රසූතිවල ප්‍රතිශතය 100% දක්වා ඉහළ නැංවීම.


- මැලේරියා රෝගී මරණ අනුපාතිකය ශුන්‍ය කිරීම; ක්ෂය රෝගී මරණ අඩු කිරීම.

**(ඕනෑම කරුණු 04කට ලකුණු 04යි)**

(v) - සාපේක්ෂ වශයෙන් ඉහළ ආර්ථික වෘද්ධි අනුපාතිකයක් පවත්වාගෙන යාම.
- සේවා අංශයේ හටගත් වේගවත් ප්‍රසාරණය.
- ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ සීඝ්‍ර වර්ධනය.
- හමුදා සේවයට සහ රාජ්‍ය සේවයට කරන ලද බඳවා ගැනීම් ඉහළ යාම.
- විදේශ රැකියා සඳහා ශ්‍රම සංක්‍රමනය වීම් ඉහළ යාම.
- ස්වයං රැකියා ප්‍රවර්ධනය සඳහා විවිධ ණය ක්‍රම හඳුන්වා දීම.


**(ඕනෑම කරුණු හතරකට ලකුණු 04යි)**

**09 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




09 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 21%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 24%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 30%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 31%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 15%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 5 ක් ඇති අතර ii හා iv කොටස් සාපේක්ෂව පහසු ප්‍රශ්න වී ඇත. එහෙත් ඒවායේ පහසුතාව ද 41%කි. පහසුතාව අඩු ම කොටස i කොටස වී ඇති අතර, එහි පහසුතාව 15%ක් පමණි. සමස්තයක් ලෙස ගත් විට මෙම ප්‍රශ්නය අයදුම්කරුවන් අඩු සාධන මට්ටමක් පෙන් වූ ප්‍රශ්නයකි.

iii හා v කොටස්ද සාපේක්ෂව අඩු පහසුතාව සහිත කොටස් වේ.

- i කොටසෙහි පහසුතාව 15% ක් වූ පහළ ම මට්ටමේ පවතී. මෙම ගැටලුව තෝරාගත් අපේක්ෂකයින් අතර ඉහළ දුෂ්කරතාවට හේතු වූයේ ඒක පුද්ගල ආදායම සංවර්ධනය මිනුම් කිරීමේ නිර්ණායකයක් ලෙස අගය කිරීමේ නො හැකියාවයි. ඒ පිළිබඳ දැනුම සිසුන් තුල වර්ධනය කළ යුතුය.

- ii කොටසෙහි පහසුතාව 41% කි. ලෝක බැංකුව ඒ ඒ රටවල ප්‍රතිශීර්ෂ ආදායම පදනම් කර ගනිමින් රටවල් වර්ගීකරණය පිළිබඳව විමසා ඇති ගැටලුව සිසුන්ට දුෂ්කරතා ඇති කිරීමට හේතු වී ඇත්තේ විවිධ නිර්ණායක ඔස්සේ රටවල් වර්ග කිරීමේ දැනුම යාවත්කාලීන නොවී ඇති බැවිනි.

- iii කොටස පදනම් වී ඇත්තේ ආර්ථික වෘද්ධිය හා තිරසාර සංවර්ධනය යන සංකල්ප විග්‍රහ කරමින් ඒවා අතර සහ සම්බන්ධතාව ඉදිරිපත් කිරීම පිළිබඳවයි. මෙම කොටසෙහි පහසුතාව 27% ක් වීම මගින් නිරූපණය වන්නේ අපේක්ෂකයින් වැඩි දෙනෙකුට එකී දැනුම හා විශ්ලේෂණ හැකියාව ප්‍රමාණවත් නො වන බවයි.

- iv කොටසෙහි පහසුතාව 41% කි. මෙම කොටස මගින් අපේක්ෂා කරන්නේ සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ සඳහන් කරමින් ඒවා අතුරෙන් ශ්‍රී ලංකාව ප්‍රගතියක් අත් කරගත් අභිමතාර්ථ කවරේදැයි දැක්වීමයි. අපේක්ෂකයින් වැඩි ප්‍රතිශතයක් උක්ත ඉගෙනුම් ඵලය ප්‍රමාණවත් පරිදි සපුරාගෙන නැත. එබැවින් සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ නම් කිරීමටත්, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් එහි ප්‍රගතිය විග්‍රහ කිරීමටත් දැනුම ලබා දිය යුතුය.

- v කොටස ශ්‍රී ලංකාවේ විරැකියා අනුපාතය පහළ වැටීමට හේතු වූ කරුණු විමසයි. ගැටලුවේ දුෂ්කරතාව 67% ක් වීම මගින් පෙන්නුම් කරන්නේ උක්ත මාතෘකාව සම්බන්ධයෙන් සිසුන්ගේ දැනුම යාවත්කාලීන විය යුතු බවයි.

## 10 ප්‍රශ්නය

**10.** (i) "ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධියේ මූලාශ්‍ර වශයෙන්, මෑත වර්ෂවල දී වඩාත් ප්‍රබල ස්ථාන හිමි කරගෙන ඇත්තේ වෙළෙඳ නොවන දේශීය ආර්ථික ක්‍රියාකාරකම් (domestic non-tradable economic activities) වේ." මෙම ක්‍රියාකාරකම් කවරේ දැයි හඳුන්වා දෙන්න. (ලකුණු 05 යි)

(ii) "මෑත දශකවල ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතිකය සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමක නොවෙනස්ව පවතී." ශ්‍රම හමුදාව තුළ ස්ත්‍රීන්ගේ සහභාගිත්ව අනුපාතිකය පහළ මට්ටමක පැවතීමට හේතු කවරේ ද? (ලකුණු 05 යි)

(iii) මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ බදු අයභාරය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් පහළ වැටෙමින් පැවතීමට හේතු කවරේ ද? (ලකුණු 05 යි)

(iv) මැදි කාලීනව සහ දිගු කාලීනව ඉහළ වෘද්ධි අනුපාතිකයක් අත්කර ගැනීමට බාධක ලෙස ශ්‍රී ලංකා ආර්ථිකයේ දක්නට ලැබෙන මූලික දුර්වලතා කවරේ දැයි හඳුන්වා දෙන්න. (ලකුණු 05 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(10) (i) වෙළෙඳ නොවන දේශීය ආර්ථික ක්‍රියාකාරකම්
- ඉදිකිරීම් (යටිතල පහසුකම් සංවර්ධනය)
- ප්‍රවාහනය සහ සන්නිවේදනය
- අභ්‍යන්තර වෙළෙඳාම (සිල්ලර හා තොග වෙළෙඳාම)
- හෝටල් සහ ආපන ශාලා
- රාජ්‍ය පරිපාලනය

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 05යි)

(ii) - ගෘහස්ත වගකීම් දැරීම වෙනුවෙන් කාන්තාවන් ශ්‍රම බලකායෙන් ඉවත් වීම. (දරුවන් හා වැඩිහිටියන් රැක බලා ගැනීම)

- ආරක්ෂාකාරී නේවාසික පහසුකම් නොතිබීම.
- රාජකාරී ස්ථානයට යැමට ඒමට ප්‍රවාහන පහසුකම් නො තිබීම.
- රාජකාරී කාල සීමාවකට අනුගත වීම අපහසු වීම
- තාවකාලිකව සේවයෙන් ඉවත් වූ පසු නැවත රැකියාවක් සොයා ගත නො හැකි වීම.
- කාන්තාවන් සඳහා රැකියා අවස්ථා සීමා සහිත ක්ෂේත්‍රයන් කීපයකට පමණක් සීමා වීම. විශේෂයෙන් පෞද්ගලික අංශයෙහි ස්ත්‍රී, පුරුෂ සමාජ භාවය මත වැටුප් විෂමතා දක්නට ලැබීම.

**(ඕනෑම කරුණු පහකට ලකුණු 05යි)**

(iii)- විදේශ වෙළෙඳාම මත පනවන ලද බදු, ආර්ථික නිර්බාධකරණයත් සමඟ ඉවත් වී යාම.

- ලෝක වෙළෙඳ සංවිධානයේ සාමාජිකයෙක් ලෙස තීරු බදු සම්බන්ධව පැවති බාධක ගණනාවක් ලිහිල් කිරීම.
- ඍජු විදේශ ආයෝජන වඩාත් ආකර්ෂණය කර ගැනීම සඳහා බදු නිදහස් කිරීමේ හා බදු සහන ප්‍රදානය කිරීම.
- බදු පදනම පුළුල් කිරීමකින් තොරව අඩු බදු අනුපාත හඳුන්වා දීම.
- රජයේ කෙටි කාලීන අරමුදල් අවශ්‍යතා සඳහා බදු පද්ධතියට නිතර නිතර සිදු කරන වෙනස්කම් නිසා බදු පද්ධතියේ අවිනිශ්චිත බවත් හා සංකීර්ණත්වයක් ඇති කොට තිබීම.
- විශාල අවිධිමත් අංශයක් පැවතීම නිසා බදු පැහැර හැරීමට හා බදු මඟ හැරීමට ඇති හැකියාව විශාල වීම.
- බදු පරිපාලනයේ අකාර්යක්ෂමතාවය.
- බදු ගෙවීමට පටහැනි ස්වරූපයේ ආකල්ප මහජනතාව සහ සමාගමික අංශයන් තුළ දක්නට ලැබීම.
- අන්තර්ජාලය ඔස්සේ භාණ්ඩ මිල දී ගැනීම් ඉහළ යාම.


**(ඕනෑම කරුණු පහකට ලකුණු 05යි)**

(iv)- රාජ්‍ය ණය බර ඉහළ මට්ටමක පැවතීම

- අය වැය හිඟය ඉහළ මට්ටමක පැවතීම.
- වෙළෙඳ ශේෂයේ හිඟය ප්‍රසාරණය වීම.
- රාජ්‍ය අයභාරයේ මන්දගාමී වර්ධනය
- දේශීය ඉතුරුම් පහළ මට්ටමක පැවතීම.
- ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ අවිනිශ්චිතතාව.
- මානව සම්පත් සංවර්ධනයට හිතකර වූ අධ්‍යාපන ප්‍රතිපත්තියක් දක්නට නොලැබීම.
- රාජ්‍ය පරිපාලන ව්‍යුහය අකාර්යක්ෂම වීම.
- යහපාලනය තහවුරු වී නොතිබීම.


**(ඕනෑම කරුණු පහකට ලකුණු 05යි)**

10 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ඃ




අයදුම්කරුවන්ගෙන් 18%ක් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වෙයි.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 69%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 26%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 4%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 1%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 4ක් ඇති අතර i කොටස වඩාත් ම අපහසු වී ඇත. එහි පහසුතාව 8%කි. පහසුතාව වැඩි ම කොටස ii වේ. එහි පහසුතාව 32%කි. iii වන සහ iv වන කොටස් ද අඩු පහසුතාවක් ගෙන ඇති අතර ඒවායේ පහසුතා 26% හා 24% බැගිනි. සමස්තයක් ලෙස ගත්විට අඩු ම පහසුතාව සහිත ප්‍රශ්නයයි.

- ⋆ i කොටස මෙම ප්‍රශ්නයේ දුෂ්කරතාව ඉහළ ම කොටසයි. එය 92% ක් තරම් ඉහළ අගයකි. ගැටලුවෙන් විමසා ඇති ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධියෙහි මූලාශ්‍ර හා මෑත වර්ෂවලදී වෘද්ධියට ප්‍රබල ලෙස දායක වූ අංශය ලෙස වෙළෙඳ නො වන දේශීය ආර්ථික ක්‍රියාකාරකම් සහ ආර්ථික වෘද්ධිය කෙරෙහි එහි දායකත්වය පිළිබඳව දැනුම ප්‍රවර්ධනය කළ යුතුය.

- ⋆ ii කොටසෙහි පහසුතාව 32% කි. අදාළ ගැටලුවෙන් විමසන්නේ ශ්‍රී ලංකාවේ ශ්‍රම හමුදාව තුළ ස්ත්‍රී සහභාගිත්වය පහළ මට්ටමක පැවතීමට හේතු පිළිබඳවයි. එම හේතු, සිසුන් වැඩි පිරිසක් දැනුවත්ව නො සිටීම නිසා ගැටලුවේ දුෂ්කරතාව ඉහළ අගයක් ගනී.


- ⋆ මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ බදු අයභාරය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පහළ මට්ටමක පැවතීමට හේතු iii වන කොටසින් විමසයි. මෙම කොටසෙහි දුෂ්කරතාව 74% ක් වැනි ඉහළ මට්ටමක පැවතීමට හේතු වූයේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායමේ ව්‍යුහය හා එහි කාලීන වෙනස්වීම් සහ ඊට හේතු පිළිබඳ දැනුම ප්‍රමාණවත් නො වීමයි.

- ⋆ iv වන කොටසෙහි පහසුතාව 24% කි. එම කොටසෙන් විමසන්නේ මැදි හා දිගු කාලීනව ඉහළ ආර්ථික වෘද්ධියක් අත් කර ගැනීමට බාධක ලෙස ශ්‍රී ලංකා ආර්ථිකයේ දක්නට ලැබෙන මූලික දුර්වලතා කවරේ ද යන්නයි. අපේක්ෂකයින් වැඩි දෙනෙකු නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් වූ හෙයින් ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධි අනුපාතිකය ඉහළ නැංවීමට පවතින බාධක පිළිබඳ දැනුම සිසුන් තුළ වර්ධනය කළ යුතුය.

මෙම ප්‍රශ්නයට දී ඇති පිළිතුරු විමර්ශණය කිරීමේ දී පැහැදිළි වන්නේ සිසුන්ගේ අමතර කියවීම් ඉතා අඩු මට්ටමක පවතින බවයි. සාමාන්‍ය තොරතුරු අනුව මෙම මාතෘකා ඉගෙනීමට සිසුන් පාසල් නො යාම ද, හේතුවකි. එසේම සිසුන් මහ බැංකු වාර්තාව පරිශීලනය ඉතා පහළ මට්ටමක තිබීම ද, තවත් හේතුවකි. ශ්‍රී ලංකා ආර්ථිකය සම්බන්ධ වර්තමාන තොරතුරු සෙවීමට සිසුන් මීට වඩා මහන්සි ගත යුතුය.

### 2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

මෙම ඇගයීම් වාර්තාව සැකසීමේදී භාවිත කරන ලද තොරතුරු සංවිධානය කිරීමෙන්, II පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි තෝරාගැනීමේ ප්‍රතිශතය හා පහසුතාව දැක්වෙන පහත සඳහන් ප්‍රස්තාරය සහ වගුව ගොඩනැගිය හැකිය.




| ප්‍රශ්න අංකය | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| තෝරා ගැනීමේ ප්‍රතිශතය | 97 | 93 | 64 | 22 | 29 | 83 | 69 | 31 | 21 | 18 |
| පහසුතාව % | 51 | 52 | 60 | 40 | 49 | 37 | 45 | 36 | 32 | 23 |

මෙම II පත්‍රය "අ" සහ "ආ" වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ. අංක 1 සිට 5 තෙක් ප්‍රශ්න "අ" කොටසට ද අංක 6 සිට 10 තෙක් ප්‍රශ්න "ආ" කොටසට ද අයත් ය. අපේක්ෂකයන් විසින් "අ" කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද "ආ" කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද වන සේ ප්‍රශ්න තෝරා ගනිමින් ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු විය.

"අ" කොටසේ ප්‍රශ්න පහ අතුරෙන් වැඩියෙන් ම තෝරාගැනීමට ලක්ව ඇත්තේ අංක 1 සහ 2 ප්‍රශ්න වන අතර "ආ" කොටසේ ප්‍රශ්න පහ අතුරෙන් වැඩියෙන් ම තෝරා ගැනීමට ලක්ව ඇත්තේ අංක 6 සහ 7 ප්‍රශ්න වේ. ඒවා තෝරාගනු ලැබීමේ ප්‍රතිශත පිළිවෙළින් 97%, 93%, 83% සහ 69% වේ. ඊළඟට වැඩි ම තෝරාගනු ලැබීමට පත්ව ඇත්තේ 3 වන ප්‍රශ්නයයි. විකල්ප ප්‍රශ්න හයක් අතුරෙන් වැඩි ම තෝරාගනු ලැබීමට ලක්ව ඇති එම ප්‍රශ්නයට අපේක්ෂකයින්ගෙන් අඩකට වැඩි (64%) සංඛ්‍යාවක් පිළිතුරු සපයා ඇත. විෂය නිර්දේශයෙහි මෙම ප්‍රශ්නවලට පාදක වූ තේමා සහ විෂය කරුණු, ඉගැන්වීම් ඉගෙනුම් ක්‍රියාවලිය තුළ වැඩි අවධානයට ලක් වූ හා සිසුන් අතර වඩාත් ජනප්‍රිය වූ ඒවා ය. එබැවින් එම ප්‍රශ්නවල පහසුතා සාපේක්ෂ වශයෙන් ඉහළ අගය ගත යුතුය. ප්‍රශ්න තෝරා ගනු ලැබීමේ ප්‍රතිශතවල අවරෝහණ පටිපාටියෙහි මුලින් ම පිහිටන ප්‍රශ්න අනුපිළිවෙළින් අංක 1, 2, 6, 7 සහ 3 වේ. එහෙත් පහසුතාවල එම පටිපාටියෙහි මුලින් ම පිහිටන ප්‍රශ්න අනුපිළිවෙළින් 3, 2, 1, 7 සහ 6 වේ. අංක 1, 2 සහ 6 ප්‍රශ්න වැඩියෙන් තෝරා ගනු ලැබ ඇති නමුදු, ඒවාට සපයන ලද පිළිතුරු එතරම් සතුටුදායක නො වන බවත් වැඩියෙන් ලකුණු උපයා ගැනීමට සමත් වී නොමැති බවත් මෙම තොරතුරුවලින් ගම්‍ය වේ. එබැවින් සිසුන්ගේ වැඩි අවධානයට ලක්වන මෙවැනි ප්‍රශ්නවලින් ඉහළ ලකුණු ලබාගැනීම සඳහා ඉගැන්වීම් - ඉගෙනුම් ක්‍රියාවලියේදී සිසුනට මඟ පෙන්වීම වඩාත් සාර්ථක ප්‍රතිඵල ලැබීමට මහෝපකාරී වේ.

වැඩි ම තෝරාගැනීම ඇති අංක 1 ප්‍රශ්නයෙහි වුව ද පහසුතාව 51%කට සීමා වී තිබීම ද ආර්ථික විද්‍යාව විෂයයෙහි ප්‍රගතිය අපේක්ෂා කරන්නන්ගේ අවධානයට ලක්විය යුතු කරුණකි. ස්ව අභිප්‍රේරණයෙන් යුතුව ප්‍රශ්නයකට පිළිතුරු සපයන්නකුට, සාමාන්‍ය වශයෙන් ප්‍රශ්නයට හිමි මුළු ලකුණුවලින් වැඩි ප්‍රතිශතයක් උපයා ගැනීමට හැකිවන ආකාරයට තම පිළිතුර නිවැරදි විෂය කරුණු ඇසුරෙන් සංවිධානය කර ඉදිරිපත් කිරීමට ද මඟ පෙන්වනු ලැබිය යුතුය.

අඩුවෙන් ම තෝරා ගනු ලැබ ඇත්තේ අංක 10 ප්‍රශ්නය වන අතර එහි පහසුතාව ද 23%ක අවම අගයකට සීමා වී ඇත. ඊට පාදක වී ඇති විෂය කරුණු කෙරෙහි පන්ති කාමර ඉගැන්වීම්-ඉගෙනුම් ක්‍රියාවලිය තුළ ප්‍රමාණවත් අවධානයක් යොමු වී නැති බව පෙනේ.

II පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සැලකූ විට පහසුතම ප්‍රශ්නයේ පහසුතාව වුවද 60%කට සීමාවීමත් අංක 1, 2 හා 3 හැර අනෙක් ප්‍රශ්න හතෙහි ම පහසුතාව 50%ට වඩා අඩුවීමත් මෙම විෂයය හා සම්බන්ධ සියලු ම පාර්ශ්වකරුවන්ගේ අවධානයට ලක් විය යුතු කරුණකි. එමෙන් ම II ප්‍රශ්න පත්‍රයෙහි සමස්ත පහසුතාව ද 42.5%කට සීමා වී ඇත. මෙම තොරතුරු ඇසුරෙන් අවධාරණය කෙරෙන්නේ ඉගැන්වීම්-ඉගෙනුම් ක්‍රියාවලිය අනාවරණ පරීක්ෂණ කෙරෙහි යොමුවීමේත් ඉලක්ක ගත ප්‍රතිකාර්ය වැඩ සටහන් නොපමාව ක්‍රියාත්මක කරනු ලැබීමේත් වැදගත් අවශ්‍යතාවයි.

## III කොටස

### 3.0 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

### 3.1. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

**පොදු උපදෙස්**

- ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්යය ද, කොපමණ කාලයක් ලැබේ ද යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කරගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය. එකම ප්‍රශ්නය කොටස් දෙකක් ලෙස එකට ලියැවී ඇති විට, කොටස් දෙකට ම පිළිතුරු සැපයීම කෙරේ අවධානය යොමු විය යුතුය.

- I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී වඩාත් නිවැරදි එක් පිළිතුරක් තෝරා ගත යුතුය. තව ද පැහැදිලිව එක් කතිර ලකුණක් පමණක් උත්තර පත්‍රයේ යෙදිය යුතුය.

- II පත්‍රයේ (අ) හා (ආ) කොටස්වල ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.

- නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.

- අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවක ම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.

- ප්‍රශ්න අංක හා කොටස් අංක නිවැරදිව ලිවිය යුතුය.

- නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවලදී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවලදී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතුය.

- ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුය.

- පිළිතුරු ලිවීමේදී රතු සහ කොළ පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතුය.

- ප්‍රශ්නයට අදාළ ලකුණු ප්‍රමාණය හා කාලය අතර පවතින සම්බන්ධය අනුව කාලය කළමනාකරණය කරගත යුතුය.

**විශේෂ උපදෙස් :**

* ආර්ථික විද්‍යා විෂයයේ භාවිත වන පාරිභාෂික යෙදුම් භාවිත කළ යුතුය. උදා : පරිභෝජනය

* අවශ්‍ය තැන්හිදී සංඛ්‍යාත්මක වගු, ප්‍රස්තාර, සූත්‍ර හා සමීකරණ මගින් පිළිතුරු පැහැදිලි කළ යුතුය. ප්‍රස්තාර සටහන් ඇඳීමේදී නිවැරදි පරිමාණයකට ඇඳීමටත්, අක්ෂ නිවැරදිව නම් කිරීමටත් සැලකිලිමත් විය යුතුය.

* ගණනය කිරීම්වලදී එක් එක් පියවර පැහැදිලිව සඳහන් කළ යුතුය. අදාළ අවස්ථාවලදී නිවැරදි ව ඒකක සඳහන් කළ යුතුය.

* අවශ්‍ය තැන්හිදී නිවැරදි සංකේත භාවිත කළ යුතුය.


* අදාළ රූප සටහන් අඳින විට රේඛා නිවැරදිව නම් කිරීම හා ප්‍රවාහවල දිශාව නිවැරදිව දැක්වීම කළ යුතුය.

**ප්‍රස්තාර සඳහා පොදු උපදෙස් :**


* දත්තවලට අනුව ප්‍රස්තාර ඇඳීමේදී ප්‍රස්තාර කඩදාසි යොදා ගැනීම ඉතා වැදගත් වේ. ප්‍රස්තාර කොල භාවිත නො කිරීම නිසා නිවැරදි ව ගණනය කිරීම් කළ නො හැකි වීමෙන් අයදුම්කරුවන්ට ලකුණු අහිමි වන බව උත්තර පත්‍ර පරීක්ෂා කිරීමේ දී පෙනී යයි.

* අක්ෂර නිවැරදිව නම් නොකිරීම හා ප්‍රස්තාර නම් නොකිරීම ලකුණු අඩු වීමට හේතුවකි.
උදා-: නි. හැ. මායිම් වක්‍රයේ අක්ෂ නම් කරන විට X හා Y ලෙස පමණක් නම් කර ඇත්නම් ලකුණු දිය නො හැක. එය X භාණ්ඩය හා Y භාණ්ඩය ලෙස සටහන් කළ යුතුය.


* ප්‍රස්තාර ඇඳීමේ දී අන්තඃඛණ්ඩ නිවැරදිව නම් නො කිරීම ලකුණු අඩු වීමට හේතුවකි.
උදා-: සැපයුම් වක්‍ර ඇඳීමේ දී එය සෘණ අන්තඃඛණ්ඩයකින් ආරම්භ වේ නම්, එය ඒ පරිදි ප්‍රස්තාරයේ දැක්විය යුතුය.
උදා-:





සමාහාර වියදම් රේඛාවේ ද, ස්වාධීන වියදම් ප්‍රමාණය ප්‍රස්තාර සටහනේ නිවැරදිව දැක්විය යුතුය.
උදා-:




* අක්ෂවල සංඛ්‍යා දත්ත සටහන් කිරීමේ දී පරිමාණය අනුව ලකුණු කිරීම ඉතා වැදගත්ය. දුර කෙටි කර නම් කිරීම ආර්ථික විද්‍යා ප්‍රස්තාරවල නිවැරදි නො වේ.
උදා-:





* සාර්ව ආර්ථික සමතුලිතය පෙන්වීමේ දී ආදායම් හා සමාහාර වියදම් ලකුණු කරන විට අක්ෂ දෙකෙහිදීම දත්ත (ඉලක්කම්) සමාන වන පරිදි ලකුණු කර, සම ආදායම් වියදම් රේඛාව ඇඳිය යුතුය. එසේම ස්වායත්ත විචල්‍යය වන ආදායම අනිවාර්යයෙන් ම තිරස් අක්ෂයේ සටහන් කළ යුතුය.
උදා-:



* සාර්ව ආර්ථික සමතුලිතය පෙන්වීමේ දී ගිලිහීම් දැක්වෙන වක්‍රය සෘණ අන්තඃඛණ්ඩයකින් ආරම්භ වේ නම්, එය නිවැරදිව දැක්විය යුතුය.

උදා-:




* නි.හැ. මායිම් වක්‍ර අඳිනු ලබන විට අක්ෂ දෙක ස්පර්ශ වන පරිදි ඇඳීම ඉතාමත් ම වැදගත් වේ එසේ නොමැති විට එය නිෂ්පාදන හැකියා මායිමක් නො වේ.

## 3.2. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

* සංකල්ප පිළිබඳ ව නිවැරදි හා නිශ්චිත දැනුම තිබිය යුතු අතර, සංකල්ප පිළිබඳ ප්‍රායෝගික භාවිත ප්‍රගුණ කළ යුතුය.

* ආර්ථික හා සමාජයීය කරුණුවල කාලීනව හටගන්නා වෙනස්වීම් හා ප්‍රවණතා පිළිබඳ ව සතුටුදායක අවබෝධයක් ලබා ගත යුතුය.

* මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය වැනි ආයතනවලින් නිකුත් කෙරෙන වාර්තා හා ප්‍රකාශන පරිශීලනය කිරීමට හුරුවිය යුතුය. එමඟින් තම දැනුම යාවත්කාලීන කර ගත යුතුය.